# අවශ්‍ය මෙතෙක් ප්‍රමාණවත් නොවන

## ශ්‍රී ලංකාවේ වඩා පුළුල් දේශපාලන නියෝජනයක් සඳහා කාන්තා කෝටාව

ප්‍රදීප් පීරිස් සහ හසිනි ලේකම්වසම්

WMC කාන්තා හා මාධ්‍ය සාමූහිකය

Norwegian Embassy
Colombo

# අවශ්‍ය, මෙතෙක් ප්‍රමාණවත් නොවන:

*ශ්‍රී ලංකාවේ වඩා පුළුල් දේශපාලන නියෝජනයක් සඳහා කාන්තා කෝටාව*

පළමු මුද්‍රණය- 2021 ජනවාරි

**කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය**

පර්යේෂකයෝ: **ප්‍රදීප් පීරිස් සහ හසිනි ලේකම්වසම්**
සමාලෝචකවරු: **චූලනී කොඩිකාර සහ කුමුදුනී සැමුවෙල්**
පර්යේෂණ සහාය: **කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය**
**කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය" විලුතුණී**
**ග්‍රාමීය කාන්තා පෙරමුණ සහ කාන්තා සහයෝගිතා පෙරමුණ**
නිර්මාණය සහ සැලසුම: **එම්"එස්"ටී" ගෞරි**
මුද්‍රණය: **Neo Graphics ප්‍රින්ටර්ස්**
සහාය ලබා දුන්නේ: **රාජකීය නෝර්විජියානු තානාපති කාර්යාලය**

Norwegian Embassy
*Colombo*

ප්‍රකාශයට පත්කරනු ලැබූයේ:

WMC

**කාන්තා හා මාධ්‍ය සාමූහිකය**
56/1, සරසවි පටුමග, කාසල් වීදිය,
කොළඹ 08, ශ්‍රී ලංකාව.

විද්‍යුත් තැපෑල: *wmcsrilanka@womenandmedia.org*
වෙබ්: *womenandmedia.org*
ෆෙස්බුක්: *https://www.facebook.com/womenandmediacollective*
ට්විටර්: *https://twitter.com/womenandmedia*

ISBN 978-624-5868-00-1

# පූර්විකාව

ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ඉහළ නැංවීම පිණිස කාන්තාවන් සහ අනෙකුත් කොන්කරනු ලැබූ කණ්ඩායම් සඳහා සාධාරණ නියෝජනයක් අවශ්‍ය බව මේ වන විට පැහැදිළිව අවබෝධ කරගනු ලැබ තිබේ. කෙසේ වෙතත්, එබඳු නියෝජනයක් සඳහා සටන් කිරීමට සියලු ක්ෂෙත්‍රයන්හි කාන්තාවන්ට සිදුව ඇති අතර රැකවල් කරුවන් ලෙස ක්‍රියාකරන දේශපාලන පක්ෂ අනිවාර්යයෙන් හෝ සාර්වත්‍රික ආකාරයෙන් නියෝජිත දේශපාලනය වෙත කාන්තාවන්ගේ පිවිසීම කෙරෙහි මැදිහත් නොවෙයි. ශත වර්ෂයකට පෙර ඡන්ද අයිතිය සඳහා සටන් කළ අයුරින්ම බොහෝ රටවල කාන්තාවන්ට නියෝජනය සඳහා අයිතිය වෙනුවෙන් දික්ගැස්සුණු අරගලයන්හි නිරත වීමට සිදුව තිබේ. ඒ වෙනුවෙන් විධිමත් හෝ අවිධිමත් සහතික ලෙස කරන සොයා යාමටත් මුල් බැස ගත් පුරුෂ මූලික ආකල්ප අනුක්‍රමයෙන් වෙනස් කරලීමටත් සිදු විය. 1995 වසරේ බීජිංහි පැවැති 4වැනි ලෝක කාන්තා සම්මේලනය පැවැති අවස්ථාව වන විට දේශපාලනයේ කාන්තා ඌන නියෝජනය සඳහා පිළියම් යෙදීම පිණිස සහතික ලෙස කරන ක්‍රියාමාර්ග හඳුනාගැනීම කාන්තාවන් සපුරාගෙන තිබුණි ගෝලීයව ව්‍යවස්ථායක සභාවන්හි සාමාජිකයන්ගෙන් කාන්තාවන් සිටින්නේ 10% ක් පමණක්ය යන්න සැලකිල්ලට ගත් ක්‍රියාකාරිත්වය සඳහා බීජිං වේදිකාව (ආර්ට් 182)" "ව්‍යුහාත්මක සහ ආකල්පමය බාධකවලට" (ආර්ට් 186) පිළියම් යෙදීම පිණිස ධනාත්මක ක්‍රියාමාර්ග ඉල්ලා සිටින ලදී. එමගින් විවිධ ස්වරූපයේ තාවකාලික විශේෂ ක්‍රියාමාර්ග ශක්තිමත් වීම සඳහා අවස්ථාව උදා කරමින් කාන්තාවන් දේශපාලනය සඳහා නුසුදුසුය යන මතයේ වෙනසක් ඇති කරන ලදී. (ඩාහ්ලරප්, 2020)[1]

හඳුන්වා දෙනු ලැබූ සහතික ලෙස කරන ක්‍රමවේද විවිධාකාර විය. 1970 ගණන්වලදී අවිධිමත් කෝටා ක්‍රමවේද හඳුන්වාදීමේදී ස්කැන්ඩිනේවියානු රටවල් සාර්ථක වූ අතර බොහෝ දේශපාලන පක්ෂ ක්‍රමයෙන් ස්වේච්ඡා කෝටා ක්‍රමය පිළිගන්නා ලදී. ව්‍යවස්ථාමය හා නෛතික ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයක් ඔස්සෙ දේශපාලන සමතාව පිළිබඳ නීතිය ප්‍රංශය සම්මත කරනු ලැබුයේ 1999/2000 තරම් මෑතකදීය. අන්තර් පාර්ලිමේන්තු සංගමයේ 2019 වාර්තාවට අනුව පාර්ලිමේන්තු කාන්තා නියෝජනය ඉහළ නැංවීම පිණිස රටවල් 130 කට වැඩි ගණනක් යම් ආකාරයක කෝටා ක්‍රමයක් යොදා ගෙන තිබේ. ප්‍රාදේශීය මට්ටමේ කාන්තා නියෝජනය වැඩි කිරීම පිණිස ද ලොව පුරා විවිධ තහවුරු කිරීමේ ක්‍රියාමාර්ග යොදා ගෙන තිබේ.

සහතික ලෙස කරන ක්‍රියාමාර්ග ඒවායේ ස්වරූපයෙන් සහ සඵලතාවයෙන් සැලකිය යුතු ලෙස වෙනස් වන අතර වඩාත්ම හොඳින් සාක්ෂාත් කරගැනීමට හැකි වනුයේ "දේශපාලන අවස්ථානුගත තත්ත්වයන් වාසිදායක වන විටදීය.[2] අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ මූලාරම්භයක් හරහා 2016 අංක 1 දරන පළාත් පාලන මැතිවරණ (සංශෝධන) පනත[3] සම්මත් කර සහ පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය ෆයිසර් මුස්තාෆා මහතාගේ මැදිහත්වීමෙන් එය ක්‍රියාත්මක කළ අවස්ථාවේ ශ්‍රී ලංකාව එවැනි වාසිදායක අවස්ථානුගත දේශපාලන අවස්ථාවක් අත්විඳින ලදී කෙසේවෙතත්, මෙය දේශපාලනයේ කාන්තා නියෝජනය ඉහළ නැංවීම පිණිස නෛතික බැඳීමක් සහිත තහවුරු කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඒම සඳහා කටයුතු කළ බොහෝ කාන්තාවන් සහ කාන්තා සංවිධානවල අනවරත ක්‍රියාකාරකම් සහ උද්දේශන කටයුතුවල ජයග්‍රහණයකි.

1 ඩෘඩ් ඩාහ්ලරප්  දේශපාලන විද්‍යා මහාචාර්ය සහ ජාත්‍යන්තර උපදේශක
ස්ත්‍රීපුරුෂ සමාජභාවී කෝටාව ඇතුලුව තාවකාලික විශේෂ ක්‍රියාමාර්ග - වර්ග භාවිතය සහ බලපෑම්
2 ලෙපිනාර්ඩ්- රුබියෝ-මාරින් 2018:450 ඩාහ්ලරප් උපුටා දක්වන ලදී - 2020

3 https://elections'gov'lk/web/wp-content/uploads/publication/acts/01-2016_E.pdf

කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය, මෙම ඉතිහාසයේ සක්‍රීය පාර්ශවකරුවෙකි. ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ ඌන කාන්තා නියෝජනයේ පළමු නිල පිළිගැනීම 1993 කාන්තා ප්‍රඥප්තියේ අන්තර්ගත කරනු ලැබූ අතර එහි සටහන් කර තිබුයේ:

"රටේ දේශපාලන හා පොදු ජීවිතයෙහි මෙන්ම රාජ්‍ය හා පෞද්ගලික අංශවල ද කාන්තාවන්ට එරෙහිව ඇති වෙනස්කම් තුරන් කිරීමෙහි ලා උචිත සියලු පියවර ගනිමින්, රජය විසින් කාන්තාවන්ට පුරුෂ පක්ෂය හා සමාන පදනමක් මත, පහත දැක්වෙන අයිතිවාසිකම් සහතික කර දිය යුතුය;

(අ) සියලු ඡන්ද විමසීම්වලදී සහ ජනමත විචාරණවලදී ඡන්දය දීම සහ මහජනයා විසින් තෝරා පත් කරනු ලබන සියලු මණ්ඩලවලට තෝරා ගැනීමට සුදුස්සන් වීම,

(ආ) ජාතික, පළාත් හා ප්‍රාදේශීය ඡන්ද විමසීම්වල නාමයෝජනා ක්‍රියාවලියේදී සාධාරණ නියෝජනයක් ලැබීම

එම අවස්ථාව වන විට සහතික ලෙසකරන ක්‍රියාමාර්ග 'නාමයෝජනා ක්‍රියාවලියේදී සාධාරණ නියෝජනයක් ලැබීම' යන්නට සීමා විය. එය එතරම් අසාමාන්‍ය දෙයක් නොවුයේ, කෝටාවන් කෙසේ සංස්ථාපනය කළ යුතුද යන්න සම්බන්ධයෙන් තහවුරු කිරීමේ ක්‍රියාමාර්ග සඳහා පෙනී සිටි උද්දේශකයන් ඒ වන විට එතරම් දැනුවත්ව නොසිටි නිසා සහ රජයන් ඒ සම්බන්ධයෙන් ඊටත් වඩා අඩු අවධානයක් යොමු කළ නිසාවෙනි.

1990 සිට පසුගිය වසර ගණනාව මුළුල්ලෙහි, කාන්තා නියෝජනය ඉහළ නැංවීමේ කරුණ අරභයා කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය ප්‍රධාන වශයෙන්ම ප්‍රවේශ වුයේ කාන්තාවන්ට වැඩියෙන් නාමයෝජනා ලබාදීම සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ නායකත්වයට කරුණු දැක්වීම මගිනි. වයස 35 ට අඩු තරුණ පිරිස් සඳහා පළාත් පාලන ආයතනවල කෝටාවක් පැවැති නමුත් එය බොහෝ විට තරුණයන් සඳහා වෙන්වූවක් ලෙස දකිනු ලැබීය. පොදුවේ ගත් කළ, ප්‍රධාන ධාරාවේ දේශපාලන පක්ෂ කාන්තාවන් සඳහා 4% සිට 6% දක්වා වූ ප්‍රමාණයකින් පමණක් නාමයෝජනා ලබා දුන් අතර, එබැවින් සැලකිය යුතු සංඛ්‍යාවකින් තරග කිරීමේ සැබෑ අවස්ථාවක් කාන්තාවන්ට නොතිබුණි.. පළාත් පාලන මට්ටමේ ඔවුන්ගේ නියෝජනය 2% ක් පමණ ද, පළාත් සභා මට්ටමේදී 4% ක පමණ ද, පාර්ලිමේන්තුවේ 6% කට අඩුවෙන් ද පැවතුණි කාන්තාවන්ට දිගින් දිගටම නාමයෝජනා අහිමි වූ බැවින්, කාන්තාවන්ට පමණක් සීමා වූ ලැයිස්තු ඉදිරිපත් කිරීමට අප යොමු වූ නමුත් දේශපාලන පක්ෂ හරහා නියෝජිතයන් තෝරා පත් කර ගැනීම කෙරෙහි ප්‍රමුඛතාව ලබා දුන් ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතිය, ස්වාධීන කණ්ඩායම් ලැයිස්තු හරහා ජයග්‍රහණය කිරීම කාන්තාවන්ට කළ නොහැක්කක් බවට පත් කරන ලදී. නාමයොජනා සඳහා කාන්තාවන් සැලකිල්ලට ගනු ඇතැයි යන බලාපොරොත්තුව පෙරදැරිව, කාන්තාවන්ගේ නායකත්ව කුසලතා සහ පළාත් පාලන සහ පළාත් සභා පාලනය පිළබඳ දැනුම ප්‍රවර්ධනය කරමින් ප්‍රාදේශීය මට්ටමින් ඔවුන් සමග කටයුතු කිරීමේ ක්‍රියාවලියක් ද අප ආරම්භ කරනු ලැබීය. මැතිවරණ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයන්හි අප නිරත වූ අතර, විධිමත් සහ අවිධිමත් මාධ්‍ය ව්‍යාපාර හරහා කාන්තා අපේක්ෂිකාවන් පිළිබද කරුණු ඉදිරිපත් කරමින් ඔවුන් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කළ ද එමගින් සාර්ථක ප්‍රතිඵල නොලැබුණි එවැනි දරදඬුබවක් හමුවේ, කෝටාවන් ස්වරූපයෙන් සහතික ලෙස කරන ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කරා අප යොමුවුණි

කෙසේවෙතත්, කෝටාවන් සඳහා අවශ්‍යතාවය හෝ ඒවා ස්ථාපිත කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳව ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුවත්ම නොසිටි සහ ඒත්තු නොගත් අතර සැබෑ ලෙසම කාන්තා නියෝජනය ඉහළ නැංවීම පිණිස නෛතික බැඳීමක් සහිත නීති සම්පාදනය කිරීමට මැලිකමක් දැක්විය' ස්වේච්ඡා කෝටාවක් පිළිබඳ අදහසට පවා දේශපාලන පක්ෂ ඒකාකාර ප්‍රතිරෝධයක් දැක්විය. දේශපාලන නියෝජිතත්වය සඳහා කාන්තාවන් සුදුසු නොමැති බවත්, නැවැත තේරී පත්වීම සඳහා තරඟ කිරීමට අදහස් කරන්නේ නම්, දැනට සිටින පිරිමි සභිකයන්ගේ අවස්ථාව අහිමි කරමින් කිසිසේත්ම එසේ නොකළ යුතු බවත් සලකනු ලැබීය. එහි ප්‍රතිඵලයක් ලෙස, දැනට සිටින මන්ත්‍රීවරයකු මියගිය හෝ සක්‍රිය දේශපාලනයෙන් ඉවත් වූ විට ඔහු වෙනුවෙන් ඉදිරිපත් වීමේ පළමු අවස්ථාව පවුලේ වෙනත් පිරිමි සාමාජිකයකුට හිමි වූ අතර කාන්තාවන්ට නාම යෝජනා සඳහා පහසුවෙමන් අවස්ථාව හිමිවූයේ දේශපාලනයේ සිටින පිරිමි දේශපාලනඥයකු මියගිය විට ඒ වෙනුවෙන් ඉදිරිපත් වීමට ඔහුගේ පුතෙකු හෝ සහෝදරයකු නොමැති නම් පමණි.

# කාන්තාවන් සඳහා පළාත් පාලන ආයතනවල කෝටාව

දිර්ඝ කාලයක් පුරා අපේක්ෂාවෙන් සිටි කාන්තා කෝටාව නීතියක් බවට සම්මත වීමේ ඓතිහාසිකව වැදගත් අවස්ථාව කෙරෙහි අවධානය යොමු නොකරමින්, තමන් එක් කණ්ඩායමක් ලෙස පිළිගන්නා මෙන් ඉල්ලමින් ඒකාබද්ධ විපක්ෂය විසින් අවුළුවාලනු ලැබූ ව්‍යාකූලත්වය මධ්‍යයේ, අවසානයේදී 2016 පෙබරවාරි මස 06 වන දින පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී සම්මත විය. චූලනී කොඩිකාර ලියූ පරිදි:

" එදින පාර්ලිමේන්තුවේ රඟ දැක්වූ විකාරරූපී ජවනිකා කාන්තාවන්ගේ දේශපාලන නියෝජනය පිළිබඳ කරුණා සම්බන්ධයෙන් වසර ගණනාවක් පුරා දේශපාලනඥයන් දැක්වූ අනවධානය පිළිබඳ සරදමක් සේ දැකිය හැකිය."

පාර්ලිමේන්තුවේ ඇතිවූ මෙම වංකබව හා හාස්‍යය මුසුවූ ක්‍රියාකාරකම් එම අවස්ථාව සනිටුහන් කිරීම මෙන්ම එහි වැදගත්කම විවාද කිරීම සහ කෝටාව පිළිබඳ සංවාදය තවදුරටත් ඉදිරිය කරා රැගෙන යාමට අසමත් විය. මෙම ලජ්ජා සහගත අනවධානය මාධ්‍ය තුළින් ද පිළිබිඹු කෙරිණි එහි ඓතිහාසික වැදගත්කම ග්‍රහණය කර ගැනීමට අපොහොසත් වෙමින් එදින පාර්ලිමේන්තුවේ විපක්ෂයේ විගඩම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් මාධ්‍ය ඒ පිළිබඳව සඳහන් කළේ කිසිදු විශේෂයකින් තොරව වන අතර ප්‍රජාතන්ත්‍රවාදී පාලනය, දේශපාලන අවකාශයේ පුරුෂාධිපත්‍යය සහ කාන්තාවන් සහභාගි කරවා නොග ැනීම පිළිබඳ සංවාදය ඉදිරියට පවත්වා ගැනීමට කිසිදු උත්සාහයක් නොදරන ලදී. එසේම සංශෝධනයන්හි හරය හෝ සීමාවන් පිළිබඳව කිසිදු ආකාරයක සැලකිල්ලක් හෝ අවධානයක් යොමු කරමින් ඒවා සාකච්ඡා කිරීමක් ද සිදු නොවීය.

2016 වසරේ සිදුකළ මෙම සංශෝධනය[5] 2017 වසරේදී සැලකිය යුතු ලෙස ප්‍රතිශෝධනයකට ලක් වූ අතර එහිදී 25% කෝටාව එලෙසින්ම පවත්වා ගනිමින් කොට්ඨාශවලින් අවම වශයෙන් 10% ක් තරග කිරීම සඳහා කාන්තාවන්ට නාම යෝජනා ලබාදිය යුතු බවට විධිවිධාන සැලසූ අතර පළාත් පාලනයේදී සමානුපාතික නියෝජන ක්‍රමය අනුපූරණය කරමින් කේවල කොට්ඨාශ ක්‍රමය නැවත හඳුන්වා දුන් නව මිශ්‍ර මැතිවරණ ක්‍රමය තුළ අතිරේක පුද්ගල ලැයිස්තුවට 50% ක් කාන්තාවන් ඇතුලත් කිරීමට දේශපාලන පක්ෂවලට අනිවාර්ය කරන ලදී. මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීමේදී සියලු කොට්ඨාශ 25% ක් කාන්තාවන්ගේ අනුපූරණයකින් සමන්විත වන බවට මැතිවරණ කොමිෂම වග බලා ගත යුතුය. කෙසේවෙතත්, 2018 පෙබරවාරි මස පැවැති පළාත් පාලන මැතිවරණයෙන් පසුව දේශපාලන පක්ෂ නායකයන්, පක්ෂ සංවිධාකයන් සහ පරාජිත පිරිමි අපේක්ෂකයන් කාන්තා කෝටාව අසාධාරණ සහ අනවශ්‍ය යැයි සාමුහිකව එය හෙළා දැකීමෙන් කෝටාව පිළිබඳ අනවබෝධය සහ ඒ සම්බන්ධයෙන් සබුද්ධික සාකච්ඡාවක මඳ බව විද්‍යමාන කරන ලදී.

කෝටා ක්‍රමය මගින් පළාත් පාලන දේශපාලනයේ නිරත කාන්තාවන් සංඛ්‍යාව ආසන්න වශයෙන් 92 සිට 1991 දක්වා ඉහළ නංවමින් මැතිවරණ දේශපාලනය මෙන්ම පළාත් පාලන මට්ටමේ පාලනය යන දෙකෙහිම සැලකිය යුතු පරිවර්තනයක් සිදුකරන ලදී. මේ වන විට සියලු පළාත් පාලන ආයතනයන් තුළ කාන්තාවන් සිය ස්ථානය තහවුරු කරගනිමින් සිටින අතර පළාත් පාලනය තුළ ශක්තිමත් බලපෑමක් ඇති කරමින් සිටියි. එහෙත් " දේශපාලන අභිප්‍රාය සහ කාන්තාවන් පිළිග ැන්ම, ඔවුන්ගේ හැකියාව සහ සත්‍ය ලෙසම නියෝජන දේශපාලනය වෙත ඔවුන්ගේ අයිතිය අනිවාර්යයෙන් විය යුත්තක් සේ නොදකින අතර නිරන්තරයෙන් අභියෝග යට ලක් කරනු ලබයි.

*4 2016 අංක 1 දරන පළාත් පාලන ඡන්ද විමසීම් (සංශෝධන) පනත බලන්න*
*5 2017 අංක 16 දරන පළාත් පාලන ඡන්ද විමසීම් (සංශෝධන) පනත බලන්න*

# කෝටාව ශක්තිමත් කිරීමේ සහ ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය

කාන්තා නියෝජනය ප්‍රවර්ධනය කළ හැක්කේ කෙසේද යන්න සම්බන්ධයෙන් තාවකාලික විශේෂ ක්‍රියාමාර්ග සහ සහතික ලෙස කරන ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධය සැලකිය යුතු බලපෑමක් ඇති කර තිබේ. තාවකාලික විශේෂ ක්‍රියාමාර්ග කාලය හා අදාළව තාවකාලික ලෙස සහ ආකෘතිය හා අදාළව විශේෂ ලෙස අදහස් වන්නේ යැයි වරදවා තේරුම් ගනු ලැබ තිබේ. කෙසේ වෙතත්, කාලය සහ ආකෘතිය යන දෙකටම අදාළව, තාවකාලික විශේෂ ක්‍රියාමාර්ග ඓතිහාසික ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙනස් කොට සැලකීම් ආමන්ත්‍රණය කිරීම අවශ්‍ය වන අතර එසේ වෙනස් කොට සැලකීමට ප්‍රතිකර්ම යොදන බවට වග බලා ගත යුතුය. ඒ අනුව මේ සඳහා ගතවන කාලය නොතකා, එය සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරන ඉලක්කය සපුරා ගන්නා තෙක් මෙම ක්‍රියාමාර්ග අඛණ්ඩව පවත්වා ගැනීම අවශ්‍ය වේ.

කාන්තා කෝටාවන් බොහෝ විට සකස් කර ඇත්තේ ද කාන්තාවන්ට යටත් පිරිසෙයින් අවම නියෝජනයක්" බොහෝ විට 1/3 ක 'අවම ප්‍රමාණ' කඩඉමක් සේ සලකනු ලබන නියෝජනයක් ලැබීම සුදුසු වන්නේය යන අවබෝධයෙනි. එහෙත් එවැනි කෝටාවන් මගින් පිරිමින් ක්ෂණිකව වරප්‍රසාද ලබනුයේ අභියෝගයට ලක් නොකරන සහ බොහෝ සේ විශාල, අසමාන සහ නිල වශයෙන් පිළි නොගත් වාසියක් ඔවුන්ට ලබා දීම මගිනි. කාන්තාවන්ට 1/3 'අවම ප්‍රමාණයක' සහනයකට ඉඩ ලබාදෙනු ලබන්නේ නම්, එවිටම පිරිමින්ට කිසිදු විවාදයකින් තොරව ඉතිරි 2/3 වාසිය ලබා දෙනු ලැබේ. පිරිමින්ගේ 'අධි නියෝජනය' ආරක්ෂා කරනු ලබන දැන් පවතින තත්ත්වය දිගටම පවත්වා ගෙන යාමට ඉඩ සලසයි. කෝටාවේ ආකෘතිය පිළිබඳ විවාදය, සමානාත්වය හෝ තුලනය රැගෙන එමින් අවම නියෝජනයේ සිට සමතාවයේ අදහස හෙවත් 50;50 නියෝජනය දක්වා විතැන් වෙමින් පවතී. ස්ත්‍රී පුරුෂ සමාජභාවී අසමානතාව සහ වෙනස් කොට සැලකීම යන කරුණු දෙකම සඳහා පිළියම් යොදන තවත් සමකාලීන ක්‍රමයක් ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ " ස්ත්‍රී පුරුෂ සඳහා "40% කට නොඅඩු " හෝ " ස්ත්‍රී පුරුෂ සඳහා 30% ක අවමයක් සහ 70%ක උපරිමයක" ලෙසය. (ඩාහ්ලුලැප්, 2020). මෙම සියුම් වෙනස පැහැදිළි කරමින් ඩාහ්ලුලැප් පවසනුයේ "මෙහිදී වැදගත් කරුණ වනුයේ, කාන්තාවන් සඳහා වන කෝටාවන් කාන්තාවන් සඳහා අවමයක් සහ පිරිමින් සඳහා පමණක් උපරිමයක් නිශ්චිතව දක්වන අතර ස්ත්‍රී පුරුෂ විභේදනයෙන් තොර කෝටා රෙගුලාසි ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම සඳහා උපරිම සීමාවක් පැනවීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස ස්ත්‍රී පුරුෂ විභේදනයෙන් තොර සූත්‍ර/ක්‍රම ස්ත්‍රී පුරුෂ සමාජභාවී තුලනය ඉලක්කය ලෙස දක්වන අතර කාන්තාවන් දැන් ඉල්ලා සිටිනුයේ පූර්ණව බලය බෙදාගැනීමේ ක්‍රමවේදයක්ය. කෙසේවෙතත් සමාජ පංතිය, ජාතිය, වාර්ගිකත්වය ආදිය ඇතුලුව, වෙනත් ආන්තිකකරණයන්හි සමාජීය වර්ගීකරණයන්ගේ අන්තර්සබැඳි ස්වරූපයන් අන්තර්ගත කිරීම පිණිම මෙම සූත්‍රායණය තවදුරටත් සූක්ෂමව වෙනස් කිරීම අවශ්‍ය වන අතර එමගින් මෙම තුලනය ඇතැම් කාන්තා කණ්ඩායම්වලට තවත් කාන්තා කණ්ඩායම් නොසලකා හරිමින් වරප්‍රසාද ලබා දීම දිගින් දිගටම සිදු නොකරනු ඇත.

කෝටාවක් දිනාගැනීම, සටනින් අඩක් ජයග්‍රහණය කිරීමක් විය හැකි නමුත් ආකල්පමය වෙනස්කම්, දේශපාලන කැමැත්ත සහ අනුකූලතාවය සඳහා තව බොහෝ දුරක් යා යුතුව තිබේ. 2018 පෙබරවාරි පළාත් පාලන මැතිවරණයෙන් අනතුරුව කාන්තා කෝටාවට එරෙහිව ඇතිවූ නිශේධනාත්මක ප්‍රතික්‍රියාවේදී අප මෙය අත් දුටුවෙමු. එබැවින් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වී වෙර ගැන්වෙන පරිදි දේශපාලන ආණ්ඩුකරණයේ සෑම මට්ටමකදීම සාධාරණ නියෝජනයකට ඇති අයිතිය කාන්තාවන්ට සහතික කළ යුතුය යන අවබෝධය ගොඩනගන අතර, අප කෝටාව ආරක්ෂා කර ගත යුතුය. ඒ අතරම වඩා පුළුල් සමාජ වෙනස්කම් සිදුවීමට ඉඩ ඇති දේශපාලන වෙනස්කම් සමග එක විට සිදු වීම අවශ්‍ය වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවී අසමානතා අර්ථාන්විතව වෙනස් කිරීම පිණිස රාජ්‍ය සහ පුද්ගලික ක්ෂේත්‍රයන්හි ශ්‍රමයේ ලිංගික විභාජනය පිළිබඳ සංජානනය සහ යථාර්තය ඇතුලුව ස්ත්‍රී පුරුෂ සමාජභාවයට පාදක වූ ව්‍යුහාත්මක හේතු (වාර්ගික, ආගමික, පංති සහ කුල අනුව වෙනස් කොට සැලකීම් සහ පුරුෂ මූලික ව්‍යුහයන්) සඳහා පිළියම් යෙදිය යුතුය.

# මෙම අධ්‍යයනය

මෙම පර්යේෂණ අධ්‍යයනය මැනැවින් නිරූපණය කරන පරිදි දේශපාලනයේ නිරතවීමේ කාර්යේදී පිරිමින් හා සමානව කාන්තාවන්ට ද සහභාගි වීමට හැකි වන පරිදි කාන්තා නියෝජනයේ ප්‍රමාණාත්මක වැඩිවීමක් කරා ගමන් කරන අතරම, කාන්තා කෝටාවේ වාසිදායක තත්ත්වයන් තවදුරටත් තහවුරු කරගනිමින් පළාත් පාලන මට්ටමින් කාන්තා දේශපාලනඥයන් සමග සිදුකරන කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීම තීරණාත්මක වන අතර ඉහළ නැංවුණු නිත්‍ය නියෝජනය සහ වඩා ප්‍රජාතන්ත්‍රවාදී සහ සියල්ලන්ම ඇතුලත් දේශපාලන සංස්කෘතියක් කරා ගමන් කිරීමට අපට හැකියි ශ්‍රී ලංකාවේ දේශපාලනයේ නිරත කාන්තාවන් පිළිබඳව වූ පුළුල් පරාසයක විද්වත් පර්යේෂණ” දේශපාලනයට පිවිසීම සඳහා සහ නියෝජිත දේශපාලනයේ තම ස්ථානය පවත්වා ගැනීම සඳහා කාන්තාවන් මුහුණ දී ඇති අභියෝග රාශියක් බොහෝ කලක සිට හඳුනාගෙන ඇති 2018 පළාත් පාලන මැතිවරණය අවසන් වී කාන්තාවන් 1991 දෙනෙකු පළාත් පාලන දේශපාලනයට පිවිසි වහාම සිදුකරනු ලැබූ මෙම අධ්‍යයනය නාමයෝජනා ලබාගැනීමේ, මැතිවරණය තරඟ කිරීමේ, කොට්ඨාශ ආසන දිනා ගැනීමේ, අතිරේක ලැයිස්තු හරහා පත්කරනු ලැබීමේ සහ පළාත් පාලන ආයතනවල සභිකයන් ලෙස කටයුතු කිරීමේ අභියෝගයන්ට සාර්ථකව මුහුණ දුන් කාන්තා දේශාපාලනඥයන්ගේ පුළුල් අත්දැකීම් විමසා බලයි ඊට අමතරව, දේශපාලන නියෝජනයේ ස්වභාවය පිළිබඳ පුළුල් සමකාලීන දේශපාලන සංවාදය, දේශපාලන පක්ෂවල කාර්යභාරය, දේශපාලන පක්ෂ විසින් සිදුකරනු ලබන සූක්ෂම මැතිවරණ මෙහෙයුම්, මැතිවරණවල ස්වභාවය සහ මැතිවරණ ප්‍රචාරණය පිළිබඳ සංදර්භය තුළ මැතිවරණය තරඟ කළ කාන්තා දේශපාලනඥයන්ගේ පසුබිම සම්බන්ධයෙන් ප්‍රබල අන්තර්දෘෂ්ඨියක් මෙම අධ්‍යයනය සපයයි

මෙම විස්තීරණ විශ්ලේෂණ ව්‍යුහය තුළ පවුල් පසුබිම, පක්ෂය තුළ තත්ත්වය, ආර්ථික ශක්තිය සහ දේශපාලන දැනුම වැනි විවිධ සාධක තම දේශපාලන ගමනේදී කාන්තාවන්ට බලපාන්නේ කෙසේද යන්න පිළිබඳව මෙම අධ්‍යයනයෙන් විමසා බලන ලදී එසේම තම ඉලක්කය කරා ළඟාවීමට උත්සාහ දැරීමේදී පවත්නා ව්‍යුහයන් සහ සැකසුම්වලට කාන්තා දේශපාලනඥයන් කෙතරම් දුරට අනුගත වන්නේ ද නැතහොත් අභියෝග කරන්නේ ද පිළිබඳවත් එය විමර්ශනය කරන ලදී නියෝජනය සැවොම සඳහා සාධාරණ විය යුතුය සහ සියල්ලන්ම ඇතුලත් විය යුතුය යන ප්‍රජාතන්ත්‍රවාදී ධර්මතාව ශක්තිමත්ව ස්ථාපනය කිරිම සඳහා මෙය වැදගත් හා හදිසි අවශ්‍යතාවයකි පුරුෂ මූලික පාලනයේ එක් අවසන් සහ අවිපරිණාමීය සමාජ සංස්ථාවක් වන ශ්‍රී ලංකාවේ දේශපාලන බලය පාලනය කිරීම සහ ආණ්ඩුකරණය අවසන් කිරීම උදෙසා වන කාන්තා ප්‍රයත්නයේදී මෙය පැහැර හැරිය නොහැක්කකි

**කුමුදුනී සැමුවෙල්**

*2021 ජනවාරි*

# පටුන


පූර්විකාව iii

කාන්තාවන් සඳහා පළාත් පාලන ආයතන කෝටාව .... v

කෝටාව ශක්තිමත් කිරීමේ හා ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව vi

මෙම අධ්‍යයනය ...................................................... vii

පටුන.................................................................................. viii

රූප සටහන් ලැයිස්තුව.......................................... ix

වගු ලැයිස්තුව....................................................... x

හැඳින්වීම............................................................................ 11

සංදර්භය.............................................................................. 12

ක්‍රමවේදය............................................................................ 15

අනාවරණ.............................................................................. 16

දේශපාලන පක්ෂය හා කාන්තා නියෝජනය............ 17

දැනුම වාසිය ගෙන දෙයි......................................... 20

කාන්තා දේශපාලනඥයන් හා බල මූලාශ්‍ර................ 23

මූල්‍ය සම්පත්........................................... 24

සංස්කෘතික සම්පත්................................. 25

සමාජ ජාල වෙත ප්‍රවේශය..................... 27

තේරී පත්වීමේ ප්‍රයත්නය සඳහා සහයෝගය..................... 29

තම දේශපාලන අනාගතයට බාධාවන් ලෙස කාන්තා දේශපාලනඥයන් දකිනුයේ කවරක්ද?............................... 32

මූල්‍ය සම්පත් හිඟය................................................ 32

විරුද්ධ පක්ෂවල අභියෝග..................................... 33

ප්‍රචණ්ඩ දේශපාලන සංස්කෘතිය............................... 34

තම පක්ෂයේම අභියෝග....................................... 35

තම සමාජය තුළින්ම මතුවන අභියෝග.................. 36

කාන්තා දේශපාලනයේ පුරුෂ භූමිකාව............................. 36

දේශපාලන අභිලාෂ.......................................................... 37

පුහුණුව මගින් කාන්තාවන්ට ශක්තිය ලබා දීම.................. 38

පළාත් පාලන මට්ටමේ කාන්තා දේශපාලනඥයන් සහ මැතිවරණ දේශපාලනය පිළිබඳ ඔවුන්ගේ දැක්ම.............. 38

නිගමන.............................................................................. 41

ආශ්‍රිත ග්‍රන්ථ.................................................................... 44

# රූප සටහන් ලැයිස්තුව

රූප සටහන 01- කාන්තාවන්ගේ දේශපාලන අනාගතය සඳහා විශාලතම බාධා.................... 34

# වගු ලැයිස්තුව

වගුව 1-අපේක්ෂක වර්ගය අනුව දේශපාලන අත්දැකීම් වසර ගණන........................................... 18
වගුව 2-අපේක්ෂක වර්ගය අනුව පක්ෂය තුළ දේශපාලන අත්දැකීම් වසර ගණන....................... 19
වගුව 3-අපේක්ෂක වර්ගය අනුව පළාත් පාලන ආයතන පාලනය කරන්නා වූ නීති පිළිබඳ දැනුම 20
වගුව 4-අපේක්ෂක වර්ගය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ දැනුම........................................ 21
වගුව 5-අපේක්ෂක වර්ගය අනුව පක්ෂ මතවාදය පිළිබඳ දැනුම................................................. 22
වගුව 6-අපේක්ෂක වර්ගය අනුව රටේ ඉතිහාසය පිළිබඳ දැනුම................................................. 22
වගුව 7-අපේක්ෂක වර්ගය අනුව පළාත් පාලන මැතිවරණය සඳහා මුදල් වැයකිරීම.................... 25
වගුව 8-අපේක්ෂක වර්ගය අනුව පවුල දේශපාලනයට සම්බන්ධ.................................................. 26
වගුව 9-අපේක්ෂක වර්ගය අනුව පාසල් සමය තුළ ක්‍රියාශීලී......................................................... 27
වගුව 10-අපේක්ෂක වර්ගය අනුව අසල්වැසි ප්‍රජාව තුළ ක්‍රියාශීලී............................................... 28
වගුව 11-අපේක්ෂක වර්ගය අනුව  සාංගමික ජීවිතයේ ක්‍රියාශීලී.................................................. 28
වගුව 12-අපේක්ෂක කාණ්ඩය අනුව උපකාර මූලාශ්‍ර..................................................................... 31
වගුව 13-අපේක්ෂක වර්ගය අනුව දේශපාලන අනාගතය සඳහා පවතින බාධක.......................... 35
වගුව 14 අපේක්ෂක වර්ගය අනුව දේශපාලන අභිලාෂ............................................................... 37
වගුව 15-අපේක්ෂක වර්ගය අනුව පුහුණු මට්ටම........................................................................ 38
වගුව 16-අපේක්ෂක වර්ගය අනුව මැතිවරණ දේශපාලනය පිළිබඳ දැක්ම.................................. 39

# හැඳින්වීම

ව්‍යවස්ථාදායකයේ කාන්තා නියෝජනය ඉහළ නැංවීම සඳහා වන අරගලය දීර්ඝ හා දුෂ්කර වූවකි. දේශපාලනයේ කාන්තා නියෝජනය වැඩි කිරීම, වසර ගණනාවක් පුරා ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකම, එනම් එක්සත් ජාතික පක්ෂය හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නිරන්තරයෙන් ලබා දුන් මැතිවරණ පොරොන්දුවක් විය. කෙසේවෙතත්, මැතිවරණ නිමාවීමත් සමගම මෙම කරුණ සම්බන්ධයෙන් පොදුවේ සියලු දේශපාලන පක්ෂවල උනන්දුව හීන වී යයි. අප සමාජයේ පවතින පීතෘමූලික ව්‍යුහයන්, සහ විශේෂයෙන්ම දේශපාලන පක්ෂ ව්‍යුහයන්හි පුරුෂ ආධිපත්‍යය, පොදුවේ දේශපාලනයේ සහ විශේෂයෙන්ම ව්‍යවස්ථාදායක ආයතනයන්හි කාන්තා නියෝජනය ඉහළ නැංවීම කෙරෙහි සැලකිය යුතු තර්ජනයක් එල්ල කරයි. එබැවින් දේශපාලනයට පිවිසීමේදී කාන්තාවන් මුහුණ දෙන මෙම ව්‍යුහාත්මක අවාසිය ජයගැනීම පිණිස කාන්තා සංවිධාන, සියලු ව්‍යවස්ථාදායක ආයතනවල කාන්තාවන් සඳහා කෝටාවක් වැනි තහවුරු කිරීමේ ක්‍රියාමාර්ග වෙනුවෙන් උද්දේශනය කර තිබේ.

**මෙම අධ්‍යයනය මගින් විමසා බලනු ලබන්නේ නව කෝටාව දේශපාලනයේ කාන්තා නියෝජනය ඉහළ නැංවීමට හේතු කාරක වන්නේද” අළුතින් තේරී පත්වූ කාන්තා සභිකයන් සභාව තුළ හා ඉන් පිටත මුහුණ දෙන අභියෝග මොනවාද සහ එය දිගු කාලීනව තිරසර ද යන කාරණාවන්ය.**

යහපාලන ධජය යටතේ 2015 ජනවාරියේදී බලයට පැමිණි යහපාලන රජය, ශ්‍රී ලංකා මැතිවරණ ඉතිහාසයේ ප්‍රථමවරට පළාත් පාලන ආයතන සඳහා මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම මැතිවරණ ප්‍රතිසංස්කරණයන් තුළ ශ්‍රී ලංකාවේ පළමු වරට කාන්තා අපේක්ෂිකාවන් සඳහා කෝටා ක්‍රමයක් අන්තර්ගත විය. එහි ප්‍රතිඵලයක් ලෙස, සියලු කොට්ඨාශවලින් 10% කට තරග කිරීමේ අවස්ථාව කාන්තාවන්ට හිමි වූ අතර පළාත් පාලන ආයතන සඳහා හඳුන්වා දුන් බහු මන්ත්‍රී සමානුපාතික ක්‍රමය යටතේ සියලු පළාත් පාලන ආයතන අවම වශයෙන් කාන්තාවන් 25%ක් තෝරා පත්කර ගත යුතු බවට වූ අතුරු විධානයක් සහිතව මනාප ලැයිස්තුවල ද 50% ක් කාන්තාවන් සඳහා වෙන්කරන ලදී. මෙමගින් නැවත වරක් කෝටාවන්හි කර්තව්‍ය, ව්‍යවස්ථාදායකයේ සහ පොදුවේ දේශපාලනයේ කාන්තා නියෝජනය පිළිබඳ සංවාදය තීව්‍ර කරන ලදී. එහිදී විවාදයට බඳුන් වූ කරුණු අතර මෙම කෝටා ක්‍රමය මගින් සැබැවින්ම කාන්තා නියෝජනය ඉහළ නංවනු ඇත්ද, කෝටා ක්‍රමය ඔස්සේ පළාත් පාලන ආයතනවලට පත් වූ කාන්තා සභිකයන් කාන්තාවන්ගේ ගැටලු සම්බන්ධයෙන් හඬ නගමින් නියෝජිත දේශපාලනයට ස්ත්‍රී පුරුෂ සමාජභාවී දෘෂ්ටියක් ගෙන එනු ඇත් ද නැතහොත් ඔවුන් සිය පක්ෂ නායකත්වයේ අදහස් ප්‍රතිරාව කරන්නන් පමණ් වේද යන්න ආදිය විය. පළාත් පාලන සභිකයන් ලෙස කටයුතු කිරීමේදී මෙම නව කාන්තා මන්ත්‍රීවරියන් හට තම පක්ෂයෙන්ම මෙන්ම පොදුවේ පිරිමි දේශපාලනඥයන්ගෙන් මුහුණ පෑමට සිදුවන අභියෝගයන් කවරේද? නව කෝටා ක්‍රමය දේශපාලනයේ කාන්තා නියෝජනය ඉහළ නැංවීමට හේතු කාරක වුවද එය ඵලදායීව දේශපාලනයේ නිරතවීමට සත්‍ය ලෙසම කාන්තාවන්ට හැකියාව ලබා දෙනු ඇතිද, අළුතින් තේරී පත්වූ මෙම කාන්තා සභිකයන් සභාව තුළ සහ ඉන් පිටත මුහුණ දෙන අභියෝග මොනවාද සහ එය දිගුකාලීනව තිරසාර වන්නේද යන්න විමසා බැලීම පිණිස මෙම අධ්‍යයනය සිදුකරනු ලැබුයේ මෙම සංදර්භය තුලය.

# සංදර්භය

නිදහසට ලැබීමට වසර 17කට පෙර පවත්වනු ලැබූ ශ්‍රී ලංකාවේ පළමු මැතිවරණයේදී රාජ්‍ය මන්ත්‍රණ සභාවට සෘජුවම එක් අයෙක් ද අතුරු මැතිවරණයෙන් තවත් අයෙක් ද ලෙස කාන්තාවන් දෙදෙනෙකු තේරී පත්විය. ඒ අනුව 1931 තරම් ඈත කාලයේදී පවා ව්‍යවස්ථාදායකයේ ආසනවලින් 5% ක් ලබාගැනීමට කාන්තාවන්ට හැකි වුණි කෙසේ වෙතත් ගැටලුව වනුයේ, අනෙකුත් සියලු දකුණු ආසියානු රටවල් තම කාන්තා කෝටාවෙන් පහසුවෙන් මෙම ප්‍රතිශතය පසුකර යාමේදී, දශක හතක් මුළුල්ලෙහිම මෙරටෙහි එය අඩු වැඩි වශයෙන් එම මට්ටමේම පැවැතීමයි. (වික්‍රමසිංහ සහ කොඩිකාර 2012)

ශ්‍රී ලංකාවේ ජනගහනණයෙන් අඩකට මදක් වැඩි වුවද, විදේශ ප්‍රේ ෂණ උත්පාදනය කරන රටේ ප්‍රමුඛතම ආර්ථික ක්ෂේත්‍ර තුන සඳහා ඉහළම දායකත්වය සැපයුව ද, තම ජීවිත හා ජීවනෝපාය පිළිබඳ තීරණ ගන්නා වූ ප්‍රතිපත්ති සම්පාදන භූමිකාවේදී කාන්තා සහභාගිත්වය අවම මට්ටමක පවතී. ඉහළ සාක්ෂරතා අනුපාතය, උසස් අධ්‍යාපනය සඳහා පිවිසීමේ සැළකිය යුත වර්ධනය, සුදු කරපටි වෘත්තීන්හි නියැළීම ඉහළයාම වැනි ඔවුන්ගේ අනෙකුත් සමාජීය හා වෘත්තීමය ජයග්‍රහණ ද පිළිබිඹු කිරීමට දේශපාලනය පරිසරය අපොහොසත් වී තිබේ. එහෙයින්, දේශපාලනයේ නිත්‍ය කාන්තා නියෝජනය ඉහළ දැමීම සම්බන්ධයෙන් වන ප්‍රතිපත්තිමය සංවාදය මෑත කාලයේදී වඩාත් තීව්‍ර වී තිබේ. කාන්තා කෝටාව මෑතකදී හඳුන්වා දෙන තෙක්ම, පළාත් පාලන මට්ටමේ ද කාන්තා නියෝජන පැවැතියේ අඩු මට්ටමකය. 1966-2011 දක්වා කාල පරාසය තුළ පළාත් පාලන ආයතනයන්හි කාන්තා නියෝජනයේ කණගාටුදායක මට්ටම පහත වගුවෙන් නිරූපණය වේ.

**ආන්තික කණ්ඩායම් ශක්තිමත් කිරීමේ ලා සමානුපාතික නියෝජන ක්‍රමය දායකත්වයක් දැක්වූයේ වුවද, තිරණ ගැනීමේ ආයතනවල කාන්තා සහභාගිත්වය ඉහළ නැංවීමට එය කිසිවක් නොකළ තරම් යැයි මැතිවරණ සංඛ්‍යාලේඛන පෙන්නුම් කරයී**

**වගුව අ - මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභාවන්හි මුළු සාමාජිකත්වයේ % ක් ලෙස 1966 වසරේ සිට පළාත් පාලන ආයතනයන්හි කාන්තා නියෝජනය**

| | මීනිසි | නීසි | ප්‍රීසි | එකතුව |
|---|---|---|---|---|
| 1966 | 1.1 | *1.9 | ** | |
| 1970 | 2.9 | *1.4 | ** | |
| 1979 | 2.8 | 2.3 | ** | |
| 1982 | 1.3 | 1.7 | ** | |
| 1991 | 2.9 | 2.5 | 1.6 | 1.7 |
| 1997 | 3.4 | 2.6 | 1.7 | 1.9 |
| 2006 | 3.0 | 3.4 | 1.6 | 1.8 |
| 2008-2011 | 2.63 | 2.47 | 1.93 | 2.06 |

මූලාශ්‍රය: කොඩිකාර 2012 පිටුව 10-11

**1966 සහ 1970 හි නගර සභා සංඛ්‍යාලේඛනවල එවකට පැවැති නගර සහ සුළු නගර සභා ඇතුලත් වේ*

*** මැතිවරණ නොපවත්වන ලදී*

නිදහසින් පසුව රටේ දේශපාලන සහභාගිත්වය සැළකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ. දේශපාලන පක්ෂ ක්‍රමයේ ව්‍යාප්තිය සහ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන පුළුල් වීම සමගින්, දිවයිනේ ඉතා දුර බැහැර ප්‍රදේශයන්හි පුරවැසියන්ට පවා මැතිවරණ සඳහා සහභාගි වීමට ඉඩ ප්‍රස්ථා විවර වන ලදී. සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වාදීමෙන් පසුව ඡන්දයේ සඵලත්වය තවදුරටත් වැඩි දියුණු වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, ධූරාවලිමය වඩා පහළ කුල කණ්ඩායම් සහ සුළු ජන කොටස්වල පුද්ගලයන්ට පෙරට වඩා රටේ ව්‍යවස්ථාදායක ආයතනයවලට තේරී පත්වීමට හැකි වුණි සමානුපාතික නියෝජනය යටතේ, මනාප ඡන්ද ක්‍රමය, (එක් එක් ඡන්ද දායකයාට එක් පක්ෂයක/ සන්ධානයක අපේක්ෂකයන් හට ඡන්ද තුනක් ලබා දීමට හැකිය) සංස්කෘතිකමය වශයෙන් කොන් කරනු ලැබූ කණ්ඩායම්වල අපේක්ෂකයන්ට පාර්ලිමේන්තු මැතිවරණවලදී වැඩි වාසි සලසා තිබේ. (පීරිස් 2018) කෙසේ වෙතත්, කොන්කරනු ලැබූ කණ්ඩායම් ශක්තිමත් කිරීමට දායකත්වයක් දැක්වූයේ වුවද, ව්‍යවස්ථාදායක ආයතනවල කාන්තා නියෝජනය ඉහළ නැංවීම කෙරෙහි සමානුපාතික නියෝජන ක්‍රමය කිසිවක් සිදු කර නොමැති බව මැතිවරණ සංඛ්‍යා ලේඛන පෙන්නුම් කරයි.

එහි ප්‍රතිඵලයක් ලෙස, වත්මන් ව්‍යවස්ථාදායක ආයතනවල මූලිකවම පුරුෂ ආධිපත්‍ය බලපැවැත්වෙන අතර කාන්තාවන්ට විශේෂිත වූ හෝ පිරිමින්ට වඩා කාන්තාවන්ට වැඩියෙන් බලපෑමේ ප්‍රවණතාවක් ඇති ගැටලු කෙරෙහි ඉතා අඩු අවධානයක් යොමුව ඇති ප්‍රතිපත්ති නිර්මාණය වී තිබේ. තේරී පත්වූ අවස්ථාවන්හිදී පවා, තම ධූරයේ වගකීම් ඉටුකිරීමට අමතරව, පවතින ක්‍රමයට එරෙහිව අරගල කිරීමට බොහෝ විට කාන්තා නියෝජිතයන්ට සිදුව ඇති අතර ඒ හේතුවෙන් කාන්තා දේශපාලනඥයෙකුට සතුටුදායක ලෙස කාර්ය ඉටු කිරීම අභියෝගාත්මක වී තිබේ. (බ්‍රෝඩි 2009) මෙම සාධක, ශ්‍රී ලංකා රජයේ සියලු ස්ථරයන්හි කැපී පෙනෙන ලෙස අඩු කාන්තා නියෝජනයක් සහිත තත්වයක් සඳහා දායක වී තිබේ.

මීට ප්‍රතිකර්මයක් ලෙස, 1990 දශකයේ අග භාගය දක්වා දිවෙන දිගු කාලීන අරගලයක ප්‍රතිඵලයක් ලෙස, 2017 වසරේදී පළාත් පාලන ආයතන තුළ කාන්තාවන් සඳහා 25% ක කෝටාවක් හඳුන්වා දෙන ලදී. දේශපාලන භූමිය වෙත සමානව ප්‍රවේශයක් ලබාගැනීමෙන් කාන්තාවන් වළක්වාලන ව්‍යුහාත්මක අසමානතා සැලකීමේදී විධිමත් සමානත්වය හෝ සම අවස්ථාව, ඔවුන් සඳහා නියෝජනයේ සාධාරණත්වය සහතික කිරීම පිණිස ප්‍රමාණාත්මක නොවන බැවින් එය ප්‍රතිඵලයේ සමානත්වය ස්ථාපිත කිරීම පිණිස ගනු ලැබූ ක්‍රියා මාර්ගයකි (කොඩිකාර 2009) විශේෂයෙන්ම ඡන්ද ලබාගැනීමට කාන්තාන්ට ඇත්තේ අඩු හැකියාවක් බවට පවතින මතය හේතුවෙන් කාන්තාවන්ට නාම යෝජනා ලබා දීමට දේශපාලන පක්ෂවල පොදුවේ නොකැමත්තක් පවතින සංදර්භය තුළ (ඉහත සඳහන් කළ පරිදි), අනිවාර්ය කෝටාව පළාත් පාලන ආයතන

**දකුණු ආසියාවේ වෙනත් බොහෝ රටවල මෙන්ම ඓතිහාසිකව ශ්‍රී ලංකාවේ ද විදේශ අධ්‍යාපනය හැදෑරූ ළමා අවධියේ සිටම ඉහළ මට්ටමේ දේශපාලනයේ සමාජීයකරණය සහිත ප්‍රභූ පවුල්වල කාන්තාවන් දේශපාලනයේ ඉහළ තනතුරුවලට පැමිණීමේ ප්‍රසවණතාවක් දක්නට ලැබුණි**

තුළ ඓතිහාසිකව පැවැති 2 ක සාමාන්‍යය ඉක්මවා යන කාන්තා නියෝජනයේ වැඩි වීමක් සහතික කරයි. (කොඩිකාර 2012) මූලිකවම, මැතිවරණ තරඟ කිරීම හරහා වැඩි කාන්තාවන් පිරිසක් දේශපාලනයට ප්‍රවිශ්ඨ වීමට දිරිමත් කිරීම මගින් නිත්‍ය කාන්තා නියෝජනය ඉහළ නැංවීම කෙරෙහි වූ මුල් පියවරක් ලෙස කාන්තා කෝටාව යොදාගනු ලැබීම පිළිබඳ උදාහරණ රුවන්ඩාව සහ ඇතැම් ලතින් ඇමෙරිකානු රටවල් සපයයි. (ෂෙවඩෝවා ෂඞ් 2005, පැල්මෙයිරි සහ ජැබ්රේ 2005), කෝටාව උපරිම සීමාවක් ලෙස දකිනු ලැබීමට හෝ ව්‍යවස්ථාදායකයේ ඉහළ නැංවුණු ආසන සංඛ්‍යාව මගින් පක්ෂයේ බලය තහවුරු කිරීමේ ක්‍රමයක් ලෙස යොදා ගැනීමට ඉඩ නොතබිමින්, ශ්‍රී ලංකාවේ අළුතින් හඳුන්වා දුන් කෝටා ක්‍රමය ද ඒ හා සමාන දිශාවක් ඔස්සේ මෙහෙයවිය යුතුය. (අල්-ජීරායිබ් 2000)

කෙසේවෙතත්, කෝටාව හරහා පළාත් පාලන ආයතනවලට පිවිසීමට අවස්ථාව ලැබෙනුයේ කාටද යන්න පිළිබඳ පවතින අවිනිශ්චිතතාව මගින් මෙම කරුණට අදාළව තවත් සංකීර්ණතාවක් නිර්මාණය කර තිබේ. දකුණු ආසියාවේ වෙනත් බොහෝ රටවල මෙන්ම, ඓතිහාසිකව ශ්‍රී ලංකාවේ ද විදේශ අධ්‍යාපනය හැදෑරූ, ළමා අවධියේ සිටම ඉහළ මට්ටමේ දේශපාලනයේ සමාජීයකරණය සහිත ප්‍රභූ පවුල්වල කාන්තාවන් දේශපාලනයේ ඉහළ තනතුරුවලට පැමිණීමේ ප්‍රසවණතාවක් දක්නට ලැබුණි දේශපාලන නායිකාවන් ලෙස ඔවුන්ගේ විශ්වසනීයත්වය ඔවුන්ගේ පුද්ගලික හැකියාවන්ට වඩා මෙම පවුල් පසුබිම නිසා ඇති වූ නමුත් දකුණු ආසියාවේ තවමත් පවතින වැඩවසම් නශ්ඨාවශේෂ සැලකිල්ලට ගැනීමේදී මෙය කාන්තාවන්ට පමණක් විශේෂිත වූ තත්ත්වයක් නොවේ. (ෆ්ලෙෂෙන්බර්ග් 2008) අනෙක් අතට දේශපාලනයේ පවුල් සබඳතා නොමැති කාන්තාවන්ට ක්ෂෙත්‍රයට පිවිසීමට අවස්ථාවක් උදා කර ගැනීම අතිශය දුෂ්කර වී තිබේ. (බාසු 2003) මෙයට ජන වාර්ගික මානයක් ද තිබේ. කොඩිකාර පෙන්වා දෙන පරිදි (2012), ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන නියෝජනය කරන සිංහල ජාතික කාන්තාවන් සුළු ජාතික කාන්තාවනට වඩා බෙහෙවින් වැඩිය. කෙසේ නමුත් 2008-2011 කාල වකාවනුවේදී දෙමළ සහ මුස්ලිම් බහුතර ප්‍රදේශවල පැවැති මැතිවරණවලින් පසුව මෙම අනුපාතය යම් දුරකට වෙනස් වී තිබේ.

**කෝටා ක්‍රමයේ ප්‍රතිලාභ තවදුරටත් තහවුරු කරගැනීමේදී සහ වැඩි නිත්‍ය නියෝජනයක් කරා ක්‍රමිකව ගමන් කිරීමේදී කෝටා ක්‍රමය ඔස්සේ පත්වූ කාන්තා දේශපාලනඥයින් සමග අඛණ්ඩව කටයුතු කිරීම අතිශයින් වැදගත් වේ**

පළාත් පාලනය කෙරෙහි අවධානය යොමුකිරීම, ඇතැම් කාන්තා කණ්ඩායම් ද්විත්ව ආන්තිකකරණයට ලක්වීමේ ගැටලුවට විසඳුමක් සොයා ගැනීමට අපට යම් ඉඩ ප්‍රකස්ථාවක් උදා කිරීමට හැකිය. ඉන්දියානු අත්දැකීමෙන් පෙන්නුම් කරන පරිදි, පළාත් පාලන දේශපාලන ක්ෂෙෂෙත්‍රයට ප්‍රවිශ්ඨ වීමට කාන්තාවන්ට හැකියාව ඇතිකරන දේ අතර කවර හෝ ආකාරයක පූර්ව ප්‍රාග්ධනයකට ඇත්තේ සාපේක්ෂව ඉතා අඩු වැදගත්කමක් වන අතර වඩා වැදගත් වනුයේ ප්‍රජා ක්‍රියාකාරකම් සහ සහයෝගිතා ජාල හරහා ප්‍රජාව හා එක්ව කටයුතු කිරීමයි. (බාසු 2003) තවද, ජාතික මට්ටමට වඩා පළාත් පාලන මට්ටම සත්‍ය ලෙසම හා චිත්තවේගීව කාන්තාවන්ට වඩා සමීප බැවින්, පළාත් පාලන මට්ටමේ තීරණ ගැනීමේ නියැළීමේ අදහස ඔවුන් වඩා ආකර්ෂණීය වනු ඇත.

මෙම යථාර්ථයන් හමුවේ, පළාත් පාලන මට්ටමේදී කාන්තාවන් සඳහා කෝටා ක්‍රමයක් හඳුන්වාදීම කෙරෙහි වූ ක්‍රියාමාර්ගය නිවැරැදි දිශාවට තැබූ පියවරක් ලෙස අගය කළ යුතුය. කෙසේ වෙතත්, සිදුකළ යුතු තවත් බොහෝ දෑ තිබේ. මෙම වාර්තාව මගින් පැහැදිළි කිරීමට ප්‍රයත්න දරන පරිදි, කෝටා ක්‍රමයේ ප්‍රතිලාභ තවදුරටත් තහවුරු කරගැනීමේදී සහ වැඩි නිත්‍ය නියෝජනයක් කරා ක්‍රමිකව ගමන් කිරීමේදී කෝටා ක්‍රමය ඔස්සේ පත්වූ කාන්තා දේශපාලනඥයින් සමග අඛණ්ඩව කටයුතු කිරීම අතිශයින් වැදගත් වේ.

# ක්‍රමවේදය

මෙම අධ්‍යයනය මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය උපයෝගී කර ගත් අතර උතුර, නැගෙනහිර, වයඹ, මධ්‍යම, ඌව සහ දකුණ යන පළාත් හය තුළ පවත්වනු ලැබීය. ක්‍රමවේද දෙකම යටතේ සහ ක්ෂේත්‍ර පිහිටීම් මගින් ලබාගත් නියැදිවල, නාමයෝජනා ලබාගැනීමට සමත්වූ, ආසනයක් දිනා ගැනීමට හැකි වූ සහ නාම යෝජනා ලබා ගැනීමට අසමත් වූ අපේක්ෂිකාවන් ද ඇතුලත් කිරීම කෙරෙහි විශේෂයෙන්ම සැලකිලිමත් වන ලදී. එක් පළාතකින් එක් දිස්ත්‍රික්කයක් තෝරා ගෙන ගුණාත්මක සම්මුඛ සාකච්ඡා 10-15ක් පමණ (තනි පුද්ගල සහ කණ්ඩායම් යන දෙකම) පවත්වනු ලැබීය. ගුණාත්මක ක්ෂේත්‍ර පිහිටුම තෝරාගැනීමේ මූලික නිර්ණායකය වූයේ ප්‍රවේශ්‍යතාව වන අතර එබැවින් කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය තම පාර්ශවකාර සංවිධානයන්ට වඩා වැඩි ප්‍රවේශයක් සහිත පිහිටීම් තෝරා ගන්නා ලදී. මෙම සම්මුඛ සාකච්ඡාවන්, දේශපාලනයට පිවිසීමෙන් පසු මහජන නියෝජිතයකු ලෙස සහ පුද්ගලික කටයුතුවලදී ප්‍රතිචාර දැක්වූවන්ගේ ජීවන අත්දැකීම් වාර්තා කිරීමට කටයුතු කරන ලදී.

ඊට අමතරව, කාන්තා දේශපාලනඥයන්ගේ පුළුල් අත්දැකීම් විමර්ශනය කිරීමට, තරඟ කිරීමේදී සහ ලැයිස්තුවලට නම් ඇතුලත් කරගැනීමේදී සහ/හෝ තේරී පත්වීමෙන් පසු සිය රාජකාරි ඉටුකිරීමේදී ඔවුන් මුහුණ දෙන නිශ්චිත ගැටලු සහ අභියෝග අවබෝධ කරගැනීම පිණිස සමීක්ෂණය යොදා ගන්නා ලදී. ඒ සඳහා ඉහත සඳහන් පළාත්වල දිස්ත්‍රික්ක 13ක පැවැත්වූ සම්මුඛ සාකච්ඡා 750 ක් පවත්වනු ලැබීය. ගුණාත්මක නියැදි දිස්ත්‍රික්ක හා ජනවර්ගය අනුව වෙන් කොට දැක්වීම පහත වගුවලින් නිරූපණය වේ.

| දිස්ත්‍රික්කය | % |
|---|---|
| කුරුණෑගල | 20.1 |
| බදුල්ල | 20.0 |
| ගාල්ල | 19.9 |
| මුලතිව් | 8.0 |
| ත්‍රිකුණාමලය | 6.5 |
| යාපනය | 1.2 |
| කිලිනොච්චි | 4.1 |
| නුවරඑළිය | 11.3 |
| මහනුවර | 2.5 |
| කෑගල්ල | 0.1 |
| මාතලේ | 2.9 |
| අම්පාර | 3.1 |
| මඩකලපුව | 0.1 |
| මූලය | 750 |

| ජන වර්ගය | % |
|---|---|
| සිංහල | 59.6 |
| දෙමළ | 37.2 |
| මුස්ලිම් | 3.2 |
| මූලය | 750 |

# අනාවරණ

මෙම අධ්‍යයනයේ අනාවරණ 2018 පෙබරවාරි මස පැවැති පළාත් පාලන මැතිවරණයට තරග කළ කාන්තා දේශපාලනඥයන්ගේ පසුබිම පිළිබඳ ප්‍රබල අන්තර්දෘෂ්ඨියක් සපයයි.. දත්ත පමණක් ඉදිරිපත් කිරීමෙන් නොනැවතී,දේශපාලන නියෝජිතයන්ගේ භූමිකාව, දේශපාලන පක්ෂ ක්‍රියාකාරීත්වය සහ දේශපාලන පක්ෂවල මැතිවරණ මෙහෙයුම පිළිබඳව වත්මනෙහි පවතින පුළුල් දේශපාලන සංවාදය පිළිබඳව දත්ත මගින් කරුණු දැක්වීමට උත්සාහයක් දරා තිබේ. විශ්ලේෂණයේ වඩා පෘථුල ව්‍යුහය තුළ කාන්තා දේශපාලනඥයන්ගේ පවුල් පසුබිම, පක්ෂය තුළ හිමි ස්ථානය, ආර්ථික ධාරිතාවය, දේශපාලන දැනුම ආදී විවිධ තත්ත්වයන් දේශපාලන ගමන් මගේ ඉදිරියට යාමට ඔවුනට ඇති හැකියාව කෙරෙහි බලපාන්නේ කෙසේද යන්න මෙම අධ්‍යයනය විමසා බලන ලදී. මෙම අධ්‍යයනයට සහභාගි වූ කාන්තා දේශපාලකවරියන් වර්ග හතරකට කාණ්ඩ කළ හැක. 1) කොට්ඨාශවලට තරග කොට ජයග්‍රහණය කළ අය 2) කොට්ඨාශවලට තරග කොට පරාජයට පත්වූ අය 3) ලැයිස්තුවෙන් තෝරා පත්කර ගැනීමේදී සාර්ථක වූ අය 4) ලැයිස්තුවෙන් තෝරා පත්කර ගැනීමේදී අසාර්ථක වූ අය (ලැයිස්තුවේ සිටි නමුත් පක්ෂයට ලැබුණු අඩු ඡන්ද සංඛ්‍යාව හේතුවෙන් තම අදාළ ප.පා.ආයතනයට තේරී පත්වීමට නොහැකි වූවන්)[6]. මෙම අධ්‍යයනයේ මූලික ඉලක්කය වූයේ එක් එක් වර්ගයේ අපේක්ෂකයන්ගේ පැතිකඩ අවබෝධ කර ගනු පිණිස මෙම කාණ්ඩ හතරේ කාන්තා දේශපාලනඥයන්ගේ පසුබිම් සාධකවලට අදාළව ඔවුන් පිළිබඳව කරුණු සොයා බැලීමයි. තම අරමුණ කරා ගමන් කිරීමට උත්සාහ දැරීමේදී, පවත්නා ව්‍යුහයන්ට සහ සැකසුම්වලට කාන්තා දේහපාලනඥයන් කෙතරම් දුරට අනුකූල වන්නේ ද හා අභියෝග කරන්නේ ද යන්න අවබෝධ කරගැනීමේදී මෙම හඳුනාගැනීම වැදගත් වේ.

**මෙම අධ්‍යයනයට සහභාගි වූ කාන්තා දේශපාලකවරියන් වර්ග හතරකට කාණ්ඩ කළ හැකි**
**1) කොට්ඨාශවලට තරග කොට ජයග්‍රහණය කළ අය**
**2) කොට්ඨාශවලට තරග කොට පරාජයට පත්වූ අය**
**3) ලැයිස්තුවෙන් තෝරා පත්කර ගැනීමේදී සාර්ථක වූ අය**
**4) ලැයිස්තුවෙන් තෝරා පත්කර ගැනීමේදී අසාර්ථක වූ අය වශයෙනි.**

*6 අතිරේක අපේක්ෂක ලැයිස්තුවේ ඇතුලත් කරනු ලැබූ කාන්තාවන් කිසිදු කොට්ඨාශයක් තරග කිරීම අපේක්ෂා නොකළ නමුත්, කොට්ඨාශ මට්ටමින් තරග කළ අය මැතිවරණ කටයුතුවල නියැළීමට අපේක්ෂා කළ කොට්ඨාශයේ කුඩා බල ප්‍රදේශයට සාපේක්ෂව□ මුළු මැතිවරණ දිස්ත්‍රික්කය පුරා පක්ෂයේ දේශාපාලන වැඩසටහනට සහභාගිවීමට ඔවුනට සිදු වියි*

# දේශපාලන පක්ෂය හා කාන්තා නියෝජනය

ව්‍යවස්ථාදායක සභාවක ස්ථානයක් සඳහා තරඟ කිරීම පිණිස යමෙකුට දේශපාලන පක්ෂයක් හරහා පැමිණීමට අවශ්‍ය නොවේ. 1931 වසරේ සිටම බොහෝ දෙනෙකු ස්වාධීන අපේක්ෂකයන් ලෙස තරග කර තිබේ.නමුත් 1970 දශකයේ සිට, දේශපාලන පක්ෂවල පදනම පුළුල් වීමේ පසුබිම තුළ, ස්වාධීන අපේක්ෂකයන් ලෙස තරග කර - සහ වඩාත් වැදගත් ලෙස ජයප්‍රහණය කළ අය- සැලකිය යුතු ලෙස පහත වැටී තිබේ. (වුඩ්වර්ඩ් 1975 : පීරිස් 2014) එබැවින්, මෑතක සිට මැතිවරණයක් තරග කර ජයග්‍රහණය කිරීමට අපේක්ෂා කරන අය ප්‍රධාන දේශපාලන පක්ෂයකින් තරග වැද තිබේ. සමානුපාතික නියෝජන ක්‍රමය තනි පුද්ගල දේශපාලනඥයන්ට/ නියෝජිතයන්ට සාපේක්ෂව පක්ෂයේ තත්ත්වය සහ එහි නායකත්වය තවදුරටත් ශක්තිමත් කර තිබේ.

දේශපාලනඥයින් වීමට අදහස් කරන කාන්තාවන් අපේක්ෂකත්වය සහ අනතුරුව ජයග්‍රහණය සඳහා තම පක්ෂ සංවිධානය සහ එහි ජාතික සහ ප්‍රාදේශිය නායකත්වය මත විශාල වශයෙන් රැඳා පවතියි. එබැවින්, පළාත් පාලන ආයතනවලට 25 ක කාන්තා නියෝජනයක් මෑතකදී හඳුන්වාදීම තිබියදී වුවද, දේශපාලනයේ කාන්තා නියෝජනය ඉහළ නැංවීම පිණිස දේශපාලන පක්ෂ අත්හළ නොහැකි සාධකයක් වී තිබේ. මෙම පසුබිම තුළ, කාන්තා නියෝජනය ඉහළ නැංවීමේ අභියෝගය පිළිබඳව වන කවර හෝ සාකච්ඡාවක්, ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂවල වත්මන් ස්වරූපය සහ ක්‍රියාකාරිත්වය සැලකිල්ලට ගත යුතුය.

**කාන්තා දේශපාලනඥයකුට තම පළාත් පාලන ආයතනයේ සභිකයකු වීමට ඇති හැකියාව ඉහළ නැංවීමේ හැකියාව පිළිබඳව වන කවර හෝ සාකච්ඡාවක්, ඇගේ පුද්ගලික දේශපාලන අත්දැකීම් මගින් තීරණය කරනු නොලබයි.**

ඒ අනුව බැලූ විට, කොට්ඨාශ හෝ දිස්ත්‍රික්ක මට්ටමින් නාමායෝජනා ලබා ගැනීමේදී, දේශපාලනය තුළ අතීත අත්දැකීම් හෝ ඒ සම්බන්ධයෙන් පෙන්නුම් කර ඇති දැනුම ප්‍රධාන නිර්ණායකයක් නොවන බව සමීක්ෂණයේ අනාවරණ පෙන්නුම් කරයි. 01 වන වගුවේ පෙන්නුම් කර ඇති පරිදි, මැතිවරණය තරග කර ජයග්‍රහණය කළ අය අතර, එකිනෙකට වෙනස් අවුරුදු ගණනාවක දේශපාලන අත්දැකීම් සහිත කාන්තා දේශපාලනඥයන් වේ. කොට්ඨාශ තරග කර පරාජයට පත්වූවන් අතර, 42කට දේශපාලනයේ වසර 10කට වැඩි අත්දැකීම් තිබූ අතර ඉතිරි අයට තිබුයේ ඊට අඩු කාලයක අත්දැකීම්ය. තම තමන්ගේ පක්ෂ ලැයිස්තුවලින් 2018 පළාත් පාලන මැතිවරණයට තරග කළ කාන්තා දේශපාලනඥයන් අතර ද මෙම රටාව දක්නට ලැබුණි මෙම සංඛ්‍යා පෙන්නුම් කරනුයේ යම් පුද්ගලයකුගේ දේශපාලන අත්දැකීම් මැතිවරණවලදී සාර්ථක වීමට ඇති හැකියාව කෙරෙහි ඇති කරනුයේ එක්තරා ප්‍රමාණයක බලපෑමක් පමණක් බවයි. සැලකිල්ලට ලක්විය යුතු කරුණක් වනුයේ පිරිමි අපේක්ෂකයන් අතර ද මෙම ප්‍රවණතාව දක්නට ලැබීමයි. (පීරිස් 2014) සමානුපාතික නියෝජන ක්‍රමය අනුබල දෙන පක්ෂ අභ්‍යන්තරයේ දැඩි තරඟකාරිත්වය, සම්ප්‍රදායික පළාත් පාලන මට්ටමේ දේශපාලනය, දේශපාලනයට සාපේක්ෂව නවක අයෙකුට ප්‍රාන්තදේශීය දේශපාලන නායකත්වයට පත්වීමේ වැඩි හැකියාවක් සහිතව පහසුවෙන් බිඳිය හැකි දැඩි තරගකාරී එකක් බවට පත් කර ඇත්තේ කෙසේද යන්න පීරිස් (2014) පැහැදිළි කරයි. කාන්තා දේශපාලනඥයන් අතර පවා මෙම සංසිද්ධිය පවත්නා බව මෙම අධ්‍යයනයේ සමීක්ෂණ ප්‍රතිඵල තහවුරු කරයි.

**වගුව 1 - අපේක්ෂක වර්ගය අනුව දේශපාලන අත්දැකීම් වසර ගණන**

| | අපේක්ෂක කාණ්ඩය (%) | | | |
|---|---|---|---|---|
| | තරඟ කර ජයග්‍රහණය කළ | තරඟ කර පරාජය වූ | ලැයිස්තුවෙන් ජයග්‍රහණය කළ | ලැයිස්තුවෙන් පරාජයට පත් වූ |
| අවු 1 සිට 5 | 29.0 | 43.3 | 27.9 | 42.6 |
| අවු 6 සිට 10 | 16.6 | 14.6 | 23.0 | 15.6 |
| අවු 11 සිට 20 | 24.8 | 22.3 | 20.6 | 16.8 |
| අවු 20ට වැඩි | 29.7 | 19.7 | 28.5 | 25.0 |
| මූලය | 145 | 157 | 165 | 244 |

**සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ දේශපාලනයට සාපේක්ෂව නවකයකු වන අයෙකුට පළාත් පාලන දේශපාලන නියෝජිතයකු වීමේ වැඩි විභවයක් තිබේ**

සමීක්ෂණයේ අනාවරණයන්ට අනුව, දේශපාලනයේ අත්දැකීම් සහ කාන්තා දේශපාලනඥයින් තේරී පත්වීමට ඇති හැකියාව අතර ප්‍රබල සහසම්බන්ධතාවයක් නොමැතිවාක් මෙන්ම පක්ෂයේ ඔවුන් ගත කළ කාලය සහ ඔවුන්ගේ තේරී පත්වීමේ හැකියාව අතර ද ශක්තිමත් සබඳතාවයන් නොමැත. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් තරඟ කළ කාන්තාවන් අතර මෙම සංසිද්ධිය පැහැදිළිව දක්නට ලැබුණි. අධ්‍යයනයට සහභාගි වූ කාන්තා දේශපාලනඥයින් බහුතරයකට, 2018 පළාත් පාලන මැතිවරණයට ඔවුන් තරඟ කළ පක්ෂය (හෝ ඔවුන් ලැයිස්තුවට ඇතුළත් කළ පක්ෂය) සමග තිබුයේ වසර එකේ සිට පහ දක්වා වු අත්දැකීම්ය. (02 වන වගුව බලන්න) සමීක්ෂණයට සහභාගිවූවන් අහඹු ලෙස තෝරා නොගත් බැවින් මෙය ඇත්තෙන්ම සාමාන්‍යකරණීය කළ හැකි ලස්තුතයක් නොවේ. කෙසේ වෙතත්, මෙවැනි රටාවක් පැවැතීම කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම යෝග්‍ය වේ. තරඟ කොට ජයග්‍රහණය කළ අඩකට වැඩි පිරිසක් පවසා සිටියේ තමන්ට පක්ෂය සමග තිබුණේ වසර එකේ සිට පහ දක්වා අත්දැකීම් බවයි. එපරිද්දෙන්ම, තම පළාත් පාලන ආයතනවලට ලැයිස්තු මගින් තේරී පත්වූ ඒ හා සමාන පිරිසක් පවසා සිටියේ තමන්ට පක්ෂය සමග තිබුණේ වසර එකේ සිට පහ දක්වා අත්දැකීම් පමණක් වන බවයි. සමීක්ෂණයේ අනාවරණයන්ට අනුව, තරඟ කොට ජයග්‍රහණය කළ, එහෙත් පක්ෂය සමග වසර එකේ සිට පහ දක්වා පමණක් අත්දැකීම් තිබූ කාන්තාවන් අතුරින් බහුතරයකට (62) අතීතියේ හෝ වර්තමානයේ දේශපාලනයේ නියැළි හෝ නියැළෙන පවුලේ සාමජිකයන් නොවීය. එබැවින්, 2018 පළාත් පාලන මැතිවරණයේදි හඳුන්වා දුන් කාන්තාවන් සඳහා කෝටාව, එම කාන්තාවන් තරඟ කළ පක්ෂවලට නවකයන් වූ කාන්තා දේශපාලනඥයන් පිරිසක් ආකර්ෂණය කර ඇති බව පෙන්නුම් කරයි. තම පක්ෂවලින් ඉදිරිපත් කළ ලැයිස්තු හරහා පළාත් පාලන ආයතනවලට තේරී පත්වීමට හැකි වූ කාන්තා දේශපාලනඥයන් අතර ද එම රටාවම නිරීක්ෂණය කළ හැක.

**සමීක්ෂණයේ අනාවරණයන්ට අනුව දේශපාලනයේ අත්දැකීම් සහ කාන්තා දේශපාලනඥයින් තේරී පත්වීමට ඇති හැකියාව අතර ප්‍රබල සහසම්බන්ධතාවයක් නොමැතිවාක් මෙන්ම පක්ෂයේ ඔවුන් ගත කළ කාලය සහ ඔවුන්ගේ තේරී පත්වීමට ඇති හැකියාව අතර ද ශක්තිමත් සබඳතාවයක් නොමැති**

**වගුව 2 - අපේක්ෂක වර්ගය අනුව පක්ෂය තුළ දේශපාලන අත්දැකීම් වසර ගණන**

| | අපේක්ෂක කාණ්ඩය (%) | | | |
|---|---|---|---|---|
| | තරඟ කර ජයග්‍රහණය කළ | තරඟ කර පරාජය වූ | ලැයිස්තුවෙන් ජයග්‍රහණය කළ | ලැයිස්තුවෙන් පරාජයට පත් වූ |
| අවු 1 සිට 5 | 55.2 | 47.8 | 53.3 | 56.1 |
| අවු 6 සිට 10 | 9.0 | 15.3 | 17.6 | 11.5 |
| අවු 11 සිට 20 | 15.9 | 19.7 | 9.7 | 14.3 |
| අවු 20ට වැඩි | 20.0 | 17.2 | 19.4 | 18.0 |
| මූලය | 145 | 157 | 165 | 244 |

දේශපාලනයේ සහ පක්ෂ කටයුතුවල දිගු ඉතිහාසයක් නොමැති කාන්තාවන් වෘත්තීය දේශපාලනයට පිවිසීම යන කරුණ, දේශපාලනයේ කාන්තා නියෝජනය ඉහළ නැංවීමට අදාළව ධනාත්මක මෙන්ම සෘණාත්මක වර්ධනයක් සේ දැකිය හැකිය. 2018 පළාත් පාලන මැතිවරණයේදී, හුදෙක්ම 25% අවශ්‍යතාවය සපුරාලීම පිණිස ඇතැම් ආසන සඳහා කාන්තාවන් නම් කිරීමට දේශපාලන පක්ෂවලට බල කෙරුණි ඇතැම් ප්‍රාදේශීය දේශපාලන පක්ෂ සංවිධායකයන්ට අනුව, නියම කර ඇති සංඛ්‍යා සපුරාලීම පිණිස සාර්ථක අපේක්ෂකයන් විය හැකි කාන්තාවන් සොයා ගැනීමට ඔවුනට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුව තිබේ. එම මැතිවරණයේදී, දේශපාලනයේ සහ පක්ෂ කටයුතුවල අඩු පලපුරුද්දක් ඇති බොහෝ කාන්තාවන්ට පළාත් පාලන ආයතනවලට පිවිසීමට හැකිවූයේ කෙසේද යන්න මින් යම් දුරකට පැහැදිළි කරයි. කාන්තා දේශපාලනඥයන් සඳහා ඇතිවූ හදිසි ඉල්ලුම, පක්ෂවල නිලතල දරන පිරිමින්ට තමන්ගේම තේරීම්- බිරිඳ, ඥාතීන් සහ ඔවුනට හිතවත් අය- අපේක්ෂකයන් ලෙස නම් කිරීමට අවස්ථාව උදා කළ අතර එමගින් පක්ෂ සාමාජිකයන් අතර මෙන්ම තම මැතිවරණ කොට්ඨාශය තුළ සිය බලය තහවුරු කරගැනීමට ඔවුන්ට හැකි විය[7]. අඩු දේශපාලන අත්දැකීම් සහ පක්ෂ ඉතිහාසයක් ඇති කාන්තාවන් වෘත්තීය දේශපාලනයට පිවිසීමේ ප්‍රණතාව පිළිබඳව යමෙකු උවමනාවට වඩා විවේචනය නොකළ යුත්තේ, එය ප්‍රාදේශීය මට්ටමේ පිරිමි දේශපාලනඥයන්ගෙන් සම්බන්ධයෙන් ද එතරම් වෙනස් නොවන බැවිනි.

**දේශපාලනයේ සහ පක්ෂ කටයුතුවල දිගු ඉතිහාසයක් නොමැති කාන්තාවන් වෘත්තීය දේශපාලනයට පිවිසීම යන කරුණ□ දේශපාලනයේ කාන්තා නියෝජනය ඉහළ නැංවීමට අදාළව ධනාත්මක මෙන්ම සෘණාත්මක වශයෙන් බලපාන්නක් සේ දැකිය හැකියි**

*7 බදුල්ලේ සහ කුරුණෑගල පැවැති සම්මුඛ සාකච්ඡා සහ කණ්ඩායම් සාකච්ඡාවන්හිදී මෙම කරුණ අනාවරණය විය.*

# දැනුම වාසියක් ගෙන දෙයි

මැතිවරණ දේශපාලනය තුළ පිරිමින් හා තරග කිරීමේදී කාන්තාවන් පසුගාමී වේ. ශ්‍රී ලංකා මැතිවරණ දේශපාලනයේ සුලබ ලක්ෂණ වන මැතිවරණ ප්‍රචණ්ඩත්වය හා දූෂණය මෙන්ම සංස්කෘතික සම්මත වැනි සාධක දේශපාලනයට පිවිසීමට අදහස් කරන කාන්තාවන්ගේ අභිලාෂයන්ට එරෙහි වේ. කණ්ඩායම් සාකච්ඡාවකදී, පුරුෂ ආධිපත්‍ය සහිත ප්‍රාදේශීය මට්ටමේ දේශපාලන සංවිධාන තුළ තම බලපෑම ඇතිකරන්නේ කවරකින්යැයි ඔවුන් සිතන්නේද යන්න කතෘවරිය ප්‍රාතදේශීය මටටමේ දේශපාලනඥවරියන්ගෙන් විමසීය. ප්‍රාදේශීය මට්ටමේ පක්ෂ සංවිධාන තුළ සිය පුද්ගලික අත්දැකීම් බෙදා ගනිමින්, කාන්තා දේශපාලන ක්‍රියාකාරින් කිහිප දෙනෙකු පවසා සිටියේ ප්‍රතිපත්ති, නීති සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ කරුණු ගැන ඔවුන් පෙන්නුම් කළහොත්, ඔවුන්ගේ සහෝදර පිරිමි දේශපාලනඥයන්ගේ අවධානය ඔවුන් වෙත යොමුවන බවයි.

**කාන්තා දේශපාලන ක්‍රියාකාරීන් කිහිප දෙනෙකු පවසා සිටියේ ප්‍රතිපත්ති, නීති සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ කරුණු ගැන ඔවුන්ගේ දැනුවත්බව පෙන්නුම් කළහොත් ඔවුන්ගේ සහෝදර පිරිමි දේශපාලනඥයන්ගේ අවධානය ඔවුන් වෙත යොමුවන බවයි**

මෙම සමීක්ෂණයේදී, ප්‍රාදේශීය මට්ටමේ කාන්තා දේශපාලනඥයන්ගේ දේශපාලන දැනුම සහ ඔවුන්ගේ තේරී පත්වීමේ හැකියාව අතර සබඳතාව විමර්ශනය කිරීමට උත්සාහ දරන ලදී. අධ්‍යයනයේදී ස) පළාත් පාලන ආයතන පාලනය වන නීති සස) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සසස) ඔවුන් නියෝජනය කරන දේශපාලන පක්ෂයේ මතවාදය, සහ සඩ) රටේ ඉතිහාසය පිළිබඳ ඔවුනට තිබෙන්නේ යැයි ඔවුන් සිතන ඔවුන්ගේ විෂයමූලික දැනුම පිළිබඳ විමසන ලදී. කාන්තා දේශපාලනඥයන්ගේ දේශපාලන දැනුම සහ ඔවුන්ගේ තේරී පත්වීමේ හැකියාව අතර සාධනීය සහසබඳතාවක් පවතින බව පර්යේෂණයේ අනාවරණයන්ගෙන් හෙළිදරව් විය. තරග කොට ජයග්‍රහණය කළ බොහෝ දෙනෙකු විශ්වාස කළේ පළාත් පාලන ආයතන පාලනය පිළිබඳ නීති පිළිබඳව තරග කොට පරාජය පත්වූවන්ට වඩා දැනුමත් තමන් සතු බවයි. පොදුවේ ගත් කළ ලැයිස්තුවලින් තරග වැදුණු අය පළාත් පාලන නීති පිළිබඳ ඔවුන් එතරම් දැනුවත් යැයි විශ්වාස නොකරන ලදී.

**කාන්තා දේශපාලනඥයන්ගේ දේශපාලන දැනුම සහ ඔවුන්ගේ තේරී පත්වීමේ හැකියාව අතර සාධනීය සහසබඳතාවක් පවතින බව පර්යේෂණයේ අනාවරණයන්ගෙන් හෙළිදරව් වියි**

**වගුව 3 - අපේක්ෂක වර්ගය අනුව පළාත් පාලන ආයතන පාලනය කරන්නා වූ නීති පිළිබඳ දැනුම**

| නීති පිළිබඳ දැනුම | අපේක්ෂක කාණ්ඩය(%) | | | |
|---|---|---|---|---|
| | තරඟ කර ජයග්‍රහණය කළ | තරඟ කර පරාජය වූ | ලැයිස්තුවෙන් ජයග්‍රහණය කළ | ලැයිස්තුවෙන් පරාජයට පත් වූ |
| ඉතා දැනුවත්ය | 23.4 | 9.6 | 12.7 | 11.9 |
| තරමක් දැනුවත්ය | 62.1 | 68.2 | 70.3 | 66.4 |
| සුළු දැනුමක් ඇත | 14.5 | 19.1 | 16.4 | 17.2 |
| කිසිදු දැනුමක් නොමැත | 0.0 | 3.2 | 0.6 | 4.5 |

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන ඔවුන්ගේ දැනුමද මේ හා සමාන විය. ඒ සම්බන්ධයෙන් මනා දැනුමක් ඇතැයි පවසා සිටි අයගෙන් වැඩිම ප්‍රතිශතයක් (21.4%) වාර්තා කරන ලද්දේ තරඟ කොට ජයග්‍රහණය කළ අයයි. තමන් හොඳින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අධ්‍යයනය කළ බව පවසා සිටියේ මැතිවරණයට තරඟ කොට පරාජයට පත්වූ කාන්තාවන්ගෙන් සාපේක්ෂව අඩු ප්‍රතිශතයකි.. පොදුවේ ගත් කළ, ලැයිස්තුවෙන් තරඟ කළ කාන්තාවන් බහුතරයක් තමන් හොඳින්ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අධ්‍යයනය කළ බව පවසා නොසිටියේය.

ප්‍රතිචාර දැක්වූ කාණ්ඩ හතරෙහිම අය පවසා සිටියේ තම පක්ෂයේ මතවාදය පිළිබඳව තමන් හොඳින් දැනුවත් හෝ තරමක් දැනුවත් බව වන අතර එහිදී අදාළ සමුච්චිත ප්‍රතිශතයන්ගේ විශාල විචලයයන් නොතිබුණි රටේ ඉතිහාසය සහ තම දේශපාලන පක්ෂයේ ඉතිහාසය පිළිබඳව ඔවුන්ගේ දැනුම සම්බන්ධයෙන් ද සමාන රටාවක් දිස් විය. කෙසේ වෙතත්, මෙහිදී අවධාරණය කළ යුත්තේ මේ සියලු කරුණුවලට අදාළ දැනුම සම්බන්ධයෙන් ඉහළම ප්‍රතිශතයක් වාර්තා කළේ තරඟ කොට ජයග්‍රහණය කළ අය බවයි.

අපේක්ෂකයන්ගේ දැනුම ලෙස මේ දක්වා සාකච්ඡා කර ඇත්තේ සත්‍ය ලෙසම ඔවුන්ගේ දැනුම පිළිබඳව ඔවුන්ගේම ඇගයීමයි. එබැවින්, තේරී පත්වීමේ හැකියාව කෙරෙහි දේශපාලනය පිළිබඳ ඔවුන්ගේ සැබෑ දැනුමේ බලපෑම අනුමාන කිරීම අසීරු වේ. කෙසේ වෙතත්, කුරුණෑගල සහ බදුල්ලෙහි කාන්තා දේශපාලනඥයින් සමග පැවැත්වූ සාකච්ඡාවලදී, කර්තෘවරයා නිරීක්ෂණය කළේ දේශපාලනය පිළිබඳ දැනුමක් ඇතැයි පැවැසූ කාන්තාවන් බොහෝ විට දේශපාලනය පිළිබඳ අන් අයට වඩා ඉහළ දැනුවත්බවක් පෙන්නුම් කළ බවයි. මෙයින් පෙන්නුම් කරනුයේ දේශපාලන අත්දැකීම් සහ දැනුම හැර අනෙකුත් සාධක මැතිවරණ ජයග්‍රහහණය කිරීමේ අපේක්ෂකයන්ගේ හැකියාව කෙරෙහි දායක වන්නට ඇති බවයි. එබැවින් ණී ඔවුන්ගේ දැනුම සහ දේශපාලන නිරාවරණය ඉහළ නැංවීම සඳහා වන කවර හෝ ප්‍රවයත්නයක්, පීතෘ මූලික දේශපාලන පද්ධතිය තුළ පවතින බාධක ජයගනිමින් ඉදිරියට යාමට පමණක් නොව වඩා යහපත් දේශපාලනඥයන් වීමට ඔවුන් සවිබල ගන්වනු ඇත. එබඳු පුහුණුවක්, කෝටා ක්‍රමය හඳුන්වාදීම හේතුවෙන් කාන්තාවන් භුක්ති විඳින සැලකිය යුතු දේශපාලන ජයග්‍රහණය තිරසරව පවත්වා ගැනීම කෙරෙහි දායක වනු ඇත. තවද, එවැනි දැනුම පාදක පුහුණුවක්, යම් කණ්ඩායම් නියෝජනයකට අමතරව කාන්තාවන්ගේ නිත්‍යත නියෝජනය ඉහළ නැංවීමට දායක වනු ඇත.

**වගුව 4 - අපේක්ෂක වර්ගය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ දැනුම**

| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ දැනුම | **අපේක්ෂක කාණ්ඩය(%)** | | | |
|---|---|---|---|---|
| | **තරඟ කර ජයග්‍රහණය කළ** | **තරඟ කර පරාජය වූ** | **ලැයිස්තුවෙන් ජයග්‍රහණය කළ** | **ලැයිස්තුවෙන් පරාජයට පත් වූ** |
| මැනවින් අධ්‍යයනය කර ඇත | 21.4 | 8.3 | 9.7 | 7.8 |
| යම් දුරකට අධ්‍යයනය කර ඇත | 43.4 | 43.3 | 45.5 | 43.9 |
| අධ්‍යයනය කර නොමැති නමුත් ඇතැම් කොටස් ගැන යම් දැනුමක් ඇත | 22.1 | 37.6 | 29.1 | 36.1 |
| ඒ පිළිබඳ කිසිදු දැනුමක් නොමැත | 12.4 | 10.2 | 15.2 | 11.5 |
| Don’t know | 0.7 | 0.6 | 0.6 | 0.8 |

**වගුව 5 - අපේක්ෂක වර්ගය අනුව පක්ෂ මතවාදය පිළිබඳ දැනුම**

| පක්ෂ මතවාදය පිළිබඳ දැනුම | අපේක්ෂක කාණ්ඩය(%) | | | |
|---|---|---|---|---|
| | තරඟ කර ජයග්‍රහණය කළ | තරඟ කර පරාජය වූ | ලැයිස්තුවෙන් ජයග්‍රහණය කළ | ලැයිස්තුවෙන් පරාජයට පත් වූ |
| ඉතා දැනුවත්ය | 40.7 | 18.6 | 20.6 | 20.7 |
| තරමක් දැනුවත්ය | 48.3 | 68.6 | 68.5 | 67.8 |
| සුළු දැනුමක් ඇත | 10.3 | 12.2 | 10.3 | 10.7 |
| කිසිදු දැනුමක් නොමැත | 0.7 | 0.6 | 0.6 | 0.8 |

**වගුව 6 - අපේක්ෂක වර්ගය අනුව රටේ ඉතිහාසය පිළිබඳ දැනුම**

| පක්ෂ මතවාදය පිළිබඳ දැනුම | අපේක්ෂක කාණ්ඩය(%) | | | |
|---|---|---|---|---|
| | තරඟ කර ජයග්‍රහණය කළ | තරඟ කර පරාජය වූ | ලැයිස්තුවෙන් ජයග්‍රහණය කළ | ලැයිස්තුවෙන් පරාජයට පත් වූ |
| ඉතා දැනුවත්ය | 33.8 | 17.8 | 15.2 | 16.9 |
| තරමක් දැනුවත්ය | 53.8 | 70.7 | 69.7 | 69.4 |
| සුළු දැනුමක් ඇත | 11.7 | 10.8 | 15.2 | 12.0 |
| කිසිදු දැනුමක් නොමැත | 0.7 | 0.6 | 0.0 | 1.7 |

**ඔවුන්ගේ දැනුම සහ දේශපාලන නිරාවරණය ඉහළ නැංවීම සඳහා වන කවර හෝ ප්‍රයත්නයක්, පුරුෂ මූලික දේශපාලන පද්ධතිය තුළ පවතින බාධක ජයගනිමින් ඉදිරියට යාමට පමණක් නොව වඩා යහපත් දේශපාලනඥයන් වීමට ඔවුන් සවිබල ගන්වනු ඇත.**

# කාන්තා දේශපාලනඥයින් සහ බල මූලාශ්‍ර

දේශපාලනය යනු බලයයි: බලය අල්ලා ගැනීම, පවත්වා ගැනීම සහ ප්‍රතිරෝධය දැක්වීමයි. දේශපාලනය රඟ දක්වනුයේ කවර වේදිකාව ද යන්න නොතකා, මැකියාවෙලි පැවසූ පරිදි එය හුදෙක්ම අරමුණු කරනුයේ "හොඳ" හෝ "හොඳ හැර අනෙකුත්" ක්‍රම මගින් බලය ලබා ගැනීම හා පවත්වා ගැනීමයි. මින් අදහස් කරනුයේ යමෙකුට (මෙහිදී නම් දේශපාලනඥයන්) අන් අයගේ තීරණ කෙරෙහි බලපෑම් කිරීමට හැකියාව තිබිය යුතු බවයි. ප්‍රාදේශීය මට්ටමේ දේශපාලනඥයන් තමන් අවට ප්‍රදේශයේ හෝ ගමේ බලපෑම් කළ හැකි ක්‍රියාධරයන් ලෙස ඉස්මතු වූයේ කෙසේදැයි ශ්‍රී ලංකාවේ ගමමාන පිළිබඳ අධයයන සහ දේශපාලන පක්ෂ බලමුළු ගැන්වීම පිළිබඳ අධ්‍යයන නිරූපණය කරයි. (ජිගින්ස් 1979, හෙට්ටිගේ 1984, ස්පෙන්සර් 1990, ජයන්ත 1992, පීරිස් 2018) එබඳු බලපෑමක් කිරීමට ඉවහල් වූ සාධක ලෙස ආර්ථික ශක්තිය, සංස්කෘතික පසුතලය තුළ භුක්ති විඳි තත්ත්වය, සහ ගම තුළ සහ ඉන් පිටත පුද්ගලයකු සතු තිරස් හා සිරස් සබඳතා ඔවුන් සියලු දෙනා සඳහන් කරයි. ප්‍රංශ සමාජ විද්‍යාඥයකු වූ පියරේ බෝඩියෝ සිය ලිපි මගින් තර්ක කරනුයේ ආර්ථික, සංස්කෘතික සහ සමාජ ප්‍රාග්ධනය යමෙකුගේ දේශපාලන බලය නිර්මාණය කිරීමේදී ඉතා තීරණාත්මක බවයි. (බෝඩියෝ 1977) පසුගිය වසර ගණනාව මුළුල්ලෙහි, ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ, මෙම ඇතැම් ආකාරයේ ප්‍රාග් ධනයන්ට ඒවායේ සුවිශේෂත්වය අහිමි වූ අතර අනෙක් ඒවාට බල මූලාශ්‍ර ලෙස නව ජවයක් ලැබුණි (පීරිස් 2018) උදාහරණයක් ලෙස, නිදහස ලබන අවස්ථාව වන විට ප්‍රමුඛ බල මූලාශ්‍ර වූ ආර්ථික ශක්තිය හා සංස්කෘතික තත්ත්වය වැනි සාධකවල වැදගත්කම ක්‍රමයෙන් හීන වී ගොස් ඇති අතර සමාජ සබඳතා නැතහොත් බෝඩියෝ සඳහන් කරනු ලැබූ පරිදි සමාජ ප්‍රාග්ධනය ප්‍රාදේශීය දේශපාලන ක්‍රියාධරයන් සඳහා වැදගත් බල මූලාශ්‍රහයක් ලෙස මතු වුණි. එක් බල මූලාශ්‍රයක් මගින් තවත් බල මූලාශ්‍රයක් ප්‍රතිස්ථාපනය වූ බවක් මින් කිසිසේත් අදහස් නොකෙරෙන නමුත්, එයින් පැවසෙනුයේ ඇතැම් සාධකවලට නව ජවයක් ලැබී ඇති බවත් අනෙක් මූලාශ්‍ර ආන්තික කාර්යභාරයක් පමණක් ඉටුකරන බවත්ය. කෙසේවෙතත්, මෙම බල මූලාශ්‍ර (ප්‍රාග්ධන) වෙනත් ආකාරයන්ට පරිවර්තනය කළ හැකි වේ. උදාහරණයක් ලෙස, ගම තුළ තම සමාජ තත්ත්වය ගොඩ නගා ගැනීම පිණිස හෝ ගමේ මිනිසුන් සමග මෙන්ම ප්‍රාදේශීය හා ජාතික නායකයන් සමග වඩා පුළුල් සමාජ ජාලා ගොඩ නගා ගැනීම පිණිස මිනිසුන්ට තම මූල්‍ය ශක්තිය යොදා ගැනීමට හැකිය. මෙම බල මූලාශ්‍ර සියල්ල ඒකරාශී කිරීම අවසානයේදී යමෙකු සතු දේශපාලන බලයේ මට්ටම තීරණය කරනු ඇත. කෙසේ වෙතත්. මෙබඳු අවස්ථාවකදී, දේශපාලන ක්‍රියාධරයා ඔහුගේ හෝ ඇයගේ බල තත්ත්වය අනෙකුත් තරඟකරුවන්ට සාපේක්ෂව වඩා ඉහළින් තබාගනු පිණිස සක්‍රීය භූමිකාවක් ඉටු කරයි.

**එවැනි පුහුණු කෝටා ක්‍රමය හඳුන්වාදීම නිසා කාන්තාවන් භුක්ති විඳින සැලකිය යුතු දේශපාලන ජයග්‍රහණය පවත්වා ගැනීමට දායක වනු ඇති**

මෙම සංදර්භය තුළ, කාන්තාවක් ද පිරිමියෙක් ද යන්න නොසලකා ප්‍රාදේශීය, ජාතික හෝ අන්තර්ජාතික යන කුමන හෝ මට්ටමක දේශපාලනයට පිවිසීමට අපේක්ෂා කරන කවරකු හෝ සතුව ආර්ථික, සංස්කෘතික හා සමාජ ප්‍රාග්ධනය මත ප්‍රමාණවත් පාලනයක් හෝ ඒ වෙත ප්‍රවේශයක් තිබිය යුතුය. ශ්‍රී ලංකාව බඳු පීතෘ මූලික සමාජයක පොදු කටයුතුවලදී පුරුෂ ආධිපත්‍යය පවතින අතර කාන්තාවන්ගේ කටයුතු පවලේ සහ නිවසේ කාර්යයන්ට සීමා වේ. (තම්බයියා 2003) එබැවින්, ඉහත කී නොයාකාර ප්‍රාග්ධනයන්ට අදාළව, පිරිමින්ට සාපේක්ෂව කාන්තාවන්, ඔවුන් ප්‍රභූ පවුලකින් පැමිණියහොත් හැර, නිරායාසයෙන්ම පසු ගාමී වේ. පළාත් පාලන ආයතනයන්ට පිවිසීමට දැරූ උත්සාහයේදී ඇතැම් කාන්තා දේශපාලනඥයන්ට සාර්ථක වීමට හැකිවූයේත් අනෙත් අය අසාර්ථක වූයේත් කවරක් නිසාද යන්න අවබෝධ කර ගැනීම පිණිස මෙම වාර්තාව ප්‍රාග්ධනයේ එම ස්වරූප තුනෙහි කාව යොදා ගනියි.

# මූල්‍ය සම්පත්

කාන්තාවන්ට දේශපාලනයේ සක්‍රියව කටයුතු කිරීමට ප්‍රධාන බාධකයක්ව පවතිනුයේ මුදල් පිළිබඳ ගැටලුවයි. පිරිමින්ට සාපේක්ෂව මූල්‍ය සහ ප්‍රාග්ධනයේ අනෙකුත් ආකාර වෙත ඔවුන් සතු සීමිත ප්‍රවේශය හේතුවෙන්, සාර්ථක මැතිවරණ ව්‍යාපාරයක් සඳහා අවශ්‍ය දල් සොයාගැනීමට කාන්තාවන්ට ඇත්තේ අඩු හැකියාවකි. තමන්ට ලැබෙන වඩා අඩු වැටුප් හේතුවෙන් සාපේක්ෂව අඩු බැහැර කළ හැකි ආදායමක් ඇති බැවින්, දේශපාලනයට පිවසීමෙ කෙරෙහි කාන්තාවන් සලකා බලනු ඇත්තේ ද පිරිමින්ට වඩා අඩුවෙන්ය (බ්රෝඩි 2009). වෘත්තීයක් ලෙස දේශපාලනය තෝරා ගැනීම සලකා බැලීමේදී, ප්‍රමාණවත් තරම් මුදල් නොමැතිකම දැඩි බාධාවක් බව ප්‍රත්‍යක්ෂව තහවුරු වී ඇති බව මී පෙර සිදුකළ අධ්‍යයනයන්ගෙන් තහවුරු වී ඇත (කොඩිකාර 2009). අඩු ආර්ථික තත්ත්වයක් ඇත්තන් තරඟයෙන් ඉවත් කරමින් (කාන්තාවන් ද ඇතුළුව) වඩා විශාල ප්‍රදේශයක් පුරා මැතිවරණ ව්‍යාපාරයේ නිරතවීම වඩා ප්‍රාග්ධන සූක්ෂම වී ඇති බැවින්, මැතිවරණ ඒකකය විශාලවීම තේරී පත්වීමට කාන්තාවන් තිබූ සුළු වූ හෝ බලාපොරොත්තුවලට තවදුරටත් බාධා පමුණුවා තිබේ.

2018 පෙබරවාරි මැතිවරණයට තරඟ කළ කාන්තා දේශපාලන ක්‍රියාධරයන්ගෙන් (විවෘත තරඟය හො ලැයිස්තුව හරහා) ඔවුන්ගේ මැතිවරණ ව්‍යාපාරය සඳහා ඔවුන් කොපමණ මුදලක් වැයකළේ දැයි මෙම අධ්‍යයනයේදී විමසන ලදී. එම අනාවරණ මගින් පැහැදිලිව පෙන්නුම් කරනුයේ තේරී පත්වීමට ඇති හැකියාව මුදල් වැය කිරීමට ඇති ශක්තිය අතර ප්‍රබල සහසබඳතාවයක් ඇති බවයි. තරඟ කොට ජයග්‍රහණය කළ අය පැහැදිලිව පෙන්නුම් කරන ලද්දේ තරඟ කොට පරාජයට පත්වූ අයට වඩා වැඩි මුදලක් තමන් වැය කළ බවයි (රු. 264,191 ක සාමාන්‍යය මුදල් ප්‍රමාණයක්). කෙසේ වෙතත්, තරඟ කොට පරාජය වූවන් පවා වැය කළ මුදලේ සාමාන්‍යය රු. 246,666 කි. අවධානය යොමු කළ යුතු කරුණක් වනුයේ පක්ෂ ලැයිස්තුව හරහා පත්කරනු ලද අය ද කියා සිටියේ රු.155ල160 ක සාමාන්‍යය මුදලක් වැය කළ බව වන අතර ලැයිස්තුවෙන් තේරී පත්වීමට නොහැකි වූ අය පවා ආසන්න වශයෙන් රු. 100,000 ක් වැය කර තිබුණි එක් එක් අපේක්ෂකයන් විසින් මැතිවරණ ව්‍යාපාරය සඳහා වැය කළ සාමාන්‍යය මුදල පහත වගුවෙන් දක්වා තිබුණ ද, සැබෑ ලෙසම මුදල් වැයකිරීම බෙහෙවින් වෙනස් වේ.

**මෙම සංදර්භය තුළ, කාන්තාවක් ද පිරිමියෙක් ද යන්න නොසලකා ප්‍රාදේශීය, ජාතික හෝ අන්තර්ජාතික යන කුමන හෝ මට්ටමක දේශපාලනයට පිවිසීමට අපේක්ෂා කරන කවරකු හෝ සතුව ආර්ථික, සංස්කෘතික හා සමාජ ප්‍රාග්ධනය මත ප්‍රමාණවත් පාලනයක් හෝ ඒ වෙත ප්‍රවේශයක් තිබිය යුතුයි**

**වගුව 07 - අපේක්ෂක වර්ගය අනුව පළාත් පාලන මැතිවරණය සඳහා මුදල් වැයකිරීම**

| අපේක්ෂක කාණ්ඩය % | මැතිවරණයේ මුදල් වැයකිරීමේ සාමාන්‍යය (රු) |
|---|---|
| තරඟ කර ජයග්‍රහණය කළ | 264, 191 |
| තරඟ කර පරාජය වූ | 246, 666 |
| ලැයිස්තුවෙන් ජයග්‍රහණය කළ | 155, 160 |
| ලැයිස්තුවෙන් පරාජයට පත් වූ | 97, 739 |
| සාමාන්‍යය | 179178.4 |

**එම අනාවරණ මගින් පැහැදිළිව පෙන්නුම් කරනුයේ තේරී පත්වීමට ඇති හැකියාව මුදල් වැය කිරීමට ඇති ශක්තිය අතර ප්‍රබල සහසබඳතාවයක් ඇති බවයි**

අළුතින් තේරී පත්වූ ඇතැම් පළාත් පාලන දේශපාලකවරියන් සමග පැවැති සාකච්ඡාවන්හිදී අනාවරණය වූයේ ඔවුන් සඳහන් කළ මුදලට ආසන්න මුදලක් භාණ්ඩ සඳහා ද ඔවුන් වැය කළ බවයි. උදාහරණයක් ලෙස ප්‍රාදේශීය දේශපාලනයේ සක්‍රියව නියැළෙන පවුලකින් පැමිණි 2018 පළාත් පාලන මැතිවරණය තරඟකර ජයග්‍රහණය කළ බදුල්ලේ කාන්තා දේශපාලනඥයකු (ඇගේ පියා සහ ස්වාමි පුරුෂයාගේ පියා යන දෙදෙනාම දිගු කාලයක් පුරා ප්‍රාදේශීය දේශපාලන යාන්ත්‍රනණයට සම්බන්ධ වී සිටි අතර ඇගේ ස්වාමි පුරුෂයා වත්මනෙහි ඌව පළාත් සභාවේ ධූරයක් හොබවයි) මැතිවරණය තරඟ කිරීම සඳහා ඇගේ ස්වාමි පුරුෂයාගේ ප්‍රයෝජනය සඳහා ඇති සම්පත් භාවිතා කළේ යැයි පැවසේ.

එබැවින් කෝටා ක්‍රමය හඳුන්වා දුන්නේ වුව ද, සාර්ථක කාන්තා අපේක්ෂිකාවක් වීමට නම්, කාන්තාව සතු මූල්‍ය ශක්තිය තීරණාත්මක වේ. මැතිවරණයෙන් තේරී පත්වූ සහ වෘත්තීමය වශයෙන් දේශපාලනයේ නියැළීමට අපේක්ෂා කරන කාන්තාවන් මීළඟ මැතිවරණයට පෙර තම මූල්‍යමය ධාරිතාවයන් ශක්තිමත කරගැනීමට උත්සාහ දරනු ඇත. එහෙයින් දූෂිත අනුග්‍රාහක-සේවා ලාභී දේශපාලනයෙන් මෙම කාන්තාවන් ඈත්කර තැබීම අතිශයින්ම දුෂ්කර වනු ඇත.

# සංස්කෘතික සම්පත්

ප්‍රජාව තුළ යමෙකුගේ තත්ත්වය ඉහළට ඔසවා තබන සාධක සංස්කෘතික සම්පත් ලෙස හැඳින්වීමට හැකිය. ප්‍රජාතන්ත්‍රවාදය ධූරාවලිමය වැඩවසම් ජාල සමග පුදුමාකාර සහවාසයක පවතින ශ්‍රී ලංකාව වැනි අර්ධ වැඩවසම් සැකසුමක මෙම සම්පත සැලකිය යුතු වැදගත්කමක් දරයි. සැබෑ වැඩවසම් සමාජයක පරිද්දෙන්ම, ් කීර්තිමත්. පවුල්වලින් පැමිණි අය තම බලප්‍රදේශ තුළ වඩා ඉහළ පිළිගැනීමට ලක් වූ අතර එමගින් ඔවුන් ඉතා තරුණ වියේ සිටම දේශපාලන නායකයන් ලෙස නිරායාසයෙන්ම පුරුදු පුහුණු කරනු ලබයි. මැතිරවණ දේශපාලනයේ මුල් දශක කිහිපය තුළ පැවිදි පිරිස්, ආයුර්වේද වෛද්‍යවරුන්, ගුරුවරුන් සහ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් (අනෙකුත් අය අතර) ගම් තුළ ගෞරවාදරයට පත් විය. තම දැනුම සහ කුසලතා හේතුවෙන් මහජනයාගේ ගෞරවය හා විශ්වසාය දිනා ගැනීමට ඔවුන් සමත් වූ අතර එබැවින් අන් අයට වඩා දේශපාලන තනතුරු දැරීමට ඔවුනට වඩා සුදුසුකම් ඇතැයි යන සමාජ මතය තහවුරු විය. ඒ අනුව මැතිවරණ දේශපාලනයේ මුල් යුගයේදී, ප්‍රාදේශීය මට්ටිමේ තම නායකත්වය ස්ථාපිත කර ගැනීම තම ඡන්ද පදනම උපරිම කර ගැනීම පිණිස දේශපාලන පක්ෂ ඔවුන්ගේ සහය පතන ලදී. දශක කිහිපයකට පෙර පැවැති තත්ත්වයට සාපේක්ෂව සංස්කෘතික ප්‍රාග් ධනයේ වැදගත්කම අඩු වී ඇතත්, තමන් සතුව විවිධ සංස්කෘතික සම්පත්, එනම් උපාධි, ගරු තනතුරු හා නම්බු නාම, තම මුතුන් මිත්තන්ට සමාජයේ පැවැති ඉහළ

**මැතිවරණයෙන් තේරී පත්වූ සහ වෘත්තීමය වශයෙන් දේශපාලනයේ නියැළීමට අපේක්ෂා කරන කාන්තාවන් මීළඟ මැතිවරණයට පෙර තම මූල්‍යමය ධාරිතාවයන් ශක්තිමත කරගැනීමට උත්සාහ දරනු ඇති. එහෙයින් දූෂිත අනුග්‍රාහක-සේවාලාභී දේශපාලනයෙන් මෙම කාන්තාවන් ඈත්කර තැබීම අතිශයින්ම දුෂ්කර වනු ඇති**

පිළිගැනීම ආදිය පවතින බව ඡන්ද දායකයන්ට ඒත්තු ගැන්වීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ දේශපාලනඥයන් තවමත් උත්සාහ දරයි.

කාන්තා දේශපාලකවරියන් සලකා බැලීමේදී ද, පවුල් පසුබිම හා පවුලේ අතීත් දේශපාලන භූමිකාව මැතිවරණ ජයග්‍රකහණ සඳහා තීරණාත්මක වේ. ෆ්ලින්ෂන්බර්ග් (2008) පෙන්වා දුන් පරිදි දේශපාලන නායකයේ ලෙස කාන්තාවන්ගේ විශ්වසනීයත්වය ඔවුන්ගේ පුද්ගලික හැකියාවන්ට වඩා මෙම පවුල් පසුබිම මත පරායත්ත වේ. නමුත් දකුණු ආසියානු සමාජයේ තවමත් ක්‍රියාත්මකව පවතින වැඩවසම් නශ්ඨාවශේෂ හේතුවෙන් මෙය කාන්තාවන්ට පමණක් සුවිශේෂී වූ තත්ත්වයක් ද නොවේ. ඓතිහාසිකව, දකුණු ආසියාවේ බොහෝ රටවල මෙන්ම ශ්‍රී ලංකාවේද, විදේශයන්හි අධ්‍යාපනය හැදෑරූ සහ ඉහළ තලයේ දේශපාලනයේ සමාජානුයෝජනය සහිත ප්‍රභූ පවුල්වල කාන්තාවන් අඩු වයසින්ම ඉහළ තනතුරුවලට පත්වීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ.

මෙම අධ්‍යයනයේ අනාවරණ මැතිවරණ සඳහා තරග කිරීමේදී පවුල් පසුබිම වැදගත් වන බවට වන ඉහත නිරීක්ෂණ සමග එකග වෙයි. තරග කොට ජයග්‍රහණය කළ අයගෙන් වැඩි පිරිස දේශපාලන පවුල්වලින් පැමිණි කණ්ඩායම බව පෙනී යයි. (අතීතයේ හා වර්තමානයේ දේශපාලනයේ නියැළි -34.9%, වත්මනෙහි- 32.4%, අතීතයේ - 30.9%) පොදුවේ ගත් කළ, තරග කළ අයට වඩා ලැයිස්තුවෙන් පැමිණි අයගේ පවුල් දේශපාලනය හා සබඳතා ඇති බව පෙනී යයි. ගුණාත්මක සාකච්ඡාවට සහභාගි වූ බොහෝ කාන්තා දේශපාලනඥයන් පවසා සිටියේ තම පවුල්වලට තම ළඟම පවුලේ සාමාජිකයන් හෝ ඥාතීන් හරහා දේශපාලන සබඳතා පවතින බවයි. පක්ෂවල ආකර්ෂණය දිනා ගැනීමට පවුල් පසුබිමේ ඇති වැදගත්කම සම්බන්ධයෙන් මෙයින් මූලිකවම ඉඟි කෙරෙන අතර එමගින් තරග කිරීමට හෝ ලැයිස්තුව හරහා පත්වීමට කාන්තාවකට හැකියාව ලබා දෙයි. මෙහිදී අවධානයට ලක්විය යුතු කරුණක් වන්නේ ප්‍රජාවේ ඉල්ලීම මත කාන්තා අපේක්ෂිකාවන් ගණනාවක්ම මියගිය ඥාතියකුගේ හිදැස පිරවීමට හෝ ඔවුන් පිළිබඳ මතකයට ගරු කිරීමක් වශයෙන් කෝටාවෙන් ලත් අවස්ථාව ප්‍රයෝජනයට ගෙන ඇති බවයි. දකුණු ආසියානු රටවල දීර්ඝ කාලයක් සිට පවතින සම්ප්‍රදායක් පිළිබිඹු කරන මෙය කොඩිකාර (2009) නම් කර ඇත්තේ වැන්දඹුවන්, බිරින්දන් සහ දියණියන් සහලක්ෂණය. ලෙසයි

**වගුව 08 - අපේක්ෂක කාණ්ඩය අනුව පවුල දේශපාලනයට සම්බන්ධ**

| | අපේක්ෂක වර්ගය (%) | | | |
|---|---|---|---|---|
| | තරඟ කර ජයගහණය කළ | තරඟ කර පරාජය වූ | ලැයිස්තුවෙන් ජයගහණය කළ | ලැයිස්තුවෙන් පරාජයට පත් වූ |
| අතීතයේ මෙන්ම වර්තමානයේ දේශපාලනයට සම්බන්ධය | 18.1% | 10.9% | 19.0% | 16.2% |
| වර්තමානයේ දේශපාලනයට සම්බන්ධය | 6.5% | 4.1% | 6.3% | 5.1% |
| අතීතයේදී දේශපාලනයට සම්බන්ධව සිටියේය | 21.7% | 21.1% | 15.2% | 16.2% |
| අතීතයේ සහ වත්මනෙහි දේශපාලනයට සම්බන්ධ නොමැත | 53.6% | 63.9% | 59.5% | 62.4% |
| මූලය | 138 | 147 | 158 | 234 |

# සමාජ ජාල වෙත ප්‍රවේශය

බෝඩියෝගේ (1984) න්‍යායට අනුව සමාජ ප්‍රාග්ධනය යනුවෙන් හැඳින්වෙනුයේ අන්‍යෝන්‍ය පිළිගැනීම මත පදනම් වූ ජාල හා සබඳතා ස්වරූපයෙන් පවතින සමාජීය සම්පත් වේ. සමාජ ජාලයක් යනු සමාජ ක්‍රියාධරයන්, කණ්ඩායම් හෝ ආයතන අතර සබඳතාවලින් ගොඩ නැගුණු සමාජ ව්‍යුහයක් වේ. මෙහිදී පොදු උපකල්පනය වනුයේ පසුකාලීනව ඡන්ද හෝ ඡන්ද එකතු කිරීමේ යාන්ත්‍රණ (ජනප්‍රියතාව වැනි) බවට පරිවර්තනය වීමට ඉඩ ඇති අවශ්‍ය ජාල ගොඩ නගා ගැනීමට යමෙකුට හැකි වන නිසා ප්‍රජාව සමග සක්‍රියව කටයුතු කිරීම දේශපාලනයේ සාර්ථකත්වයට දායක වන බවයි. දැනටමත් සඳහන් කර ඇති පරිදි, මැතිවරණ බලමුළු ගැන්වීමේදී ජාල මගින් ඉටුකරනු ලබන කාර්යභාරය මැනවින් ලේඛනගත කර ඇත. (පීගින්ස් 1979: ජයන්ත 1992: පීරිස් 2018) මැතිවරණ කාල වකවානුවලදී ඡන්ද රැස්කිරීමේ යාන්ත්‍රණ ලෙස දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයන් විසින් විවිධ ව්‍යාපාරික, සංස්කෘතික හා ඥාතිත්ව ජාල යොදා ගන්නේ කෙසේදැයි පීරිස් (2014) කදිමට පැහැදිළි කර දෙයි. එබැවින්, ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ දේශපාලනඥයන් පමණක් නොව, දේශපාලන අභිලාෂයන් ඇති පුද්ගලයන් පවා පොදුවේ මෙම ජාලවල සක්‍රීය කාර්යභාරයක් ඉටු කරයි. කෙසේ වෙතත්, මෙම ජාල ප්‍රමුඛ වශයෙන් පුරුෂත්වකරණ අවකාශ වන අතර ඒවා සමග කාන්තාවන්ට බොහෝ විට ඇත්තේ ඉතා දුර්වල හා අප්‍රධාන සබඳතාවයන් පමණි

# සමිති හා සංගම්වලට සම්බන්ධවීම

අධ්‍යයනයට සහභාගි වූ කාන්තා දේශපාලකවරියන්ගේ සාංගමික ජීවිතය, ඉතිහාසය සහ වත්මන් තත්ත්වය විමසා බැලීමට සමීක්ෂණයේදී උත්සාහ දරන ලදී. එහිදී අනාවරණය වූ කරුණුවලට අනුව, පොදුවේ මෙම කාන්තා දේශපාලනඥයන් පවසා සිටියේ පාසල් ළමුන් තමන් ඉතා ක්‍රියාශීලී ජීවිතයක් ගත කළ බවක් හා වත්මනේ ද තම අසල්වැසි ප්‍රජාව සමග සක්‍රීයව සම්බන්ධ වී කටයුතු කරන බවයි. නමුත් එසේ කරනුයේ නායකයන් ලෙස ද නැතහොත් සහභාගිකයන් ලෙස ද යන්න නිශ්චිතව හෙළි වූයේ නැත. කෙසේ වෙතත්, ප්‍රතිචාර දැක්වූ සියලු දෙනාට සමාජ ජීවිතයේ අත්දැකීම් ඇති බවක් පෙනුණි නමුත් සාංගමික ජීවිතය එනම් ගොවි සමිති, අවමංගලාධාර සමිති, සුබසාධන සමිති හා කාන්තා සංගම් ආදී විවිධ සමිති සමාගම්වල සහභාගිත්වය සහ තනතුරු දැරීම සම්බන්ධයෙන් විමසා සිටි විටදී, ඒවායේ තමන් සක්‍රියව සහභාගි වන බවට පවසා සිටියේ සාපේක්ෂව අඩු කාන්තා දේශපාලනඥයන් ප්‍රතිශතයකි.

**වගුව 09 - අපේක්ෂක වර්ගය අනුව පාසල් සමය තුළ ක්‍රියාශීලී**

| | අපේක්ෂක වර්ගය (%) | | | |
|---|---|---|---|---|
| | තරඟ කර ජයග්‍රහණය කළ | තරඟ කර පරාජය වූ | ලැයිස්තුවෙන් ජයග්‍රහණය කළ | ලැයිස්තුවෙන් පරාජයට පත් වූ |
| ඉතා ක්‍රියාශීලී | 41.4% | 42.7% | 32.7% | 39.8% |
| ක්‍රියාශීලී | 56.6% | 53.5% | 63.6% | 56.1% |
| ක්‍රියාශීලී නොවූ | 2.1% | 3.8% | 3.6% | 4.1% |
| මූලය | 145 | 157 | 165 | 244 |

**වගුව 10 - අපේක්ෂක වර්ගය අනුව අසල්වැසි ප්‍රජාව තුළ ක්‍රියාශීලී**

| | අපේක්ෂක වර්ගය (%) | | | |
|---|---|---|---|---|
| | තරඟ කර ජයග්‍රහණය කළ | තරඟ කර ජයග්‍රහණය කළ | තරඟ කර ජයග්‍රහණය කළ | තරඟ කර ජයග්‍රහණය කළ |
| ඉතා ක්‍රියාශීලී | 59.3% | 58.6% | 50.9% | 47.5% |
| ක්‍රියාශීලී | 36.6% | 37.6% | 44.8% | 47.5% |
| ක්‍රියාශීලී නොවූ | 4.1% | 3.8% | 4.2% | 4.9% |
| මූලය | 145 | 157 | 165 | 244 |

**වගුව 11 - අපේක්ෂක වර්ගය අනුව සාංගමික ජීවිතයේ ක්‍රියාශීලී**

| | අපේක්ෂක වර්ගය (%) | | | |
|---|---|---|---|---|
| | තරඟ කර ජයග්‍රහණය කළ | තරඟ කර ජයග්‍රහණය කළ | තරඟ කර ජයග්‍රහණය කළ | තරඟ කර ජයග්‍රහණය කළ |
| ඉතා ක්‍රියාශීලී | 12.4% | 14.0% | 16.4% | 16.4% |
| ක්‍රියාශීලී | 35.2% | 50.3% | 41.8% | 41.0% |
| ක්‍රියාශීලී නොවූ | 52.4% | 35.7% | 41.8% | 42.6% |
| මූලය | 145 | 157 | 165 | 244 |

මෙම අනාවරණයන්ගෙන් මතුවන කතාන්දරය අන්තර්ඥාණයෙන් අවබෝධ කරගත් කරුණුවලට සෑහෙන දුරට පටහැණි වේ. මැතිවරණයකදී කාන්තා අපේක්ෂිකාවන්ගේ කෙතරම් සාර්ථක වන්නේද යන්නට හෝ ලැයිස්තුව හරහා ඔවුනට පළාත් පාලන ආයතනයේ ස්ථානයක් ලබාගැනීම හැකිවේද යන්නට හෝ ඔවුන්ගේ ප්‍රජා සහභාගිත්වය තීරණාත්මක බවක් නොපෙන්වයි. කාන්තා දේශපාලනඥයන් සමග පැවැති සම්මුඛ සාකච්ඡාවන්හිදී මෙම විෂමතාවය පිළිබඳ යම් අවබෝධයක් ලබා ගැනීමට හැකි විය.. කණ්ඩායම් සාකච්චා අතරතුරදී, ඇතැම් කාන්තාවන් පැමිණිළි කර සිටියේ තමන් පක්ෂය වෙනුවෙන් ගමේ විවිධ කටයුතුවල නිරත වුවද, විවිධ සමිති සමාග ම්වල කටයුතු කළ ද, පක්ෂයේ කටයුතුවලදී ප්‍රාදේශීය මට්ටමින් නායකත්වය ගන්නා පිරිමි දේශපාලනඥයන් තමන්ගේ දේශපාලන ජීවිතය ඉදිරිය කරා රැගෙන යාමට සහයෝගය නොදෙන බවයි. තවත් කාන්තාවන් කිහිප දෙනෙකු චෝදනා කළේ අපේක්ෂත්වය ලබා දීමේදී, මෙම පිරිමි දේශපාලනඥයන් තමන්ගේ ඥාතීන් හෝ සමීප මිතුරන් වන කාන්තාවන්ට වැඩි අනුග්‍රහයක් දක්වන බවයි. එම කණ්ඩායම් සාකච්ඡාවේදීම ඇතැම් කාන්තාවන් පුද්ගලිකව පවසා සිටියේ මෙම කාන්තාවන් තෝරා නොගැනීම සම්බන්ධයෙන් පිරිමි දේශපාලනඥයන්ට දෝෂාරෝපණය කළ නොහැකි බවත් ඔවුන් දේශපාලනයේ නිරත වන්නේ නම් පක්ෂ නායකයන්ගේ සහාය ලබා ගන්නේ කෙසේදැයි ඔවුන් දැන සිටිය යුතු බවත්ය. සමාජ කටයුතුවලදී කාන්තාවන්ගේ ක්‍රියාමාර්ග හා ක්‍රියාකාරිත්වය පමණක් ප්‍රමාණවත් නොවන්නේ කෙසේද යන්න සහ පුරුෂ ආධිපත්‍යයට හා එහි ඉල්ලීම්වලට යටත් වන්නේ නම් මිස කාන්තා දේශපාලන ක්‍රියාධරයන්ට දේශපාලන හිණි මගේ ඉහළට ගමන් කිරීමට නොහැකි බව මෙම අදහස් හුවමාරුවෙන් පෙන්නුම් කරයි.

# ඔවුන්ගේ තේරී පත්වීමේ ප්‍රයත්නය සඳහා සහයෝගය

තේරී පත්වීමේ තම ප්‍රයත්නය සඳහා මෙම කාන්තා දේශපාලන අපේක්ෂිකාවන්ට (ලැයිස්තුව හරහා තේරී පත්වීමට උත්සාය දැරූ අයද ඇතුළුව) සහයෝගය ලැබුණු මූලාශ්‍ර: එනම් ඔවුන්ට තම පවුල්වලින් හා ඥාතීන්ගෙන්, අසල්වාසීන්ගෙන්, ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ පක්ෂ නායකත්වයෙන්, ප්‍රදේශයේ ප්‍රභූන්ගෙන් සහ ප්‍රදේශයේ කාන්තාවන් සහ පිරිමින්ගෙන් කොපමණ සහයෝගයක් ලැබුණේද පිළිබඳව මෙම අධ්‍යයනයෙන් විමසා බලන ලදී. මෙකී පුද්ගලයන් හා කණ්ඩායම් ඒකරාශි කිරීමට ඇති හැකියාව මෙම කාන්තා දේශපාලනඥයන් සතු සමාජ ප්‍රාග්ධනයේ මට්ටම පිළිබඳ හොඳ දර්ශකයක් වේ. පොදුවේ ගත් කළ මෙම අධ්‍යයනයට සහභාගී වූ සියලු කාන්තා දේශපාලනඥයන්ට තම පවුලෙන් හා ඥාතීන්ගෙන් විශාල සහායක් ලැබුණු බවට වාර්තා විය. එසේ සහයෝගයක් නොලැබුණ බව පවසා සිටියේ ඉතාමත් සුළු පිරිසක් පමණක් වන අතර මැතිවරණ ව්‍යාපාරයට තම පවුල්වලින් බාධා පැමිණ වූ බව ප්‍රතිචාර දැක්වූ කිසිවෙකුත් නොපැවසූ තරම්ය. තම පවුල්වලින් හා ඥාතීන්ගෙන් සහාය ලැබුණු බවට අඩුම ප්‍රතිශතයක් වාර්තා කළේ ලැයිස්තුවෙන් තරග කර පරාජය වූවන්ය.

මෙම අනාවරණවලින් පැහැදිළිව පෙන්නුම් කරනුයේ අසල්වාසීන්ගේ සහාය ලබාගැනීමට ඇති හැකියාව මැතිවරණයේ ප්‍රතිඵල කෙරෙහි දැඩි බලපෑමක් ඇතිකරන බවයි. එසේ වැඩිම සහයෝගයක් ලබා ගැනීමට හැකි වූ බව වාර්තා කරන ලද්දේ තරග කොට ජයග්‍රහණය කළ අයවලුන් (70.3%) වන අතර ඊළග වැඩිම පිරිස වූයේ ලැයිස්තුවෙන් තේරී පත්වූවන්ය (53.7%). කෙසේ වෙතත්, තරග කොට පරාජයවූවන් මෙන්ම ලැයිස්තුවෙන් පරාජයට පත්වූවන් ද තමන්ට ද අසල්වාසීන්ගේ සහාය ලැබුණු බව වාර්තා කළ ද ඒ සහාය ලැබී ඇත්තේ යම් දුරකට පමණි ඇත්ත වශයෙන්ම පළාත් පාලන මැතිවරණයක් තරග කරන කවරෙකුට වුව ද අසල්වාසී ප්‍රජාවගේ සහාය තීරණාත්මක වන්නේ එවැනි සහයෝගයක් මැතිවරණ ව්‍යාපාරයට ආධාරයක් වනවා පමණක් නොව ඡන්ද ද ලබා දෙන නිසාය. ගුණාත්මක සාකච්ඡාවන්ට සහභාගි වෙමින්, තේරී පත්වූ එක් කාන්තා දේශපාලකවරියක් පවසා සිටියේ වසර ගණනාවක් පුරා සිදුකළ සමාජ කටයුතු නිසා ප්‍රදේශයේ සියලු දෙනා ඇයව හොඳින් දැන සිටි බැවින් සහ ඇගේ සීයා ද ප්‍රදේශයේ දේශපාලන කටයුතුවල නිරතවූවෙක් බැවින් අසල්වැසි ප්‍රජාවගෙන් ඇයට විශාල සහයෝගයක් ලැබුණු බවයි. එබැවින් පවුල් පසුබිම මෙන්ම කාන්තා දේශපාලනඥයන්ගේ ඔවුන්ගේම වූ ක්‍රියාකාරිත්වය යන කරුණු දෙකම අසල්වැසියන්ගේ ඡන්ද ලබාගැනීමට දායක වෙයි.

**මෙම අනාවරණවලින් පැහැදිළිව පෙන්නුම් කරනුයේ අසල්වාසීන්ගේ සහාය ලබාගැනීමට ඇති හැකියාව මැතිවරණයේ ප්‍රතිඵල කෙරෙහි දැඩි බලපෑමක් ඇතිකරන බවයි**

අපේක්ෂිත පරිදිම, තරග කොට ජයග්‍රහණය කළ අය පවසා සිටියේ පක්ෂයේ ජාතික නායකත්වයේ සහයෝගය විශාල ප්‍රමාණයකට තමන්ට ලැබුණු බවයි. අනෙක් අතට පක්ෂයේ ජාතික නායකත්වයෙන් සහායක් නොලැබුණු බවට පැවැසූ පිරිස ජයග්‍රහණය කළ පිරිසට සාපේක්ෂව ිපරාජිත. කාණ්ඩයේ ඉහළ ප්‍රතිශතයක් ගනු ලැබීය. ප්‍රාදේශීය පක්ෂ නායකත්වයේ සහයෝගය සම්බන්ධයෙන් ගත් කළ, මෙම රටාවම ඊටත් වඩා තීව්‍රතාවයකින් දක්නට ලැබේ. තරග කොට හෝ ලැයිස්තු හරහා තම පළාත් පාලන ආයතනවලට තේරී පත්වීමට සමත්වූවන් පවසා සිටියේ ප්‍රදේශයේ ප්‍රභූන්ගෙන් තමන්ට සහාය ලැබුණු බව වන අතර අනෙක් අතට තරග කොට හෝ ලැයිස්තු හරහා තම පළාත් පාලන ආයතනවලට තේරී පත්වීමට නොහැකි වූ අපේක්ෂිකාවන්ගෙන් සාපේක්ෂව අඩු ප්‍රතිශතයක් ඔවුනට ප්‍රාදේශීය දේශපාලන නායකත්වයෙන් විශාල සහයෝගයක් ලැබුණු බව සිතයි. මෙයින් පැහැදිළිව පෙන්නුම් කරනුයේ, කෝටා ක්‍රමය පැවැතියේ වුව ද, සාර්ථක අපේක්ෂකයකු වීමට නම්. කාන්තාවන්ට ජාතික මට්ටමේ හා ප්‍රාදේශීය මට්ටමේ දේශපාලන

නායකත්වය සමග සවිමත් සබඳතාවක් අවශ්‍ය බවයි. විශේෂයෙන්ම පක්ෂ ලැයිස්තුව හරහා නම්කරනු ලැබූ අය නාමයෝජනා ලබාගැනීමට පමණක් නොව ප්‍රතිඵල නිකුත්වීමෙන් පසුව ප්‍රාදේශීය සභාවට තෝරා ගනු ලබන අපේක්ෂකයන්ගේ ලැයිස්තුවට තම නම් ඇතුළත් කරගැනීම පිණිස ද පක්ෂ නායකත්වය මත දැඩිව රඳා පැවතුණි තම නම් ලැයිස්තුවලට ඇතුළත් කරනු ලැබුවේ හුදෙක්ම පක්ෂ ලැයිස්තුවේ නිශ්චිත කාන්තාවන් සංඛ්‍යාවක් තිබීම අනිවාර්ය වූ නිසා බවත් මැතිවරණය අවසන් වු පසුව පක්ෂ නායකත්වය තමන්ගේ සමීපතයන් කෙරේ  වැඩි නැඹුරුවක් දැක්වූ බවත් ගුණාත්මක සාකච්ඡාවට සහභාගි වූ කාන්තා දේශපාලනඥයින් ගණනාවක් පැමිණිලි කර සිටියේය.

අසල්වාසීන් සම්බන්ධයෙන් ගත් කළ, තරඟ කොට හෝ ලැයිස්තු හරහා තම පළාත් පාලන ආයතනවලට තේරී පත්වීමට සමත්වූ කාන්තා දේශපාලනඥයින් පවසා සිටියේ අනෙක් අයට වඩා තමන්ට ප්‍රදේශයේ ප්‍රභූ පිරිස්වල සහාය හිමි වු බවයි. තම අදාළ බල ප්‍රදේශයන්හි කාන්තාවන් හා පිරිමින් යන දෙපිරිසේම සහයෝගය සියලු කාණ්ඩ සඳහා පොදුවේ සමානකමක් පෙන්වයි. කෙසේ වෙතත්, පුදුමයකට මෙන්, දත්ත මගින් පෙන්නුම් කරනුයේ තරඟ කර ජයග්‍රහණය කළ කාන්තා දේශාපාලනඥයන්ට වැඩි සහයෝගයක් හිමි වූයේ තම ප්‍රදේශවල කාන්තාවන්ට වඩා පිරිමින්ගෙන් බවයි. වත්මන් දේශපාලන ක්‍රමය තුළ කාන්තාවන්ට සාර්ථක අපේක්ෂිකාවන් වීමට නම් ප්‍රදේශයේ කාන්තාවන්ගේ සහයෝගයට වඩා පිරිමින්ගේ සහයෝගය තීරණාත්මක වන්නේය යන අදහස මෙයින් කියවේ. ඒසේ වුවද, මෙම කරුණ පිළිබඳව තවදුරටත් පර්යේෂණ සිදු නොකොට එවැනි නිගමනයන්ට එළඹීමට යමෙකු කලබල විය යුතු නොවේ. ප්‍රාදේශීය කාන්තා දේශපාලකවරියන් කිහිප දෙනෙකු සමග පවත්වන ලද සාකච්ඡාවන්හිදී මේ සම්බන්ධයෙන් යම් අවබෝධයක් ලබා ගැනීමට හැකි වුණි තම මැතිවරණ උපායමාර්ග විස්තර කරමින්, ප්‍රතිචාර දැක්වූ එක් කාන්තාවක් කියා සිටියේ පෝස්ටර් ඇලවීමට සහ ගම අභ්‍යන්තරයේ මැතිවරණ කටයුතු තමන් පිරිමින් යොදා ගත් බවයි. කෙසේ වෙතත්, පිරිමින් එක් රැස් කිරීම පිණිස මත්පැන් හා දුම්වැටි අවශ්‍ය බැවින් එම ක්‍රියාවලිය සම්බන්ධීකරණය පිණිස ඇගේ ස්වාමිපුරුෂයා ඇයට උදව් කර තිබේ. ඇයගේ මතය වූයේ එවැනි දේවල් සපයනු නොලබන්නේ නම් කිසිවකු හෝ පැමිණ මැතිවරණ ව්‍යාපාරයකට උදව් උපකාර නොකරන බවයි.

> **තම මැතිවරණ උපායමාර්ග විස්තර කරමින්, ප්‍රතිචාර දැක්වූ එක් කාන්තාවක් කියා සිටියේ පෝස්ටර් ඇලවීමට සහ ගම අභ්‍යන්තරයේ මැතිවරණ කටයුතු සඳහා තමන් පිරිමින් යොදා ගත් බවයි කෙසේ වෙතත්, පිරිමින් එක් රැස් කිරීම පිණිස මත්පැන් හා දුම්වැටි අවශ්‍ය  බැවින් එම ක්‍රියාවලිය සම්බන්ධීකරණය පිණිස ඇගේ ස්වාමිපුරුෂයා ඇයට උදව් කර තිබේ**

**වගුව 12 - අපේක්ෂක කාණ්ඩය අනුව උපකාර මූලාශ්‍ර**

| | | අපේක්ෂක වර්ගය (%) | | | |
|---|---|---|---|---|---|
| | | තරඟ කර ජයග්‍රහණය කළ | තරඟ කර පරාජය වූ | ලැයිස්තුවෙන් ජයග්‍රහණය කළ | ලැයිස්තුවෙන් පරාජයට පත් වූ |
| පවුල හා ඥාතීන් | විශාල ලෙස | 86.8% | 83.9% | 87.2% | 78.2% |
| | තරමක් දුරට | 11.1% | 14.8% | 11.0% | 18.1% |
| | සහයෝගයක් නොමැත | .7% | .6% | 1.2% | 2.5% |
| | බාධා කරන ලදී | 0.0% | .6% | 0.0% | 0.0% |
| අසල්වැසියන් | විශාල ලෙස | 70.3% | 40.6% | 53.7% | 42.8% |
| | තරමක් දුරට | 26.9% | 56.1% | 41.5% | 51.0% |
| | සහයෝගයක් නොමැත | .7% | 1.9% | 1.8% | 4.1% |
| | බාධා කරන ලදී | 0.0% | 0.0% | 0.0% | .4% |
| පක්ෂ නායකත්වය- ජාතික | විශාල ලෙස | 54.5% | 30.1% | 42.6% | 19.5% |
| | තරමක් දුරට | 31.0% | 50.0% | 30.9% | 41.5% |
| | සහයෝගයක් නොමැත | 13.1% | 17.3% | 21.0% | 33.2% |
| | බාධා කරන ලදී | .7% | 0.0% | 0.0% | .8% |
| පක්ෂ නායකත්වය -ප්‍රාදේශීය | විශාල ලෙස | 57.6% | 38.7% | 54.6% | 28.5% |
| | තරමක් දුරට | 36.1% | 52.3% | 39.3% | 55.4% |
| | සහයෝගයක් නොමැත | 3.5% | 5.2% | 3.1% | 13.2% |
| | බාධා කරන ලදී | 0.0% | .6% | 1.2% | 0.0% |
| ප්‍රදේශයේ ප්‍රභූන් | විශාල ලෙස | 42.1% | 24.5% | 25.9% | 18.4% |
| | තරමක් දුරට | 40.0% | 58.1% | 55.6% | 54.0% |
| | සහයෝගයක් නොමැත | 13.8% | 14.2% | 14.2% | 23.0% |
| | බාධා කරන ලදී | 0.0% | 0.0% | 0.0% | 1.3% |
| ප්‍රදේශයේ කාන්තාවන් | විශාල ලෙස | 56.6% | 46.5% | 45.4% | 36.6% |
| | තරමක් දුරට | 38.6% | 47.7% | 49.7% | 58.0% |
| | සහයෝගයක් නොමැත | 1.4% | 3.9% | 1.8% | 3.7% |
| | බාධා කරන ලදී | .7% | 0.0% | .6% | 0.0% |
| ප්‍රදේශයේ පිරිමින් | විශාල ලෙස | 61.4% | 28.4% | 41.0% | 25.3% |
| | තරමක් දුරට | 35.2% | 65.8% | 51.6% | 57.7% |
| | සහයෝගයක් නොමැත | 0.0% | 1.9% | 3.1% | 12.4% |
| | බාධා කරන ලදී | 0.0% | 1.3% | .6% | .4% |

අධ්‍යනයට සහභාගි වූ කාන්තා දේශපාලන ක්‍රියාධරයන් සියලු දෙනාම පාහේ තම පවුලේ සාමාජිකයන්ගෙන්, ඥාතීන්ගෙන් හා අසල්වාසීන්ගෙන් සහාය ලැබුණේ යැයි පැවසීම නිසා, මැතිවරණයකදී උදව් උපකාර ලබා ගැනීමේදී කාන්තා දේශපාලනඥයන් සතු සමාජ ප්‍රාග්ධනය විසින් ඉටු කරනු ලබන වැදගත් කාර්යභාරය මෙම අධ්‍යයනය පැහැදිළිව අවධාරණය කරයි. කෙසේ වෙතත්, ජාතික සහ ප්‍රාදේශීය දේශපාලන නායකත්වයේ මෙන්ම ප්‍රදේශයේ ප්‍රභූ පිරිස්වල වඩා වැඩි සහයෝගයක් භුක්ති විඳ ඇත්තේ ඇතැම් අය පමණක් වන අතර ලැයිස්තුව මගින් හෝ තරඟ කිරීම මගින් ප්‍රාදේශීය සභාවට තේරී පත්වීමට ඔවුන්ට හැකි විය. එබැවින් කෝටා ක්‍රමය පවතින්නේ වුවද, පිරිමි දේශපාලනඥයන්ට මෙන්ම කාන්තාවන්ට ද දේශපාලනයේදී සාර්ථක වීමට නම් ඔවුන්ගේ බලයේ මට්ටම හා ඔවුන්ට කෙතරම් දුරකට බලපෑම් කළ හැකිද යන්න අවසාන වශයෙන් නිශ්චය කරන තම ආර්ථික, සංස්කෘතික සහ සමාජ ප්‍රාපග්ධනය ඉහළ නංවා ගැනීමට සිදුව තිබේ. මේ සඳහා, තම සහෝදර පිරිමි දේශපාලනඥයන්ට වඩා වාසිදායක තත්ත්වයක් ඇති කර ගැනීම පිණිස ඔවුන් විසින් ඔවුන්ගේම වූ උපායමාර්ග යොදා ගත යුතු වේ. එසේ වුවද, එවැනි උපායමාර්ග ප්‍රජාතන්ත්‍රවාදී සම්මතයන් තුළ සැම විටම සොයා ගත හැකිද යන්න ගැඹුරින් සලකා බැලිය යුතු ප්‍රශ්නයකි.

# තම දේශපාලන අනාගතයට බාධාවන් ලෙස කාන්තා දේශපාලනඥයන් දකිනුයේ කවරක්ද?

## මූල්‍ය සම්පත් හිඟය

මෙම අධ්‍යයනයට සහභාගිවූ කාන්තා දේශපාලනඥයන් තම දේශපාලන ජීවිතයට ඇති ලොකුම බාධාව ලෙස දකිනුයේ දේශපාලනය සඳහා වැය කිරීමට මුදල් නොමැතිකමයි. මූල්‍ය සම්පත් නොමැතිකම වෘත්තීය දේශපාලනයට පිවිසීම සලකා බැලීමෙන් කාන්තාවන් අධෛර්ය කර ඇත්තේ කෙසේද යන්න දැනටමත් සාකච්ඡා කර ඇත. (මූල්‍ය සම්පත් යටතේ) ශ්‍රී ලංකාව වැනි අනුග්‍රාහක ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ඡන්ද අපේක්ෂාවෙන් දේශපාලනඥයන් බඩු භාණ්ඩ ලබා දෙනවා පමණක් නොව, ඡන්ද දායකයන්ද එසේ ලැබුණු භාණ්ඩ වෙනුවෙන් තම ඡන්දය ලබා දෙයි නැතහොත් ලබා දෙන බවට ප්‍රතිඥා දෙයි. මෙම තත්ත්වය විග්‍රහ කරමින් උයන්ගොඩ (2010) ප්‍රකාශ කරනුයේ "රාජ්‍ය -සමාජීය රාමුවක් තුළ ශ්‍රී ලංකාවේ දේශපාලන බලය කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳව අවබෝධයක් ලබා ගනු පිණිස දේශපාලන ක්‍රියාවලිය තුළ අනුශාසක -සේවාලාභී සබඳතා පැවැතීම හඳුනා ගැනීම සහ ඒවා ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න ඇගයීම" ඉතා තීරණාත්මක බවයි (පිටුව 61). එබැවින්, තම දේශපාලන ජීවිතය පවත්වා ගැනීම සඳහා දේශපාලනඥයන්ට එක්කෝ තම පුද්ගලික ධනය තිබිය යුතුය, නැතහොත් අනුග්‍රහය සැපයීමේ අනෙකුත් ක්‍රම තිබිය යුතුය. අතීතයේදී තම දේශපාලන කටයුතු සඳහා දේශපාලනඥයන් තම පෞද්ගලික ධනය වැය කළ ද, මෑත කාලීනව ඔවුන් තම අනුග්‍රාහක ජාල පවත්වා ගැනීම පිණිස රාජ්‍ය සම්පත් වෙත තම ප්‍රවේශය යොදා ගනියි (පීරිස් 2014). ශ්‍රී ලංකාවේ මැතිවරණ දේශපාලනය පිළිබඳ ලියැවී ඇති පොත්පත්වලට අනුව මින් අදහස් වනුයේ දේශපාලනයේ රැඳී සිටීමට නම් දේශපාලනඥයන් සතුව ප්‍රමාණවත් පුද්ගලික ධනයක් හෝ ජාතික මට්ටමේ දේශපාලනඥයන්, නිලධාරීන් හා මිල මුදල් සහිත පුද්ගලයන් සමග අවශ්‍ය සබඳතා තිබිය යුතු බවයි. කාන්තාවන් වුව ද පිරිමින් වුව ද, ප්‍රාදේශීය මට්ටමේ දේශපාලනඥයන් බොහෝ දෙනෙකුට දේශපාලනයට පිවිසීමට පෙර එවැනි ධනයක් නොතිබූ නමුදු ඇතැමෙක් තේරී පත්වීමෙන් පසුව තම සබඳතා සහ බලය සූක්ෂමව යොදා ගනිමින් ආදායම් උපයන මාර්ග සකස් කරගෙන තිබේ.

බලය සූක්ෂම ලෙෂ යොදා ගනිමින් ධනය ඉපැයීමේ එවැනි උපායමාර්ග සඳහා කාන්තා දේශපාලනඥයින්ට වඩා පිරිමි දේශපාලනඥයන්ට වැඩි හැකියාවක් ඇති බවට නිගමනයකට එළඹීම පිණිස සංසන්දනාත්මක දත්ත මෙම අධ්‍යයනය නොසැපයුවේ වුව ද, තම දේශපාලන කටයුතු සඳහා මුදල් උත්පාදනය කිරීමේදී කාන්තාවන් දුර්වලයන්. බව කාන්තා දේශපාලනඥයන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවන්හිදී පැහැදිළිව ප්‍රකාශ විය. තමන් ජීවත්වන ප්‍රදේශය තුළ දේශපාලන කටයුතු ඉටු කිරීමට මුදල් ප්‍රතිපාදන තම ජාතික හා ප්‍රාදේශීය දේශපාලනඥයන් විසින් වෙන් කිරීම ඔවුන් අපේක්ෂා කරන නමුත් බොහෝ දෙනෙකු පැමිණිලි කර සිටියේ අභ්‍යන්තර දේශපාලනය සහ පුද්ගලික දැන හැඳුනුම්කම් මත තමන්ට එවැනි සහායක් අහිමි වී ඇති බවයි. එහි ප්‍රතිඵලයක් ලෙස, තමන්ට ඡන්දය ප්‍රකාශ කළ අයට මුහුණ දීම ඔවුනට දුෂ්කර වී ඇත. කෙසේ වෙතත්, බදුල්ල මහා නගර සභාවට මෑතකදී

**මෙම අධ්‍යයනයට සහභාගිවූ කාන්තා දේශපාලනඥයන් තම දේශපාලන ජීවිතයට ඇති ලොකුම බාධාව ලෙස දකිනුයේ දේශපාලනය සඳහා වැය කිරීමට මුදල් නොමැතිකමයි**

තේරී පත්වූ කාන්තා දේශපාලනඥයකු පවසා සිටියේ ඇයගේ සැමියා ඌව පළාත් සභාවේ අමාත්‍යවරයකු බැවින් ඇයට එවැනි දුෂ්කරතාවයක් නොමැති බවයි. පළාත් පාලන ආයතනවලට තේරී පත්වූ කාන්තාවන්ගෙන් සාපේක්ෂව වඩා ඉහළ ප්‍රතිශතයක් තම දේශපාලන අනාගතය සඳහා මුදල් හිඟය බාධාවක් බව අවධාරණය කළේය. එබැවින්, පළාත් පාලන ආයතනවලට තේරී පත්වූ කාන්තා දේශපාලනඥයන් සඳහා බාහිර මූල්‍ය සහායක් නොලැබෙන්නේ නම් ඔවුන්ගේ දේශපාලන ජීවිතයේ අනාගතය අවදානමක පවතී.

## විරුද්ධ පක්ෂවල අභියෝග


කාන්තා දේශපාලනඥයන්, විශේෂයෙන්ම අළුතින් තේරී පත්වූ අය සභාව තුළ මෙන්ම තම මැතිවරණ කොට්ඨාශය තුළ විපක්ෂයේ පක්ෂවල අභියෝගයන්ට මුහුණ දෙයි. සමීක්ෂණයෙන් අනාවරණය වූ කරුණුවලට අනුව, තේරී පත්වූ මෙන්ම තේරී පත් නොවූ කාන්තා දේශපාලනඥයන්ගෙන් පහෙන් එකක් විරුද්ධ පක්ෂවල අභියෝග තම දේශපාලන ජීවිතයට බාධාවක් සේ සලකයි. සභාවේ පුරුෂත්වකරණ වූ අවකාශය තුළ,

**සභාවේ පුරුෂත්වකරණ වූ අවකාශය තුළ අපහාසාත්මක වාග්මාලාව සහ ආක්‍රමණශීලී උච්චාරණ විලාශය යොදා ගනිමින් පිරිමින් වාද විවාදවල නියැළෙන ආකාරය තුළ කාන්තා දේශපාලනඥයන්ගේ හඬ යටපත් වේ**

අපහාසාත්මක වාග්මාලාව සහ ආක්‍රමණශීලී උච්චාරණ විලාශය යොදා ගනිමින් පිරිමින් වාද විවාදවල නියැළෙන ආකාරය තුළ කාන්තා දේශපාලනඥයන්ගේ හඬ යටපත් වේ. කෙසේ වෙතත්, බොහෝ කාන්තාවන් ප්‍රකාශ කළේ ඔවුන් ඉක්මණින් ඊට හුරු පුරුදු වූ බවත් සභාව තුළ එවැනි පුරුෂාකාර ඉදිරිපත්කිරීම්වලට තමන් දැන් බිය නොමැති බවත්ය. මේ අතර, ප්‍රතිචාර දැක්වූ තවත් සමහරෙක් පවසා සිටියේ ඇත්ත වශයෙන්ම කාන්තා දේශපාලනඥයන් ඉදිරියේ හොඳින් හැසිරීමට පිරිමි දේශපාලනඥයන් පටන් ගත් බවත් සභාව තුළ කටයුතු කිරීමට තමන්ට බරපතල අභියෝගයක් නොමැති බවත්ය.

තම විරුද්ධ පක්ෂයේ සාමාජිකයන්ගේ කටයුතු නිසා තම මැතිවරණ කොට්ඨාශ තුළ කාන්තා දේශපාලනඥයන්ට අවදානම් සහගත බවක් හැඟේ. එය සෘජුවම මූල්‍ය සම්පත් වෙත ප්‍රවේශය නොමැතිකම හා සම්බන්ධ වේ. ජනතාවට උදව් උපකාර කිරීමට තමන්ට හැකියාවක් නොමැති නම්, තම ඡන්ද දායකයන්ගේ සහයෝගය දිනාගැනීම ඔවුන්ට අසීරු වී ඇත. ඊට අමතරව, පිරිමි දේශපාලනඥයන් හා සැසඳීමේදී, ඔවුන් තරමටම තම ඡන්ද දායකයන් හමුවීමට යාමට කාන්තා දේශපාලනඥයන්ට විශේෂයෙන්ම අපහසු වේ. උදාහරණයක් ලෙස, රාත්‍රි කාලයේදී අවමංගල්‍යයකට යාමට හෝ තම ආධාරකරුවකුගේ හදිසි වෛද්‍ය අවශ්‍යතාවයක් සඳහා යාමට හෝ තනිවම දුර ගමනක් යාමට පවතින පීතෘ මූලික සමාජය තුළ කාන්තා දේශපාලනඥයන්ට සංස්කෘතිකමය වශයෙන් අභියෝගාත්මක වේ. එහෙත් පිරිමි දේශපාලනඥයන්ට කිසිදු සමාජීය බාධාවකින් තොරව තම පක්ෂයේම හෝ විරුද්ධ පක්ෂයේ ඡන්ද දායකයන් සමග කටයුතු කිරීමට හැකි වේ. විශේෂයෙන්ම, විරුද්ධ පක්ෂවලින් එල්ල වන අභියෝගය වැඩියෙන්ම දැනී තිබුණේ බලයේ නොසිටිමින් තම දේශපාලන ජීවිතය පවත්වා ගැනීමට සිදුව තිබූ, තරග කිරීමෙන් හෝ ලැයිස්තුව මගින් හෝ සභාවට තේරී පත්වීමට නොහැකි වූ කාන්තා දේශපාලනඥයන්ටය.

**රූප සටහන 01- කාන්තාවන්ගේ දේශපාලන අනාගතය සඳහා විශාලතම බාධා**




# ප්‍රචණ්ඩ දේශපාලන සංස්කෘතිය

තම දේශපාලන අනාගතයට බාධාවක් ලෙස කාන්තා දේශපාලනඥයන් දකින තෙවන වඩාත්ම ජනප්‍රිය සාධකය වන්නේ ප්‍රචණ්ඩ දේශපාලන සංස්කෘතියයි. තම දේශපාලන කටයුතු සඳහා මැරයන් හෝ මැර කල්ලි යොදා ගන්නා බවට කිසිදු දේශපාලන පක්ෂයක් හෝ දේශපාලනඥයෙක් විවෘතව ප්‍රකාශ නොකරන නමුත් විශේෂයෙන්ම ප්‍රධාන පක්ෂවල දේශපාලනඥයන් අවශ්‍ය ඕනෑම විටකදී ප්‍රචණ්ඩත්වය මුදා හැරීමට ඇති හැකියාව පවත්වා ගනියි (පීරිස් 2014) එවැනි ප්‍රචණ්ඩ ක්‍රියා මිනී මැරීම්, පහරදීම්, වෙඩි තැබීම් සහ දේපළ ගිනි තැබීම් ලෙස පමණක් නොව විවිධ සූක්ෂම ආකාරවලින් සිදුවේ. ශ්‍රී ලංකාවේ මැතිවරණ දේශපාලනය ආරම්භ වූ දා සිටම මැතිවරණ ප්‍රචණ්ඩත්වය පැවැති බව මැතිවරණ අධ්‍යයන පිළිබඳ දේශීය වශයෙන් පළ වී ඇති ලේඛන පුළුල්ව පිළිගනු ලබයි. (ජිගින්ස් 1979: ජුප් 1978: පීරිස් 2014). එපමණක් ද නොව, දේශපාලනයෙන් කාන්තාවන් ඈත් කර තබන වඩාත්ම පුළුල්ව පිළිගෙන ඇති සාධකයක් ලෙස සලකනුයේ දේශපාලන ක්ෂේත්‍රයේ පවතින ප්‍රචණ්ඩත්වයයි. (බාර්ඩල් 2018, ඩයර් සහ අනෙකුත් අය 2019) දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවන ශාරීරික හිංසනයන් "කාන්තාවන්ගේ අවදානම් සහගතබව ඉහළ නංවන අතර අවශ්‍යයෙන්ම බොහෝ රාත්‍රී වන තුරු වැඩ කිරීම හා තනිවම ගමන් කිරීම කොටසක් වන දේශපාලන ක්‍රියාකාරකම් අධෛර්යමත් කරයි." සාමාන්‍ය කාන්තාවන් සාතිශය බහුතරයකට මෙන්ම බොහෝ පිරිමින් සඳහා ද, දේශපාලනය වෘත්තියක් ලෙස සලකා බැලීම වළක්වාලන සාධකයක් වනුයේ ප්‍රචණ්ඩත්වයයි." (කොඩිකාර 2009ග පිටුව 20) ඊට අමතරව, ස්ත්‍රී පුරුෂ සමාජභාව ස්වරූපයේ ප්‍රචණ්ඩත්වයට කාන්තාවන් විශේෂයෙන්ම අවදානම් පාත්‍ර බැවින් දේශපාලනයේ රැඳී සිටීම කාන්තාවන්ට විශාල අභියෝගයකි. සමීක්ෂණයේ අනාවරණයන්ට අනුව, දේශපාලන ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වැඩියෙන්ම සිය කණස්සල්ල පළ කළේ තරග කිරීමෙන් හෝ ලැයිස්තුව හරහා පළාත් පාලන ආයතනවලට තේරී පත්වූ කාන්තාවන්ය. (වගුව 13)

**වගුව 13- අපේක්ෂක වර්ගය අනුව දේශපාලන අනාගතය සඳහා පවතින බාධක**

| | අපේක්ෂක වර්ගය (%) | | | |
|---|---|---|---|---|
| | තරඟ කර ජයග්‍රහණය කළ | තරඟ කර පරාජය වූ | ලැයිස්තුවෙන් ජයග්‍රහණය කළ | ලැයිස්තුවෙන් පරාජයට පත් වූ |
| දේශපාලනය සමීභා වැය කිරීමට මුදල් නොමැතිකම | 47.2% | 34.0% | 41.5% | 41.5% |
| විරුද්ධ පක්ෂවල අභියෝග | 19.0% | 26.9% | 23.9% | 15.3% |
| ඔගේම පක්ෂයෙන් මතුවන අභියෝග | 2.8% | 14.1% | 6.3% | 17.8% |
| ඔගේ පවුලෙන් එල්ල වූ අභියෝග | 0.7% | 4.5% | 1.3% | 1.7% |
| ෂමාජයෙන් පැමිණි අභියෝග | 12.7% | 7.7% | 8.8% | 8.5% |
| ප්‍රචණ්ඩ දේශපාලන සංස්කෘතිය | 14.1% | 11.5% | 17.0% | 13.6% |
| එකතුව | 3.5% | 1.3% | 1.3% | 1.7% |
| මූලය | 100.0% | 100.0% | 100.0% | 100.0% |

# තමන්ගේම පක්ෂයෙන් මතුවන අභියෝග

පොදුවේ ගත් කළ, මෙම අධ්‍යයනයට සහභාගි වූ කාන්තා දේශපාලනඥයක් 11**%** ක් ප්‍රකාශ කර සිටියේ තම පක්ෂය විසින්ම තමන්ගේ දේශපාලන ජීවිතය අභියෝගයට ලක් කර ඇති බවය[8]**.** තම දේශපාලන අනාගතය සඳහා පක්ෂය තුළින්ම අභියෝගයක් එල්ල වී ඇතැයි සිතීමට වැඩියෙන්ම ඉඩ ඇත්තේ තරග කොට පරාජයට පත්වූ මෙන්ම ලැයිස්තුවෙන් පරාජයට පත්වූ කාන්තාවන්ය. පක්ෂ තුළ පවතින පීතෘ මූලික ව්‍යුහයන්, කාන්තා දේශපාලනඥයන් තබාගනුයේ වෙහෙස වී වැඩ කළ යුතු එහෙත් නොවැදගත් තනතුරුවල වන අතර ඔවුන් ප්‍රකට දේශපාලන පවුලකින් පැමිණියහොත් මිස නායකත්ව හැකියාවන් සහිත පුද්ගලයන් සේ සලකනුයේ ඉතා කලාතුරකිනි. විශේෂයෙන්ම 2018 පළාත් පාලන මැතිවරණය තරග කොට පරාජයට පත්වූ කාන්තාවන්ට හැඟෙනුයේ තම පක්ෂය තුළින්ම මතුවන අභියෝග තම දේශාපාලන ජීවිතයට බාධකයක් බවයි.

අධ්‍යයනයේ ගුණාත්මක නාවරණ මගින් පෙන්වා දෙනුයේ දේශපාලනයට පිවිසෙන් කාන්තාවන්ට මූලිකවම කාන්තා ජීවනෝපාය සංවර්ධනය, දික්කසාද, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සහ/ හෝ නොසලකා හැරීම, ළමා ආරක්ෂාව, කාන්තා අයිතිවාසිකම් ආදී කාන්තා කටයුතු. යැයි නම් කළ හැකි දේවල් සම්බන්ධයෙන් පමණක් පැවරීමේ ප්‍රවණතාවයක් පවතින බවයි. මෙම ප්‍රවණතාවයේ ගැටලුව වී ඇත්තේ විනිශ්චයනය, බදු පැනැවීම, සම්පත් වෙන්කිරීම සහ පාලනයට අදාළ අනෙකුත් මූලික ක්ෂෙත්‍රයන්ට අදාළ තීරණ ගැනීමේ ක්‍රියාදාමයේදී කාන්තා අදහස් නොවිමසීමයි. ඇත්තෙන්ම සිදුවිය යුත්තේ කාන්තා කෝටාව හඳුන්වා දීමට පක්ෂව ඉදිරිපත් කරනු ලැබූ තර්කයක් වූයේම කාන්තා කටයුතු සම්බන්ධ ගැටලු නිසා බැවින් තීරණ ගැනීමේ ක්‍රියාදාමයේදී කාන්තා කටයුතු. යැයි සාම්ප්‍රදායිකව සලකනු ලබන කරුණු නියෝජනයන කරනු ලැබීම වැදගත් වුවත්, එවැනි කාරණා සම්බන්ධයෙන් පමණක් කාන්තාවන් සහභාගි වීම සිදු නොවිය යුත්තකි. ඔවුන්ට සම්බන්ධවීමට අයිතියක් ඇති නිසාම පමණක් නොව, ඔවුන්ගේ ජිවිත ද එම ක්ෂෙත්‍රයන්හි ක්‍රි,යාත්මක බැවින්, පාලනයේ සියලු ක්ෂෙත්‍රයන්ට අදාළ තීරණ ගැනීමේදී කාන්තාවන් ඒ සඳහා සක්‍රීයව සහභාගි විය යුතුය.

*8 මූල්‍ය සම්පත් නොමැතිවීමේ ප්‍රධාන කරුණ ඇතුළුව මෙම සංඛ්‍යාවලින් දැක්වෙනුයේ විකල්ප කිහිපයකු අතුරින් ඔවුන් තෝරාගත් විකල්පයන්හි ප්‍රතිශතය බව සැලකිල්ලට ගත යුතුයි*

# සමාජය තුළින්ම මතුවන අභියෝග

සමාජය විසින එල්ල කරන අභියෝග සම්බන්ධයෙන් විමසීමේදී, තම දේශපාලන අනාගතයට සමාජය බාධාවක් බවට අදහස් දැක්වූයේ අධ්‍යයනයට සහභාගි වූ කාන්තා දේශපාලනඥයින් සියයට 9% ක් පමණි[9] අන් අයට වඩා මෙම සමාජීය අභියෝග අවධාරණය කළේ තරඟ කොට ජයග්‍රහණය කළ කාන්තාවන් බව සැලකිල්ලට ගත යුතු කරුණකි. කෙසේ වෙතත්, මින් පෙර සිදුකර ඇති අධ්‍යයනයන්ගෙන් පෙන්නුම් කර ඇත්තේ කාන්තාවන් දේශපාලනයෙන් ඈත්කර තැබීමට මූලික හේතුවක් වී ඇත්තේ සංස්කෘතික බාධකයන් බවයි. (ලෙයිටන් සහ ගුණවර්ධන 1998; ලියනගේ 1999; ලෙයිටන් 2000; පින්තු ජයවර්ධන සහ කොඩිකාර 2003; ජයවර්ධන 2002) පොදු-පුද්ගලික ද්විධාකරණය සහ පුද්ගලික ජීවිතයෙහි කාන්තාවන්ට නියම කර ඇති භූමිකාව මගින් දේශපාලනය තමන් සඳහා අකැප දෙයක් බවට වන මතය ඔවුන් සිත් තුළ කිඳා බැස තිබේ. (තම්බයියා 2003) මෙම සීමා මායිම් අතික්‍රමණය කිරීම සංස්කෘතිකමය වශයෙන් අනුචිත හා ගෘහයේ පුද්ගලික අවකාශයේ සම්ප්‍රදායික ගතිකත්වයන්ට අවහිර කරන දෙයක් සේ බොහෝ විට දකිනු ලබයි (කොඩිකාර 2009), ඈෂ්වර්ත් (1996) සහ බේඩන් (2000). අළුතින් හඳුන්වා දුන කෝටා ක්‍රමය යටතේ 2018 පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත්වූයේ කවර ආකාරයේ කාන්තාවන් ද යන්න විමසා බැලීමට මෙම අනාවරණ අපට ආරාධනා කරයි.

සංස්කෘතිය විසින් පනවා ඇති තවත් ව්‍යුහාත්මක බාධකයන් වනුයේ කාන්තාවන්ගේ ිදෙයාකාර බරයි.. එමගින් ඔවුන් නිවසේ වගකීම් සහ බාහිර වගකීම් ඉටුකරලීමේ අපේක්ෂාව, කාලය හා ශ්‍රමය වැය වන දේශපාලනය වැනි දෙයක ඔවුන් නිරතවීම අධෛර්යමත් කරයි. (බ්‍රෝඩි 2009) මෙහි සඳහන් කර ඇති නිවසේ වැඩ කටයුතු පිළිබඳ අපේක්ෂාවන් පිරිමින්ට අදාළ නොවේ යැයි සලකනු ලබන බැවින් දේශපාලනක්‍රියාකාරකම්වලට සහභාගිවීමෙන් වැළකී සිටීමේ පීඩනයක් සාමාන්‍යයෙන් ඔවුනට ඇති නොවේ. එමගින් දේශපාලනය පිරිමින්ට සුවිශේෂ වූ විෂය ක්ෂේත්‍රයක් ලෙස නිර්වචනය කිරීමේ දිගු කාලීන භාවිතාව ඇති කරමින්, යම් දුෂ්කරතා මධ්‍යයේ වුව ද, දේශපාලනයට පිවිසෙන කාන්තාවන්ට අභියෝගාත්මක පරිසරයක් නිර්මාණය කරන ලදී. " පිරිමින් කෙරෙහි වාසිදායක, සමාජීය භාවිතාවන් සහ පිරිමි පක්ෂ සාමාජිකයන් අතර අන්‍යෝන්‍ය සුහදශීලීත්වය මත පදනම් වූ සේ පෙනෙන පීතෘමූලික පක්ෂ සංස්කෘතිය " මැතිවරණවලදී සම තත්ත්වයේ සිට තරඟ කිරීම කාන්තාවන්ට දුෂ්කර කරයි. " ඔබින දේශපාලනඥයන් ලෙස කාන්තා අපේක්ෂිකාවන් නොසලකා හැරීම" දිගින් දිගටම සිදු කිරීම මගින් ඡන්ද දායකයන් මෙම තත්ත්වය තව දුරටත් සංකීර්ණ කර තිබේ. (වික්‍රමසිංහ සහ කොඩිකාර 2012, පිටුව 795) මෙහි මීළඟ කොටසේ විස්තර කර ඇති පරිදි, දේශපාලනයේ සාර්ථක වන කාන්තාවන්, දැනටමත් පිරිමින් සක්‍රිය දේශපාලනයේ යෙදෙන හෝ මෙම ක්ෂේත්‍රයේ ශක්තිමත් සබඳතා සහිත පවුල්වලින් පැමිණීමේ නැඹුරුවක් පවතී.

# කාන්තා දේශපාලනයේ පුරුෂ භූමිකාව

අනාවරණය වූ කරුණුවලින් මෙතෙක් හෙළි වී ඇති පරිදි, දැනටමත් සක්‍රිය දේශපාලනයේ නිරත හෝ මූල්‍ය සම්පත් වෙත ප්‍රවේශය සහිත පවුල්වලින් පැමිණෙන කාන්තාවන්ට, තරඟ කර හෝ කෝටාව හරහා දේශපාලනයට පිවිසීමේ වැඩි ඉඩ ප්‍රස්ථා පවතී. මෙම අවස්ථාවන් දෙකෙහිදීම පැහැදිළිව දැකිය හැකි දෙයක් වනුයේ, තමන්ගේ වඩා පුළුල් න්‍යාය පත්‍රයට ගැලපෙන පරිදි පවුලේ පිරිමින් තමන්ට උවමනා පරිදි තත්ත්වය හසුරුවන බවයි. උදාහරණයක් ලෙස කාන්තා දේශපාලනයඥයන් සමග පැවැති ගුණාත්මක සාකච්ඡාවක එක් කාන්තාවක් හෙළි කළේ තම පවුලේ සාමාජිකයන් පළාත් සභාවේ බලගතු තනතුරු දරන බැවින් පළාත් පාලන ආයතනය ද ඔවුන්ට රිසි සේ හසුරුවාලීම පිණිස ඇයව එම මැතිවරණයට ඉදිරිපත් කළ බවයි. තවත් අවස්ථාවක දී, සිය ව්‍යාපාරික සැමියාගේ මුදල් එක් කාන්තාවක් තම මැතිවරණ ව්‍යාපාරය සඳහා යොදා ගෙන තිබුණි සෘජුවම ප්‍රකාශ නොකළ ද, දේශපාලන බලපෑම් මගින් ස්වාමි පුරුෂයාගේ ව්‍යාපාරයන්ට වාසි ලබාගැනීමේ අරමුණු එහි ගැබ්ව තිබෙන්නට ඇත. තවත් කාන්තාවන් දෙදෙනෙකුට පිළිවෙළින් සිය පියා සහ ස්වාමි පුරුෂයා අහිමි වී තිබූ අතර ඔවුන් දේශපාලනයට පිවිස සිටියේ "ඔවුන්ගේ උරුමය ඉදිරියට රැගෙන යාමට සහ ඔවුන් පිළිබඳ මතකයට ගරු කිරීමට" වන අතර තවත් එක් සිදුවීමක දී ස්වාමි පුරුෂයා අමාත්‍යවරයකුගේ කාර්ය

*9 මූල්‍ය සම්පත් නොමැතිවීමේ ප්‍රධාන කරුණ ඇතුළුව මෙම සංඛ්‍යාවලින් දැක්වෙනුයේ විකල්ප කිහිපයකු අතුරින් ඔවුන් තෝරාගත් විකල්පයන්හි ප්‍රතිශතය බව සැලකිල්ලට ගත යුතුයි*

මණ්ලයේ සාමාජිකයකු වූ අතර දශක තුනක් තිස්සේ එම දෙදෙනා එකිනෙකාට උදව් කර තිබුණි.

මෙම උදාහරණයන්ගෙන් ඇඟවෙනුයේ එවැනි අවස්ථාවන්හි දී කාන්තාවන්ගේ තීරණ ගැනීමේ බලය බරපතල ලෙස දුර්වල විය හැකි බවයි. කෙසේ වෙතත්, එසේ නොවූයේ නම් ඔවුනට නොතිබෙන්නට ඉඩ තිබූ දේශපාලනය පිවිසීමේ හැකියාව මෙම පීතෘ මූලික ව්‍යුහය සහ සැලසුම් කාන්තාවන්ට ඇති කර තිබෙන්නේය යන කරුණ ද ඉන් පෙන්නුම් කරයි. එබැවින්, දේශපාලනයට පිවිස සාර්ථක වීම සඳහා ඇති බොහෝ කාන්තාවන්ගේ අපේක්ෂාවන්ට පීතෘ මූලිකත්වය මගින් අවහිර කිරීමට ඉඩ ඇතත්, එය තවත් සමහර කාන්තාවන් සාර්ථකත්වය සඳහා ද හේතු කාරක වී තිබේ. අනෙක් අතට මෙයින් ගම්‍ය වනුයේ මෙම කාන්තාවන් සිටීම මගින් පළාත් පාලන ආයතනවල කාන්තාවන් වෙනුවෙන් පෙනී සිටින්නන්ගේ නියෝජනය ඉහළ යාමට ඉඩ ඇතත්, ඔවුන් ඇතුලත් කිරීම මගින් බොහෝ විට සත්‍ය ලෙස සිදුවන්නේ දේශපාලනයේ පීතෘ මූලික ව්‍යුහයන් දුර්වල කරනවා වෙනුවට ඒවා සවිමත් කිරීම සිදු වීමයි.

## දේශපාලන අභිලාෂ

කෝටා ක්‍රමයේ ප්‍රතිලාභ තහවුරු කර ගැනීමට නම්, වෘත්තීමය දේශපාලන ගමනක් සඳහා දිගු කාලීන දැක්මක් සහිත කාන්තාවන් වෙනුවෙන් ආයෝජනය කිරීම ඉතා වැදගත් වේ. කාන්තා සංවිධාන හා ක්‍රියාධරයන්ගේ මූල්‍ය සහ කාලික සම්පත් බොහෝමයක් වත්මන් සහ/හෝ අනාගත කාන්තා දේශපාලනඥයන් පුහුණු කිරීම සහ දැනුවත් කිරීම වෙනුවෙන් වැය වන බැවින් දේශපාලන ක්ෂේත්‍රයේ තමන් වෙනුවෙන් දැක්මක් සහිත කාන්තාවන් හඳුනා ගැනීම ඔවුන්ගේ ශක්තීන් අපතේ නොයන බව සහතික කරයි. සමීක්ෂණයේ ප්‍රතිඵලවලට අනුව, ඒ වන විටත් 2008 මැතිවරණයෙන් ජයග්‍රහණය කර තිබූවන්, එසේ නොවූ අයට වඩා ජාතික හා පළාත් දේශපාලනයේ අභිලාෂයන් සපුරාලීමට වඩා වැඩි ඉඩ කඩක් තිබේ. ලැයිස්තුවෙන් තරඟ කොට ජයග්‍රහණය කළ පිරිසෙන් බහුතරයක් අනාගතයේදී පළාත් සභා සඳහා තරඟ කිරීමට අපේක්ෂා කරයි. මෙම අධ්‍යයනයට සහභාගි වූ කාන්තා දේශපාලනඥයන්ගෙන් සැලකිය යුතු අනුපාතයක් ප්‍රකාශ කර සිටියේ තමන් පළාත් පාලන දේශපාලනය තුළ දිගටම නිරත වන බවයි. විශේෂයෙන්ම තම පක්ෂවල ලැයිස්තු හරහා පළාත් පාලන ආයතනවලට පිවිසිමට නොහැකි වූ කාන්තා දේශපාලනඥයින් බහුතරයක් තමන් පළාත් පාලන ආයතන කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කිරීමට කැමැත්තෙන් පසුවන බවයි. අපේක්ෂිත පරිදිම, අනාගතයේ දේශපාලනයෙන් සමුගැනීමට අදහස් කළ අයගෙන් ඉහළම ප්‍රතිශතය වාර්තා කළේ ලැයිස්තුවෙන් තේරී පත්වීමට නොහැකි වූ අය වන අතර ඊ ළඟ වැඩිම ප්‍රතිශතය තරඟ කර පරාජයට පත් වූ අයයි. කෙසේ වෙතත්, පොදුවේ ගත් කළ, අනාගතයේ දේශපාලනයෙන් සමුගන්නා බව ප්‍රකාශ කළේ කාන්තා දේශපාලනඥයන්ගෙන් ඉතා අඩු ප්‍රතිශතයකි.

**වගුව 14 අපේක්ෂක වර්ගය අනුව දේශපාලන අභිලාෂ**

| | අපේක්ෂක වර්ගය (%) | | | |
|---|---|---|---|---|
| | තරඟ කර | තරඟ කර පරාජය වූ | ලැයිස්තුවෙන් ජයග්‍රහණය කළ | ලැයිස්තුවෙන් පරාජයට පත් වූ |
| යම් දිනෙක මම පාර්ලිමේන්තු මැතිවරණය තරඟ කරන්නෙමි | 21.1% | 19.4% | 19.5% | 11.9% |
| ඔම පළාත් සභා මැතිවරණය තරඟ කරන්නෙමි | 41.1% | 45.8% | 44.5% | 33.1% |
| දැනට මම ප්‍රාදේශීය සභාව (හෝ නගර සභාව හෝ මහ නගර සභාව) කෙරෙහි අවධානය යොමු කිරීමට කැමැත්තෙමි | 29.1% | 23.2% | 31.7% | 39.0% |
| අනාගතයේ මම දේශපාලනයෙන් සමුගැනීමට අදහස් කරමි | 4.3% | 8.4% | 3.7% | 14.0% |

# පුහුණුව හරහා කාන්තාවන් ශක්තිමත් කිරීම

නායකත්ව කුසලතා, තමන් කෙරෙහි විශ්වාසය සහ/හෝ ඇතැම්විට සාක්ෂරතාව පවා නොමැතිකම නිසා වැඩි අත්දැකීම් සහිත තම සහෝදර පිරිමි දේශපාලනඥයන් විසින් අවමානයට ලක් කරනු ඇතැයි යන බිය, දේහපාලනය වෘත්තියක් වශයෙන් සලකා බැලීමෙන් කාන්තාවන් අධෛර්යමත් කරයි. එබැවින්, තීරණ ගැනීමේදී කාන්තා නියෝජිතයන්ගේ සහ අපේක්ෂිකාවන්ගේ සහභාගිත්වය අර්ථාන්විත හා ඵලදායි බව සහතික කිරීමේදී, ඔවුන්ගේ ධාරිතා ගොඩනැංවීම වැදගත් අවශ්‍යතාවයක් වන අතර ගුණාත්මක සංරචකයන්ට සියලු ස්ථානයන්හි ප්‍රතිචාර දැක්වූ සියලු දෙනා මෙම අවබෝධය තහවුරු කරන ලදී. වඩා හොඳින් පුහුණුව ලැබූ කාන්තාවන් මෙම තනතුරුවල සිටීම, කාන්තා අපේක්ෂිකාවන්ගේ/ දේශපාලනඥයන්ගේ විශ්වසනීයත්වය ද ඉහළ නංවනු ඇත. (කොඩිකාර 2009, බිරෝ□ඩි 2009, □□ලෙෂන්බර්ග් 2008)

ඔවුන් ලබා ඇති පුහුණුව සම්බන්ධයෙන් ගත් කළ, තමන් බොහෝ පුහුණුවීම් ලබා ඇති බව වාර්තා කළ වූවන් අතර ඉහළම ප්‍රතිශතය වාර්තා කළේ තරග කොට ජයග්‍රහණය කළ අය (57.2%) සහ ලැයිස්තුවෙන් ජයග්‍රහහණය කළ (50.3%) අයයි. කිසිදු පුහුණුවක් ලබා නොමැති බවට වාර්තා කළ අය අතුරින්, ඉහළම ප්‍රතිශත (13.5%) වාර්තා කළේ ලැයිස්තුවෙන් පරාජයට පත් වූ අය සහ ලැයිස්තුවෙන් ජයග්‍රහණය කළ (10.3%) අයයි. කෙසේ වෙතත්, පුහුණු අවශ්‍යතාවයන්ට අර්ථාන්විතව පිළියම් යෙදීම පිණිස කොඩිකාර (2009) අනතුරු අඟවා ඇති පරිදි, අපේක්ෂකත්වය සහ ධූරයට පත්වීමෙන් පසුව මතුවන අභියෝගයන්ට සූදානම් කිරීම සම්බන්ධයෙන් ගත් කළ, තම ලතිලාභීන්ගේ සැබෑ වර්ධනයට පුහුණු වැඩසටහන් කෙතෙක් දුරට දායක වී ඇත් ද යන්න පිළිබඳව ඇගයීමක් සිදුකිරීම අවශ්‍ය වේ (පිටුව 42-44)

**වගුව 15 - අපේක්ෂක වර්ගය අනුව පුහුණු මට්ටම**

| | අපේක්ෂක වර්ගය (%) | | | |
|---|---|---|---|---|
| | තරඟ කර ජයගහණය කළ | තරඟ කර පරාජය වූ | ලැයිස්තුවෙන් ජයගහණය කළ | ලැයිස්තුවෙන් පරාජයට පත් වූ |
| තබාහෝ පුහුණුවීම් ලබා ඇතී | 57.2% | 42.7% | 50.3% | 41.0% |
| යම් පුහුණුවක් ලබා ඇත | 35.2% | 49.7% | 39.4% | 45.5% |
| කිසිදු පුහුණුවක් නොමැත | 7.6% | 7.6% | 10.3% | 13.5% |

# පළාත් පාලන මට්ටමේ කාන්තා දේශපාලනඥයන් සහ මැතිවරණ දේශපාලනය පිළිබඳ ඔවුන්ගේ දැක්ම

කාන්තාවන් දේශපාලනයෙන් ඈත් කර තබනුයේ ඔවුන්ගේ ඔවුන්ගේ භෞතික තත්ත්වයන් විසින් පමණක් නොව ඔවුන් අයත් මතවාදීමය රාමුව ද නිසාවෙනි. එබැවින්, දේශපාලනය පිළිබඳව ඔවුන්ගේ දැක්ම නිසාවෙන් කාන්තාවන් බොහෝ විට දේශපාලනයට පිවිසීමට උත්සාහයක් පවා නොදරයි. මෙම අධ්‍යයනයට සහභාගි වූ කාන්තා දේශපාලනඥයන් කෙතෙක් දුරට ඒවා අනුමත කරන්නේදැයි විමර්ශනය කිරීම පිණිස කාන්තාවන් සහ දේශපාලනය පිළිබඳ වත්මන් සංවාදය පිළිඹිබු කෙරෙන මිශ්‍ර ප්‍රකාශ කිහිපයක් ඔවුන් වෙත යොමු කරන ලදී.

සමීක්ෂණයට සහභාගි වූ කාන්තා දේශපාලනඥයන් සාතිශය බහුතරයක් විශ්වාස කරනුයේ අපේක්ෂක වර්ගය කුමක් වුවද, එනම් තරඟ කරන්නේ ද නැතහොත් ලැයිස්තුවෙන් පත් වන්නේ ද යන්න නොතකා පළාත් පාලන මැතිවරණවලදී කාන්තාවන් සඳහා කෝටාවක් හඳුන්වාදීම කාන්තාවන්ට දේශපාලනයට පිවිසීමට පිටිවහලක් බවයි. ඔවුන්ගෙන් සැලකිය යුතු බහුතරයක්

සිතනුයේ කාන්තාවන් දේශපාලනයට සම්බන්ධ වුවහොත් දේශපාලනයේ පවතින ප්‍රචණ්ඩත්වය අඩුවන බවයි. කිසිදු බාධාවකින් තොරව පූර්ව මැතිවරණ ව්‍යාපාරයේ නියැළිය හැකි බවත් පක්ෂ ධූරාවලියේ ඉහළට ගමන් කිරීමට තම දිස්ත්‍රික් නායකයන් තමන්ට උපකාර කරනු ඇති බවත් මෙම අධ්‍යයනයට සහභාගි වූ කාන්තා දේශපාලනඥයන්ගෙන් හතරෙන් තුනක් අදහස් කරයි. කෙසේ වෙතත්, අන් අය මෙන් නොව, තරඟ කොට ජයග්‍රහණය කළ අය ඉහත ධනාත්මක ප්‍රකාශ සමග එකඟවූයේ තරමක් අඩුවෙනි. තරඟ කර ජයග්‍ර,හණය කළ අයට එම ධනාත්මක කරුණුවලට වඩා තේරී පත්වීම සඳහා තමන් මුහුණ දුන් අභියෝග අවධාරණය කළ බවක් පෙනී යයි. තරඟ කොට ජයග්‍රහණය කළ අය අධ්‍යයනයට සහභාගි වූ අනෙක් කාන්තා දේශපාලනඥයන්ට වඩා වෙනස් ආකාරයකින් සිතන බව පැහැදිළිව දක්නට ලැබුණි මැතිවරණ තරඟ කිරීම සඳහා කාන්තාවන්ට පවතින ධනාත්මක පරිසරය පිළිබඳව මධ්‍යස්ථ වන අතරම, කාන්තාවන් දේශපාලනයට පිවිසීම කෙරෙහි බලපාන්නා වූ අනෙකුත් නිශේධනාත්මක කරුණු පිළිබඳ ඔවුන් එතරම් අසුබවාදී නොවෙති. මැතිවරණවල දී සාර්ථක වූ කාන්තා දේශපාලනඥයන් සමග සිදු කළ පුද්ගලික සම්මුඛ සාකච්ඡාවලදී තුළ දී දැන ගැන්මට ලැබුණේ ඔවුන් තම මැතිවරණ කොට්ඨාශයේ පිරිමින්ගේ උපාය මාර්ග අනුගමනය කරමින් තරඟ කළ බවයි. මැතිවරණ තරඟ කිරීමේදී කාන්තාවන් ඉහත අභියෝග බොහෝමයකට මුහුණ දෙන බව ඔවුන් පිළිගනියි. එසේම එය 'අශුද්ධ ක්ෂෙත්‍රයක්. බවත් දේශපාලනයේ දිගටම රැඳී සිටීම පිළිබඳව ඔවුන් බරපතල ලෙස සිතන්නේ නම් ඔවුන් ඊට හැඩ ගැසිය යුතු බවත් ඔවුන් විශ්වාස කරයි. තරමක් විප්ලවකාරී අදහසක් ඉදිරිපත් කරමින්, හැට වන වියේ පසු වූ එක් කාන්තා ක්‍රියාකාරිණියක් කියා සිටියේ පිරිමින් තම ශාරීරික ශක්තිය යොදා ගන්නා පරිද්දෙන්ම, මැතිරවරණවලට තරඟ කිරීමේ දී කාන්තාවන් ද තමන්ට සුවිශේෂී වූ දේවල් සොයා ගත යුතු බවයි.

**වගුව 16 - මැතිවරණ දේශපාලනය පිළිබඳ දැක්ම**

| කාන්තාව හා දේශපාලනය පිළිබඳ ප්‍රකාශය | එකඟ වෙමි |
|---|---|
| පළාත් පාලන මැතිවරණයේදී කාන්තාවන් සඳහා කෝටාවක් හඳුන්වා දීම කාන්තාවන්ට දේශපාලනයට පිවිසීමට විශාල ලෙස උපකාර වේ. | 96.3% |
| කාන්තාවන් දේශපාලනයට සම්බන්ධ වුවහොත් දේශපාලනයේ ප්‍රචණ්ඩත්වය අඩුවනු ඇත | 83.8% |
| පූර්ව මැතිවරණ ව්‍යාපාරයට සහභාගි වීමට කාන්තා අපේක්ෂිකාවන්ට බාධාවක් නොමැත | 75.3% |
| මගේ පක්ෂයේ දිස්ත්‍රික් දේශපාලන නායකත්වය කාන්තාවන්ට පක්ෂ ධූරාවලියේ ඉහළට යාමට උදව් කරයි. | 75.3% |
| පවුල් ජීවිතය සාර්ථකව දේශපාලනයේ නියැළීමෙන් කාන්තාවන් වළක්වයි. | 71.4% |
| දේශපාලනය වඩාත්ම සුදුසු වන්නේ පිරිමින්ටය. | 69.9% |
| පක්ෂ තුළ ලිංගික ප්‍රචණ්ඩත්වය හා ලිංගික පක්ෂග්‍රාහිත්වය දේශපාලනයේ නියැළීමට කාන්තාවන්ට බාධාවකි | 69.5% |
| පක්ෂ තුළ හා අතර පවතින දේශපාලන ප්‍රචණ්ඩත්වය කාන්තාවන්ට දේශපාලනයේ නියැළිමට බාධාවකි | 65.7% |
| මැතිවරණවලදී කාන්තාවන් වැඩියෙන්ම සහයෝගය දක්වනුයේ කාන්තා අපේක්ෂිකාවන්ටය | 64.3% |
| පවතින දේශපාලන සංස්කෘතිය තුළ කාන්තාවන්ට දේශපාලනය තුළ නැගී සිටිය නොහැක | 53.4% |

## වගුව 17 - අපේක්ෂක වර්ගය අනුව මැතිවරණ දේශපාලනය පිළිබඳ දැක්ම

| | අපේක්ෂක වර්ගය (%) | | | |
|---|---|---|---|---|
| | තරඟ කර ජයග්‍රහණය කළ | තරඟ කර ජයග්‍රහණය කළ | තරඟ කර ජයග්‍රහණය කළ | තරඟ කර ජයග්‍රහණය කළ |
| පළාත් පාලන මැතිවරණයේදී කාන්තාවන් සඳහා කෝටාවක් හඳුන්වා දීම කාන්තාවන්ට දේශපාලනයට පිවිසීමට විශාල ලෙස උපකාර වේ | 95.1% | 96.2% | 99.4% | 95.9% |
| කාන්තාවන් දේශපාලනයට සම්බන්ධ වුවහොත් දේශපාලනයේ ප්‍රචණ්ඩත්වය අඩුවනු ඇති | 75.4% | 89.7% | 83.5% | 89.2% |
| පවුල් ජීවිතය සාර්ථකව දේශපාලනයේ නියැළීමෙන් කාන්තාවන් වළක්වයි | 57.9% | 82.2% | 71.4% | 75.4% |
| පූර්ව මැතිවරණ ව්‍යාපාරයට සහභාගි වීමට කාන්තා අපේක්ෂිකාවන්ට බාධාවක් නොමැත | 68.1% | 75.2% | 82.3% | 74.5% |
| දේශපාලනය වඩාත්ම සුදුසු වන්නේ පිරිමින්ටයි | 55.6% | 75.5% | 74.2% | 73.4% |
| පක්ෂ තුළ ලිංගික ප්‍රචප්ර්චණ්ඩත්වය හා ලිංගික පක්ෂපාතිත්වය දේශපාලනයේ නියැළීමට කාන්තාවන්ට බාධාවකි | 61.8% | 69.3% | 75.9% | 72.0% |
| මගේ පක්ෂයේ දිස්ත්‍රික් දේශපාලන නායකත්වය කාන්තාවන්ට පක්ෂ ධූරාවලියේ ඉහළට යාමට උදව් කරයි | 85.0% | 71.5% | 81.4% | 66.8% |
| ගි මැතිවරණවලදී කාන්තාවන් වැඩියෙන්ම සහයෝගය දක්වනුයේ කාන්තා අපේක්ෂිකාවන්ටය | 57.2% | 72.6% | 64.6% | 66.0% |
| පක්ෂ තුළ හා අතර පවතින දේශපාලන ප්‍රචණ්ඩත්වය කාන්තාවන්ට දේශපාලනයේ නියැළිමට බාධාවකි | 65.7% | 69.5% | 64.6% | 62.8% |
| පවතින දේශපාලන සංස්කෘතිය තුළ කාන්තාවන්ට දේශපාලනය තුළ නැගී සිටිය නොහැක | 43.3% | 59.7% | 48.8% | 58.0% |

# නිගමන

2018 පෙබරවාරි මාසයේ හඳුන්වා දුන් කාන්තා කෝටාව පළාත් පාලන මට්ටමේ ප්‍රජාතන්ත්‍රවාදයේ කාන්තා නියෝජනය සැලකිය යුතු ලෙස ඉහළ නංවා තිබේ. එසේ නොවන්නට, දේශාපලනිකව කොන් කර තිබූ කාන්තා දේශපාලනය ක්‍රියාධරයන්ට පළාත් පාලන ආයතනවලට පත්වීමට එමගින් දොරගුළු විවෘත විය. කෙසේ වෙතත්, එවන් කැපී පෙනෙන ජයග්‍රණයක් ලබා ගත්ත ද, ප්‍රාදේශීය කාන්තා දේශපාලන ක්‍රියාධරයන් කෝටා ක්‍රමයයෙන් ප්‍රතිලාභ ලබා ඇත්තේ කෙසේද, මැතිවරණය සඳහා තරග කිරීමේදී හෝ ලැයිස්තුව හරහා පිවිසීමට උත්සාහ දැරීමේදී ඔවුන් මුහුණ දුන් අභියෝග මොනවාද, දේශපාලනයේ දිගටම රැඳී සිටීමේදී ඔවුන් මුහුණ දෙන අභියෝග මොනවාද, පුරුෂ ආධිපත්‍යය සහිත ක්ෂේත්‍රයක් වන මැතිවරණය දේශපාලනයේදී ඔවුන් වඩා ශක්තිමත් කරගකරුවන් කරනු ඇත්තේ කවරක්ද වැනි ප්‍රශ්න ගණනාවක් තව දුරටත් ඉතිරිව තිබේ. 2018 පළාත් පාලන මැතිවරණය සඳහා තරග කළ ප්‍රාදේශීය කාන්තා දේශපාලනඥයන් සමග පැවැති සම්මුඛ සාකච්ඡා මත පදනම්ව, ඉහත ප්‍රශ්න සඳහා පිළිතුරු පිළිබඳ යම් අවබෝධයක් ලබා දීමට මෙම වාර්තාව උත්සාහ දරන අතර එමගින් කාන්තා නියෝජනයේ ජයග්‍රහණය පවත්වා ගනු පිණිස කළ යුත්තේ කුමක්දැයි.සාකච්ඡා කරයි.

කෝටා ක්‍රමය හඳුන්වා දීම පළාත් පාලන මට්ටමේදී කාන්තා නියෝජනය ඉහළ නැංවීම උදෙසා වූ පැහැදිළි ධනාත්මක පියවරක් බව ප්‍රාදේශීය මට්ටමේ කාන්තා දේශපාලන ක්‍රියාධරයන් විශ්වාස කරයි. ඊට අමතරව, දේශපාලන පවුල්වලින් සහ පක්ෂවලින් පරිබාහිර නව මුහුණු ගණනාවකට වෘත්තීමය දේශපාලනයට පිවිසීමට කෝටා ක්‍රමය මං පෙත් විවර කර ඇති බව අධ්‍යයනයෙන් පෙන්නුම් කෙරේ. තම සහෝදර දේශපාලනඥයන් සමග කරට කර සිටිය හැකි වැඩි හැකියාවන්ගෙන් යුක්ත කාන්තාවන් දේශපාලනය කෙරෙහි ආකර්ෂණය කර ගැනීම සම්බන්ධයෙන් මෙය සාධනීය ප්‍රවණතාවයකි. කෙසේ වෙතත්, අවදානම වනුයේ, කාන්තා දේශපාලන සංවිධාන සමග සමගාමීව කටයුතු කිරීමට සලස්වන අතරම පක්ෂ ව්‍යුහයට ඔවනු අන්තර්ග්‍රහණය කරගනු නොලැබුවහොත්, දිගු කාලීනව ගත් කළ දේශපාලන පක්ෂ තුළ කාන්තා ක්‍රියාකාරීත්වයේ පදනම් දුර්වල වීමට ඉඩ තිබේ.

ඒ සඳහා දේශපාලන පක්ෂ සිය පක්ෂ සංවිධාන ව්‍යුහයන් යළි සක්‍රීය කර මෙම නව කාන්තා දේශපාලනඥයන් සඳහා මතවාදීමය දිශානතියක් සැපැයිය යුතු අතර මැතිවරණ දේශාපාලනය, ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ආයතන, ස්ත්‍රීපුරුෂ සමාජභාවී දේශපාලනය සහ කාන්තාවන්ගේ දේශපාලන නියෝජනය පිළිබඳ පුහුණු වැඩසටහන් කාන්තා සංවිධාන පැවැත්විය යුතුය.

ඇතැම් කාන්තාවන් දේශපාලනයට පිවිසෙනුයේ තම ස්වාමිපුරුෂයන් නියෝජනය කිරීමට හෝ ඔවුන්ගේ දේශපාලන ජීවිතය ශක්තිමත් කිරීමට ය. තම ස්වාමි පුරුෂයන්ගේ සම්පත් සහ සමාජ ජාල ඔවුන් සතුව පවතින බැවින් අනෙකුත් කාන්තා අපේක්ෂිකාවවන්ට වඩා වැඩි වාසිදායක තත්ත්වයක් ඔවුනට තිබේ.

අභිප්‍රාය කුමක් වුවද, මෙම කාන්තාවන්ට දේශපාලනය, ආණ්ඩුකරණය, සහ පක්ෂ ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුම ලබා දුන හොත්, දේශපාලනයේ දිගටම රැඳී සිටිමින් ශක්තිමත් ස්වාධීන දේශපාලනඥයන් ලෙස නැගී සිටීමට ඔවුනට හැකිය.

කාන්තාවක් ද පිරිමියෙක් ද යන්න නොසලකා ජාතික, පළාත් හෝ ප්‍රාදේශීය යන කවර මට්ටමකදී හෝ දේශපාලනයට පිවිසීමට කැමැත්තෙන් පසුවන කවරෙකුට වුවත්, සාපේක්ෂව තම තරඟකරුවන්ට වඩා ඉහළ බලයක් ඔහු/ඇය සතුවිය යුතුය. මූල්‍ය ධාරිතාවය, සමාජ තත්ත්වය සහ සමාජ සබඳතා එක්ව කණ්ඩායමක් තුළ බලය පවත්වා ගැනීමට යම් පුද්ගලයකුගේ හැකියාව තීරණය කරයි. අධ්‍යයනයෙන් පෙන්නුම් කරන්නේ මුදල් වැය කිරීමට වඩා ඉහළ හැකියාවක් සතු, දැනුමැති සහ තම අසල්වාසීන්ගේ, පක්ෂ නායකයන්ගේ සහ කොට්ඨාශයේ පිරිමින්ගේ පවා සහාය ලබාගැනීමේ හැකියාව ඇති කාන්තාවන්ට මැතිවරණ ජයග්‍රහණය කිරීමේ වැඩි හැකියාවක් පවතින බවයි.

එබැවින් දේශපාලන පක්ෂ කාන්තා ආධාරකරුවන් කෙරෙහි වන තම ආකල්පය වෙනස් කළ යුතුය. පක්ෂපාතී හා වෙහෙසි වැඩ කළ ද වැදගත් තනතුරු නොදරන්නන්ට සීමා වී ඇති කාන්තාවන්ගේ භූමිකාව වෙත අවධානය යොමු කරනු වෙනුවට පක්ෂ ව්‍යුහය තුළ නායකත්ව භූමිකා ඉටු කිරීමේ විවිධ හැකියා සහිත කාන්තාවන් කෙරෙහි ඔවුන් අවධානය යොමු කළ යුතුය

සිවිල් සමාජ සංවිධාන තම විවිධ ධාරිතා ගොඩ නැංවීමේ සහ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් සඳහා, නායකත්ව භූමිකා ඉටු කිරීමේ ධාරිතාව සහිත කාන්තාවන් වෙත (වෙනත් වචනවලින් කිවහොත්, ආර්ථික, සංස්කෘතික සහ සමාජ ප්‍රාග්ධනය සහිත) වැඩියෙන් ප්‍රවේශ විය යුතුය. මෙම කාන්තාවන්ට සාපේක්ෂව අඩු මට්ටමක එවැනි ප්‍රාග්ධන සහිත කාන්තා දේශපාලකවරියන්ට වඩා දේශපාලන අභිලාෂයන් තිබීමට වැඩි ඉඩ ඇති බැවින් කාලයත් සමගින් හරයාත්මක නියෝජනය සහතික කිරීමේදී මෙය වඩාත් අර්ථාන්විත වනු ඇත.

පක්ෂ සංවිධාන තුළ සාකච්ඡා සහ තීරණ ගැනීමේ ක්‍රියාදාමයන්හි සාමාන්‍යයෙන් පිරිමි දේශපාලනඥයන් සිය ආධිපත්‍යය බල පවත්වන අතර තම සහෝදර කාන්තා දේශපාලනඥයන්ගේ හඬට අවධානය යොමු නොකරන තරම්ය. කෙසේ වෙතත්, තම අධ්‍යාපන සුදුසුකම් හා දේශපාලන කරුණු පිළිබඳ දැනුම නිසා පිරිමි දේශපාලනඥයන්ගේ අවධානය ලබා ගැනීමට හැකිව ඇතැයි කාන්තා දේශපාලනඥයන් ප්‍රකාශ කරය.

- ආණ්ඩුකරණය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය කරුණු සහ දේශපාලන ඉතිහාසය වැනි ක්ෂේත්‍රයන් පිළිබඳ කාන්තා දේශපාලනඥයන්ගේ දැනුම වර්ධනය කිරීම, පක්ෂය තුළ සාපේක්ෂව වඩා ශක්තිමත් හඬක් සතු පිරිමි දේශපාලනඥයන් ඉක්මවා යා හැකි වැඩි වාසියක් ඔවුන්ට ලබා දෙනු ඇත.

- කෝටාවක් හඳුන්වා දීම පළාත් පාලන ආයතනවලට පිවිසීමට කාන්තාවන්ට පිටුවහලක් වී ඇතත්, ශ්‍රී ලංකාවේ පවතින අනුග්‍රාහකත්වය මත පදනම් වූ දේශපාලන ක්‍රමය තුළ, මූල්‍ය ප්‍රවේශය සඳහා කාන්තාවන්ට පහසු ප්‍රවේශයක් නොමැති නම්, නැවත තේරී පත්වීම සඳහා අත්‍යාවශ්‍ය වන තම ආධාරකරුවන්ගේ කණ්ඩායම් සහ පුළුල් සමාජ ජාල ගොඩ නැගීමට ඔවුන්ට නොහැකි වනු ඇත.

- කාන්තා දේශපාලනඥයන් දූෂණ ක්‍රියාවන්ට සම්බන්ධ වීම වැළැක්වීමට සිවිල් සමාජ සංවිධානවලට හැකියාවක් නොමැත. ඔවුන් ප්‍රතික්ෂේප කරනු වෙනුවට, කාන්තා නියෝජනය ශක්තිමත් කිරීම පිණිස සිවිල් සමාජ සංවිධාන ඔවුන් සමග කටයුතු කළ යුතුය. සමස්ත දේශපාලන පද්ධතියම අනුග්‍රාහක -සේවාලාභී සබඳතා ක්‍රියාත්මක වන තෙක් ප්‍රතිපත්ති සහ මූලධර්ම මත පදනම්ව දේශපාලනයේ රැඳා පැවැතීමට කාන්තා දේශපාලනඥයන්ට තනිවම නොහැකි වනු ඇත. එබැවින්, රටේ දූෂිත දේශපාලන සංස්කෘතිය පිරිසිදු කිරීමේ බර තනිකරම කාන්තාවන් මත පමණක් නොපැටවිය යුතුය.

- දේශපාලනයේ ප්‍රචණ්ඩත්වය, සමාජයේ පවතින පීතෘ මූලික සමාජ පුරුෂාර්ථ සහ පක්ෂ ව්‍යුහ තුළ පවතින පීතෘ මූලික භාවිතාවන් කාන්තාවන් දේශපාලනයට පැමිණීම සහ රැඳී සිටීම වළක්වාලයි. කෙසේ වෙතත්, තරඟ කර ජයග්‍රහණය කළ කාන්තාවන් එවැනි අභියෝගයන්ට සාපේක්ෂව අඩු වැදගත්කමක් ආරෝපණය කරන බව පෙනී යයි. මෙයින් හැඟවෙනුයේ පිරිමින් සමග තරඟ කිරීමට ශක්තිය ඇත්තේ කරට කර සිටිමින් ඔවුන් සමග සටන් කිරීමට කැමැත්තක් දක්වන කාන්තාවන්ට බවයි

- සමාජයේ පවතින කාන්තාවන්ට එරෙහි ප්‍රණ්ඩත්වයට, දේශපාලනයේ ලිංගික ප්‍රචණ්ඩත්වයට සහ පක්ෂය තුළ කාන්තාවන්ට වෙනස් අන්දමින් සැලකීමට විරුද්ධව කටයුතු කරන අතරම තම සහෝදර පිරිමි දේශපාලනඥයන් මෙන්ම පවත්නා තත්ත්වයන් හා සබඳතා තම වාසියට යොදා ගැනීමට කාන්තා දේශපාලනඥයන් දිරිමත් කළ යුතුය. මෙහිදී තම පවුල් ජීවිතය සහ දේශපාලනය සමබරව පවත්වා ගැනීමට හෝ කාන්තාවගේ සංස්කෘතික අපේක්ෂාවන් සපුරාලිමට ඔවුන්ට නොහැකි වීමට ඉඩ ඇත.

# ආශ්‍රිත ග්‍රන්ථ


**Al-Jraibi, M. (2000).** *Women and Political Participation in Jordan: The Development of Attitudes towards Allocating a Quota of Parliamentary Seats for Women. Jordan: Al-Urdun Al-Jadid Research Centre*

**Bardall, G. (2018).** *Violence, Politics, and Gender. In Oxford Research Encyclopedia of Politics. Oxford: Oxford University Press*

**Basu, A. (2000).** *Gender and Governance: Concepts and Contexts. Essays on Gender and Governance. New York: UNDP*

**Bourdieu, P. (1977).** *Outline of a Theory of Practice. Cambridge: Cambridge University Press*

**Bourdieu, P. (1984).** *Distinction: A Social Critique of the Judgment of Taste. Cambridge, MA: Harvard University Press*

**Brody, A. (2009).** *Gender and Governance – Overview Report. United Kingdom: BRIDGE, Institute of Development Studies*

**Dyer, A., Bardall, G. and Rogers, T.A. (2019).** *Violence against Women in Elections in the Autonomous Region of Bougainville: An IFES Assessment. Retrieved from http://aceproject.org/ero-en/misc/violence-against-women-in-elections-in-the*

**Evertzen, A. (2001).** *Gender and Local Governance. The Hague: Netherlands Development Organisation (SNV)*

**Fleschenberg, A. (2008).** *Asia's Women Politicians at the Top: Roaring Tigresses or Tame Kittens? In K. Iwanga (Ed.), Women's Political Participation and Representation in Asia: Obstacles and Challenges (pp. 23-54). Copenhagen: NIAS Press*

**Hettige, S. (1984).** *Wealth, Power and Prestige: Emerging Patterns of Social Inequality in a Peasant Context. Colombo: Ministry of Higher Education*

**Jayanntha, D. (1992).** *Electoral Allegiance in Sri Lanka. Cambridge: Cambridge University Press*

**Jayawardena, K. & de Alwis, M. (2002).** *The contingent politics of the women's movement in Sri Lanka after independence. In Swarna Jayaweera (Ed.), Women in Post-Independence Sri Lanka. Sage: New Delhi*

**Jiggins, J. (1979).** *Caste and the Family in the Politics of the Sinhalese 1947 to 1976. London: Cambridge University Press*

**Jupp, J. (1978)**. *Sri Lanka: Third World Democracy. London: Cass*

**Kodikara, C. (2009).** *The Struggle for Equal Political Representation of Women in Sri Lanka: A stocktaking report. Colombo: Ministry of Child Development and Women's Empowerment and the United Nations Development Programme*

**Kodikara, C. (2012).** *Women in Local Government from 2006 to 2011: A Comparative Analysis of Representation of Women and Nominations for Women. Colombo: International Center for Ethnic Studies*

**Leitan, T. (2000).** *Women in political Participation and Decision making in Post Beijing Reflections: Women in Sri Lanka 1995-2000. Colombo: CENWOR*

**Leitan, T. &Gunasekera, S. (1998).** *Women in rural politics: A study on women's participation in politics in selected rural areas in Sri Lanka (Unpublished Report). Colombo: Social Scientists' Association*

**Liyanage, K. (1999).** *Women in political parties: The Sri Lankan experience. In SirimaKiribamune (Ed.), Women and Politics in Sri Lanka: A Comparative Perspective. Kandy: International Centre for Ethnic Studies*

**Palmieri, S. & K. Jabre. (2005).** *Case Study on Inter-Parliamentary Union. In J. Ballington& A. Karam (Eds.), Women in Parliament: Beyond Numbers. Stockholm: IDEA*

**Peiris, P. (2014).** *Catch-All Parties and the Party-Voter Nexus: A Study on the Party-Voter Relationship of the United National Party and the Sri Lanka Freedom Party (Unpublished Doctoral dissertation). Colombo: University of Colombo*

**Peiris, P. (2018).** *Changing Dynamics of the Party-Voter Nexus. In A. Shastri & J. Uyangoda (Eds.), Political Parties in Sri Lanka: Change and Continuity. India: Oxford University Press*

**Pinto-Jawawardena, K. &Kodikara, C. (2003).** *Women and Governance: Sri Lanka. Colombo: International Center for Ethnic Studies*

**Shvedova, N. (2005).** *Obstacles to Women's Participation in Parliament. In J. Ballington& A. Karam (Eds.), Women in Parliament: Beyond Numbers. Stockholm: IDEA*

**Spencer, J. (1990).** *A Sinhala Village in a Time of Trouble, Politics and Change in Rural Sri Lanka. Delhi: Oxford University Press*

**Tambiah, Y. (2003).** *The Impact of Gender Inequality on Governance. In M. Nussbaum, A. Basu, Y. Tambiah& N.G. Jayal (Eds.), Essays on Gender and Governance (pp. 59-95). India: UNDP*

**Uyangoda, J. (2010).** *Politics of Political Reform – A Key Theme in the Contemporary Conflict. In Camilla Orjuela (Ed.), Power and Politics: In the Shadow of Sri Lanka's Armed Conflict (pp. 29-78). Sweden: Sida*

**Wickramasinghe, M. &Kodikara, C. (2012).** *Representation in Politics: Women and Gender in the Sri Lankan Republic. In A. Welikala (Ed.), The Sri Lankan Republic at 40: Reflections on Constitutional History, Theory and Practice. Colombo: Centre for Policy Alternatives*

**Woodward, C. (1975).** *Sri Lanka's Electoral Experience: From Personal to Party Politics. Public Affairs, 47(4)*

කාන්තා හා මාධ්‍ය සාමූහිකය

Norwegian Embassy
*Colombo*